# 2 වැනි පරිච්ඡේදය

# ජාතික නිෂ්පාදිතය හා වියදම

## 2.1 සමස්ත නිරීක්ෂණ

2006 වර්ෂයේ මූර්ත වශයෙන් සියයට 7.7 කින් වර්ධනය වූ දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) 2007 දී සියයට 6.8 කින් වර්ධනය විය. වර්ෂයේ පළමු භාගයේදී සියයට 6.3 කින් වර්ධනය වූ ආර්ථිකය ඉහළ වෘද්ධි තලයක් වෙත ප්‍රවිෂ්ට වීම තවදුරටත් තහවුරු කරමින්, වර්ෂයේ දෙවන භාගයේදී සියයට 7.3 කින් වර්ධනය විය. දේශීය මෙන්ම විදේශීය වශයෙන් මුහුණ දුන් අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමේ නිසග හැකියාව පෙන්වමින් ලෝක වෙළෙඳපොළේ තෙල් මිල ඉහළයාම, ඉහළ යන ත්‍රස්තවාදී තර්ජන, අහිතකර කාලගුණික තත්වයන් සහ ඉහළ යන උද්ධමනකාරී පීඩනයන් වැනි අයහපත් තත්ත්වයන් මධ්‍යයේ 2007 වර්ෂයේ ශ්‍රී ලංකා ආර්ථිකය අඛණ්ඩව තුන්වන වරටත් සියයට 6 ඉක්මවූ ආර්ථික වර්ධනයක් සනිටුහන් කළේය.

2007 වර්ෂයේ ආර්ථික වර්ධනය පුළුල් පදනමක පැවතිණි. කාර්මික සහ සේවා අංශ පිළිවෙලින් සියයට 7.6 කින් හා සියයට 7.1 කින් වර්ධනය වූ අතර, කෘෂිකාර්මික අංශය සියයට 3.3 ක් වූ මධ්‍යස්ථ වර්ධනයක් පෙන්වීය. සමස්ත ආර්ථික වර්ධනයට වැඩිම දායකත්වය (සියයට 62) සේවා අංශය ලබාදුන්නේය. කාර්මික අංශයෙහි ඉදිකිරීම්, අපනයනාභිමුඛ කර්මාන්ත සහ පතල් හා කැණීම් යන අංශයන් මනා ක්‍රියාකාරීත්වයක් දැක්වීය. සේවා අංශයේ ක්‍රියාකාරී අංශයන් අතර ප්‍රධාන වූයේ තැපැල් සහ විදුලිසංදේශ, භාණ්ඩ මෙහෙයවීම, ප්‍රවාහනය සහ මූල්‍ය සේවා වැනි අංශයන්ය. කෘෂිකාර්මික අංශයේ බොහෝ උප අංශයන් සාපේක්ෂ වශයෙන් ඉහළ වර්ධන අනුපාතිකයන් වාර්තා කළේ වී නමුදු, වී හා තේ යන ප්‍රධාන භෝග දෙකෙහි නිෂ්පාදනය පහත වැටීම එම අංශයෙහි සමස්ත වර්ධනය අඩු වීමට හේතු විය. ආර්ථික ප්‍රසාරණය, රැකියා අවස්ථාවන් වඩා උත්පාදනය කළ බැවින්, 2006 දී සියයට 6.5 ක් වූ සේවා වියුක්ති අනුපාතය 2007 දී සියයට 6.0 දක්වා තවදුරටත් පහත වැටුණු අතර, එය මෙතෙක් වාර්තාගත අඩුම වාර්ෂික විරැකියා අනුපාතය විය.



**ආර්ථික වර්ධනය 2006 පැවති සියයට 7.7 සිට 2007 දී සියයට 6.8 දක්වා පහත වැටීම සමස්ත ඉල්ලුමෙහි වර්ධනය අඩුවීම තුළින් පෙන්නුම් කෙරේ.** පසුගිය වර්ෂ කිහිපය තුළ ආර්ථික වර්ධනය සඳහා ගාමකත්වය සපයන ලද්දේ දේශීය ඉල්ලුම ඉහළයාමයි. මෙම ප්‍රවණතාවය අඩු අනුපාතයකින් වුවද 2007 වර්ෂයේදීද නිරීක්ෂණය කළ හැකි විය. පරිභෝජන ඉල්ලුම සහ ආයෝජන ඉල්ලුම යන දෙකම වර්ෂය තුළදී වර්තන වශයෙන් සියයට 21 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, 2006 වර්ෂය සමග සසඳන කළ ද.දේ.නි. යෙහි ප්‍රතිශත වශයෙන් පරිභෝජන වියදමද, ආයෝජන වියදමද පහත වැටුණි. දේශීය සමාහාර ඉල්ලුම් වර්ධනය පහත වැටීම මගින් පිළිබිඹු වූයේ ශ්‍රී ලංකා මහ බැංකුව සිය මූල්‍ය ප්‍රතිපත්ති රාමුව යටතේ අනුගමනය කරන ලද ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති මාලාවේ බලපෑමයි. මිල ගණන් ඉහළ යාම අඩුකර ගැනීමේ අරමුණින්,

**2.1 සංඛ්‍යා සටහන**

**කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය (2002 ස්ථාවර මිල අනුව)**

| අංශය | වෙනස්වීමේ අනුපාතය (%) | | ද.දේ.නි.හි වෙනස්වීමේ දායකත්වය (%) | | ද.දේ.නි.යට දායකත්වය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2006 | 2007(අ) | 2006 | 2007(අ) | 2006 | 2007(අ) |
| **කෘෂිකාර්මික** | **6.3** | **3.3** | **10.3** | **6.0** | **12.3** | **11.9** |
| **1 කෘෂිකර්මය, පශු සම්පත් සහ දැව ආදී වන ද්‍රව්‍ය** | **3.4** | **2.2** | **5.3** | **3.6** | **11.3** | **10.8** |
| 1.1 තේ | - 2.0 | - 2.0 | - 0.4 | - 0.4 | 1.3 | 1.2 |
| 1.2 රබර් | 4.6 | 7.7 | 0.1 | 0.3 | 0.2 | 0.2 |
| 1.3 පොල් | 6.4 | 3.9 | 1.2 | 0.8 | 1.4 | 1.3 |
| 1.4 සුළු අපනයන බෝග | 2.2 | 5.1 | 0.1 | 0.4 | 0.5 | 0.5 |
| 1.5 වී | 2.9 | - 6.4 | 0.7 | - 1.7 | 1.8 | 1.6 |
| 1.6 පශු සම්පත් | 8.1 | 7.9 | 0.9 | 1.0 | 0.9 | 0.9 |
| 1.7 අනෙකුත් ආහාර බෝග | 3.0 | 4.4 | 1.6 | 2.5 | 3.9 | 3.8 |
| 1.8 දුම්කොළ | 38.7 | - 25.2 | 0.1 | - 0.1 | 0.0 | 0.0 |
| 1.9 බුලත් සහ පුවක් | 6.7 | 3.3 | 0.1 | 0.0 | 0.1 | 0.1 |
| 1.10 වතු සංවර්ධනය | 4.9 | 5.8 | 0.2 | 0.2 | 0.3 | 0.3 |
| 1.11 වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන | 3.2 | 2.1 | 0.1 | 0.1 | 0.3 | 0.3 |
| 1.12 දැව සහ වන සම්පත් | 6.5 | 5.2 | 0.5 | 0.5 | 0.6 | 0.6 |
| **2 ධීවර කර්මාන්තය** | **53.5** | **15.6** | **5.0** | **2.3** | **1.0** | **1.1** |
| **කාර්මික** | **8.1** | **7.6** | **29.8** | **31.7** | **28.2** | **28.5** |
| **3 පතල් සහ කැනීම්** | **24.2** | **19.2** | **4.7** | **4.8** | **1.7** | **1.9** |
| **4 නිෂ්පාදන කර්මාන්ත** | **5.5** | **6.4** | **13.1** | **16.8** | **17.7** | **17.7** |
| 4.1 සැකසුම් (තේ, රබර් සහ පොල්) | 0.8 | 2.4 | 0.1 | 0.2 | 0.7 | 0.6 |
| 4.2 කර්මාන්තශාලා නිෂ්පාදන | 5.7 | 6.7 | 12.2 | 15.7 | 15.9 | 15.9 |
| 4.3 ගෘහ කර්මාන්ත | 5.7 | 5.6 | 0.8 | 0.9 | 1.1 | 1.1 |
| **5 විදුලිය, ගෑස් සහ ජලය** | **14.8** | **4.6** | **4.6** | **1.7** | **2.5** | **2.5** |
| 5.1 විදුලිය | 16.2 | 4.6 | 4.3 | 1.5 | 2.2 | 2.2 |
| 5.2 ගෑස් | 7.6 | 2.9 | 0.2 | 0.1 | 0.2 | 0.2 |
| 5.3 ජලය | 3.6 | 7.1 | 0.1 | 0.1 | 0.1 | 0.1 |
| **6 ඉදිකිරීම්** | **9.2** | **9.0** | **7.4** | **8.3** | **6.3** | **6.4** |
| **සේවා** | **7.7** | **7.1** | **60.0** | **62.4** | **59.5** | **59.6** |
| **7 තොග සහ සිල්ලර වෙළෙඳාම** | **7.1** | **6.1** | **22.9** | **22.3** | **24.6** | **24.5** |
| 7.1 ආනයන වෙළෙඳාම | 6.8 | 3.3 | 8.4 | 4.6 | 9.4 | 9.1 |
| 7.2 අපනයන වෙළෙඳාම | 3.6 | 8.8 | 2.3 | 5.9 | 4.6 | 4.7 |
| 7.3 දේශීය වෙළෙඳාම | 8.9 | 7.6 | 12.2 | 11.8 | 10.6 | 10.7 |
| **8 හෝටල් සහ ආපනශාලා** | **2.5** | **- 2.3** | **0.2** | **- 0.1** | **0.5** | **0.4** |
| **9 ප්‍රවාහනය සහ සන්නිවේදනය** | **12.6** | **10.5** | **19.4** | **19.2** | **12.4** | **12.8** |
| 9.1 ප්‍රවාහනය | 11.2 | 9.4 | 14.9 | 14.6 | 10.6 | 10.8 |
| 9.2 භාණ්ඩ මෙහෙයවීම - වරාය සහ සිවිල් ගුවන් සේවා | 20.0 | 8.8 | 1.5 | 0.8 | 0.6 | 0.7 |
| 9.3 තැපැල් සහ විදුලි සංදේශ | 21.6 | 21.5 | 3.0 | 3.8 | 1.2 | 1.4 |
| **10 බැංකු, රක්ෂණ සහ දේපළ වෙළෙඳාම් යනාදිය** | **8.5** | **8.7** | **9.4** | **11.0** | **8.5** | **8.7** |
| **11 නිවාස අයිතිය** | **1.1** | **1.1** | **0.5** | **0.6** | **3.4** | **3.2** |
| **12 රාජ්‍ය සේවා** | **5.0** | **6.0** | **5.2** | **6.8** | **7.7** | **7.7** |
| **13 පෞද්ගලික සේවා** | **7.8** | **7.8** | **2.4** | **2.7** | **2.3** | **2.4** |
| **දළ දේශීය නිෂ්පාදිතය** | **7.7** | **6.8** | **100.0** | **100.0** | **100.0** | **100.0** |
| විදේශීය ශුද්ධ සාධක ආදායම | -20.9 | 15.7 | | | | |
| **දළ ජාතික නිෂ්පාදිතය** | **7.5** | **7.1** | | | | |

(අ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**විශේෂ සටහන 4**

**ජාතික ආදායම ඇස්තමේන්තු පිළිබඳ සටහන**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ජාතික ආදායම් ගිණුම් සම්පාදනයේ සහ ප්‍රකාශයට පත්කිරීමේ වගකීම සහිත නිල ආයතනය වේ. කෙසේ වුවද, අතීතයේ දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ මහ බැංකුව යන ආයතන දෙකම ජාතික ආදායම් සංඛ්‍යාලේඛන සම්පාදනය සහ ප්‍රකාශයට පත්කිරීම සිදු කර තිබේ. මෙම ද්විගුණිත උත්සාහය මහජනතාව තුළ යම් ව්‍යාකූලත්වයකට හේතුවන බැවින්, 2007 සිට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන සංඛ්‍යාලේඛන භාවිතා කිරීමට මහ බැංකුව තීරණය කළේය. කෙසේ වුවද, සාර්ව ආර්ථික කළමනාකරණය සඳහා දළ ජාතික නිෂ්පාදිතය (ද.දේ.නි.) සහ එහි වර්ධනයෙහි පුරෝකථනයන් සකස් කිරීම මහ බැංකුව විසින් අඛණ්ඩව සිදුකරනු ලැබේ. මෙම භාවිතය පොදු මිල මට්ටම සහ උද්ධමනය සකස් කිරීම හා පුරෝකථනය සමග අනුකූල වන අතර මෙහිදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පැවති මිල මට්ටම සහ උද්ධමනය සකස් කරන අතර මහ බැංකුව මුදල් ප්‍රතිපත්තිය අරමුණු කරගෙන උද්ධමනය පුරෝකථනය කරයි.

මෙම ප්‍රතිපත්තියට අනුව යමින් මෙම ප්‍රකාශනයේ ද සංසන්දනය කිරීම් සඳහා 2006 වර්ෂයේ ද.දේ.නි. ඇස්තමේන්තු භාවිතා කර ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු භාවිතා කරගෙන ගණනය කරන ලද අනුපාතයන් 2006 දී මහ බැංකුව විසින් සකස් කරන ලද ඇස්තමේන්තු භාවිතා කරගෙන ගණනය කරන ලද සහ 2006 මහ බැංකු වාර්ෂික වාර්තාවේ සඳහන් කර ඇති අනුපාතයන්ගෙන් වෙනස් විය හැක. ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස ඉතිරි කිරීම්, ආයෝජනය, රාජ්‍ය ආදායම, රාජ්‍ය වියදම, සමස්ත අයවැය හිඟය, රාජ්‍ය ණය හා විදේශීය ජංගම ගිණුම වැනි සාර්ව විචල්‍යයන් සමහරක් මෙන්ම ඒක පුද්ගල ආදායම ද 2006 දී ප්‍රසිද්ධ කරන ලද එම දත්තයන්ගෙන් වෙනස් විය හැක. දත්තයන් භාවිතා කරන්නන් හා විශ්ලේෂකයන් මෙම දත්ත මූලාශ්‍රයන් සැසඳීමේ දී පරික්ෂාකාරී විය යුතු වේ.


භාණ්ඩ හා සේවා ඉල්ලුම ඉහළ යාම පාලනය කිරීම සඳහා අනුගමනය කරන ලද මූල්‍ය ප්‍රතිපත්තීන් ආර්ථික වෘද්ධි ක්‍රියාකාරීත්වය කෙරෙහි සෘණාත්මකව බලපෑ බවට සාධක ඇත.

**භාණ්ඩ හා සේවා අපනයනය සඳහා වන ඉල්ලුම හෙවත් බාහිර ඉල්ලුම 2007 වර්ෂයේදී ආර්ථික වෘද්ධි අපේක්ෂනයන් දිරිගන්වමින් ඉහළ ගියේය.** කාර්මික හා ඛණිජ අපනයන සඳහා වූ ඉල්ලුම ඉහළ යාම මෙම සංවර්ධනයට දායක විය. ප්‍රාථමික භාණ්ඩ සඳහා වන ජාත්‍යන්තර මිල ගණන් ඉහළ යෑමට අනුරූපව කෘෂි අපනයන බෝග මිල ගණන් අධික ලෙස ඉහළ ගියද, සැපයුම් බාධක හේතුවෙන් කෘෂිකාර්මික අපනයන ඉහළ ගියේ කිසියම් මධ්‍යස්ථ ප්‍රමාණයකිනි.

**මේ අතරතුර විදේශීය ශුද්ධ සාධක ආදායමට ගලපන ලද ද.දේ.නි.ය වශයෙන් අර්ථ දැක්වෙන දළ ජාතික නිෂ්පාදිතය, ද.දේ.නි.යේ වර්ධන වේගය ඉක්මවමින් සියයට 7.1 කින් වර්ධනය විය.** විදේශීය ශුද්ධ සාධක ආදායම තවදුරටත් සෘණ මට්ටමක පැවතියේ වී නමුදු ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර පොළී අනුපාතික ඉහළ යාම නිසා නිල සංචිත ආයෝජනයෙන් ලැබූ පොළී ආදායම සියයට 44 කින් ඉහළ යාම හේතුකොට ගෙන සහ 2007 වර්ෂයේදී නිල සංචිත ප්‍රමාණය ඉහළයාම හේතුකොට ගෙන එහි අභිවෘද්ධියක් දැකිය හැකි විය. මීට අමතරව, වාණිජ බැංකු ද ඇතුළත් පෞද්ගලික අංශයට අයත් විදේශීය මූල්‍ය වත්කම්වලින් ලැබෙන ආදායමද පොළී අනුපාතික වැඩිවීම හේතුවෙන් ඉහළ ගියේය.

**2.1 රූප සටහන**

**වාර්ෂික වර්ධන අනුපාතික**




**මූර්ත ආර්ථික ක්‍රියාකාරකම්හි වර්ධනය සහ සාමාන්‍ය මිල මට්ටම්හි ඉහළයාම පිළිබිඹු කරමින්, පවත්නා මිල ගණන් යටතේ වන ද.දේ.නි.ය 2007 දී සියයට 21.8 කින් ඉහළ යමින් රුපියල් බිලියන 3,578 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇත.** 2006 දී වාර්තා වූ සියයට 11.3 ට සාපේක්ෂව ද.දේ.නි.යෙහි අවධමනකය මගින් මනිනු ලබන සමස්ත උද්ධමනය 2007 වර්ෂයේදී සියයට 14.0 ක් වී ඇත. ඒ අනුව මැදි වසර ජනගහණය දශ ලක්ෂ 20 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇති බැවින්, 2007 වර්ෂය සඳහා වන ඒක පුද්ගල ද.දේ.නි.ය රුපියල් 178,830 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇත. සියයට 21 ක් වූ ඒක පුද්ගල ද.දේ.නි. යේ ඉහළයාම පොදු මිල මට්ටම්හි වර්ධනය ඉක්මවා යන බැවින්, එමගින් සාමාන්‍ය වශයෙන් සමස්ත ජීවන මට්ටමෙහි ඉහළයාමක් සළකුණු කරයි. ඇමරිකා එක්සත් ජනපද ඩොලර් වශයෙන් සලකන කල 2007 දී ඒක පුද්ගල

ද.දේ.නි. ය ඩොලර් 1,421 සිට 1,617 දක්වා සියයට 13.7 කින් ඉහළ ගියේය. මෙලෙස ශ්‍රී ලංකාව ලෝක බැංකු වර්ගීකරණයට අනුව ඩොලර් 756 සිට 2,995 අතර පරාසයට අයත් වන පහළ මධ්‍යම ආදායම් කාණ්ඩය තුළ තවදුරටත් ඉහළට ගමන් කළේය.

**දේශීය ඉතුරුම් 2006 පැවති රුපියල් බිලියන 499 සිට 2007 දී රුපියල් බිලියන 629 දක්වා සියයට 26 කින් ඉහළ ගිය අතර, දේශීය ඉතුරුම් අනුපාතයද (දේශීය ඉතුරුම් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන්) සියයට 17.0 සිට 17.6 දක්වා ඉහළ ගියේය.** පරිභෝජන අනුපාතය පහළ යාමත්, ඉතුරුම් අනුපාතය ඉහළ යාමත් මගින් ශ්‍රී ලංකා මහ බැංකුව අනුගමනය කළ ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්තීන්ගේ බලපැවැත්ම පෙන්වයි. ආයතනික අංශයේ ලාභදායිත්වය ඉහළ යාමද, ඉතුරුම් ඉහළයාම සඳහා බලපෑවේය. රාජ්‍ය ඉතුරුම් අඛණ්ඩව සෘණ මට්ටමක පැවති නමුදු, රාජ්‍ය නිර්-ඉතුරුම් 2007 වර්ෂයේදී අඩු මට්ටමක පැවති බැවින්, දේශීය ඉතුරුම් වර්ධනයට දායක විය. ශුද්ධ විදේශ සංක්‍රාම ඉහළයාම සහ විදේශ ශුද්ධ සාධක ආදායමෙහි වූ අභිවෘද්ධිය හේතුවෙන් ජාතික ඉතුරුම් ද 2007 වර්ෂයේදී ඉහළ ගියේය.

## 2.2 ආංශික නිමැවුම, ප්‍රතිපත්ති, ආයතනික පහසුකම් සහ ගැටළු

### කෘෂිකාර්මික අංශය

**2007 වර්ෂය තුළ කෘෂිකර්මය, වන සහ ධීවර අංශය නොකඩවා මධ්‍යස්ථ වේගයකින් වර්ධනය වූ අතර එකතු කළ අගය අනුව සියයට 3.3 ක වර්ධනයක් වාර්තා කළේය.** රබර් සහ පශු සම්පත් නිෂ්පාදනයන්හි විශිෂ්ඨ වර්ධනයත් ධීවර කර්මාන්තය සම්පූර්ණයෙන්ම යථා තත්ත්වයට පැමිණීමත් මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක විය. 2007 වර්ෂය තුළදී කජු හා කොකෝවා වැනි සුළු අපනයන බෝග නිෂ්පාදනයන් ද, පොල්, පළතුරු සහ එළවළු නිෂ්පාදනයන් ද වර්ධනය වී ඇත. කාලගුණයේ බලපෑමෙන් තේ සහ වී නිෂ්පාදනයෙහි දක්නට ලැබුන තාවකාලික පසු බෑම 2008 වර්ෂය තුළදී යථා තත්ත්වයට පත්වේ යැයි අපේක්ෂා කෙරේ.

### අපනයන කෘෂිකර්මය

**2007 වර්ෂයේ තේ නිෂ්පාදනය කි.ග්‍රෑ. දශ ලක්ෂ 305 දක්වා සියයට 2 කින් සුළු වශයෙන් අඩුවිය.** 2006 වසර අග භාගයේදී වතු අංශයේ කම්කරුවන් සෙමින් වැඩ කිරීමේ වෘත්තිය ක්‍රියාමාර්ගයෙන් අනතුරුව වැඩ වර්ජනය කිරීමත් ඉන් පසුව නියඟ සහිත කාලගුණික තත්ත්වයක් පැවතීමත් තේ නිෂ්පාදනය පහළ වැටීමට හේතු විය. නිර්දේශිත ප්‍රමාණයට වඩා අඩුවෙන් පොහොර භාවිතා කිරීමද ඵලදාව අඩු වීමට හේතු විය.

**තේ මිල ගණන් තියුණු ලෙස ඉහළයාම නිසා අපනයන ඉපැයීම් ඉහළගිය අතර එමගින් සාපේක්ෂ වශයෙන් ඉහළ ගිය නිෂ්පාදන පිරිවැය සමනය කිරීමට හේතු විය.** වර්ෂය තුළදී වැටුප්, බලශක්ති මිල සහ පොහොර මිල සැලකිය යුතු ලෙස වැඩි විය. 2007 ජූනි මසදී වතු කම්කරුවන්ගේ අවම දෛනික වැටුප රුපියල් 189 සිට රුපියල් 260 දක්වා සියයට 38 කින් වැඩි විය. කෙසේ වෙතත්, වසර තුළදී තේ අපනයන මිලෙහි සහ කොළඹ වෙන්දේසියේ තේ මිලෙහි සාමාන්‍යය පිළිවෙලින් සියයට 31.7 කින් සහ සියයට 40 කින් වර්ධනය විය. කුඩා තේ වතු හිමියන්ගෙන් මිලදීගත් තේ දළු කි.ග්‍රෑ. 1 කට ගෙවූ මිලෙහි සාමාන්‍යය රුපියල් 40.88 දක්වා සියයට 40 කින් වර්ධනය විය. තේ නිෂ්පාදන අංශයෙහි සියයට 0.2 ක් පමණ වන වාර්ෂික නැවත වගා කිරිමේ අනුපාතිකය ඉහළ නැංවීමේ අරමුණින් තේ සමාගම් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින්ද, කුඩා තේ වතු හිමියන්ගේ අංශය සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින්ද සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කෙරුණි. වර්ෂය තුළ උපද්‍රව විශ්ලේෂණ සහ අවධි ලක්ෂ්‍යය පාලන පද්ධතිය (HACCP) පිළිබඳ සහතික පත්‍රය ලබා ගැනීමේ අරමුණින් තේ කර්මාන්තශාලා නවීකරණ වැඩසටහන්වලට ඉහළ ප්‍රමුඛතාවයක් හිමි වූ අතර එම සහතික පත්‍ර ලබා ගැනීම ඔවුන්ගේ නිෂ්පාදිතවල එකතු කළ වටිනාකම ඉහළයාමට හේතු වනු ඇත. එමෙන්ම, තේ කර්මාන්ශාලා සඳහා අඩු පිරිවැයකින් විදුලිය ලබා ගැනීම සඳහා කුඩා බලශක්ති බලාගාර සංවර්ධනය කිරීම දිරි ගන්වා ඇත.

**රබර් නිෂ්පාදනය කි.ග්‍රෑම් දශ ලක්ෂ 118 දක්වා සියයට 7.7 කින් වැඩි විය.** අස්වනු අධික කාල වකවානුවේදී කම්කරු විරෝධතා පැවතුනත් ආකර්ෂණීය මිල ගණන්

**2.2 සංඛ්‍යා සටහන** — **කෘෂිකර්මාන්ත නිෂ්පාදන දර්ශක (1997-2000=100)**

| අයිතමය | 2006(අ) | 2007(ආ) | වර්ධන වේගය(%) 2007/06 |
|---|---|---|---|
| කෘෂිකාර්මික සහ මත්ස්‍ය | 108.9 | 111.4 | 2.3 |
| 1. කෘෂිකර්මය | 111.7 | 112.2 | 0.5 |
| 1.1 කෘෂිකාර්මික බෝග | 111.6 | 111.3 | -0.3 |
| තේ | 108.2 | 106.0 | -2.0 |
| රබර් | 113.2 | 121.9 | 7.7 |
| පොල් | 100.3 | 103.3 | 3.0 |
| වී | 125.4 | 117.4 | -6.4 |
| අනෙකුත් බෝග | 108.3 | 112.5 | 3.9 |
| 1.2 පශු සම්පත් | 112.1 | 120.2 | 7.3 |
| 2. මත්ස්‍ය | 92.0 | 106.6 | 15.8 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

අඛණ්ඩව පැවතීම රබර් නිෂ්පාදනයෙහි වර්ධනයට හේතු වූ අතර ඒ සඳහා විශේෂයෙන් ඵලදායිතා වර්ධනය ද හේතු විය.

**රබර් අංශයේ ඵලදායිතාවය තවදුරටත් ඉහළ නැංවීම තුළින් ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි ස්වාභාවික රබර් සඳහා පවතින ඉහළ මිලෙන් ලැබෙන වාසි වැඩි කර ගත හැකිය.** ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වාර්ෂික ඵලදාව හෙක්ටයාරයකට කි.ග්‍රෑ. 1,260 දක්වා ක්‍රමයෙන් වර්ධනය වී තිබුණද හෙක්ටයාරයකට ලබාගත හැකි වාර්ෂික සාමාන්‍යය ඵලදාව කි.ග්‍රෑ. 1,500 ක් පමණ වේ. කුඩා රබර් වතු හිමියනට ඔවුන්ගේ නිෂ්පාදන ඵලදායිතාවය වැඩි කර ගැනීමට කෙටිකාලීන මෙන්ම දිගුකාලීන ක්‍රමවේදයන් සඳහා අනුගත වීමේ හැකියාවන් පවතී. ඉහළ ඵලදාවක් ලබාගැනීමේදී ගුණාත්මක භාවයෙන් යුත් පොහොර නිර්දේශිත ප්‍රමාණයෙන් භාවිතා කිරීම වැදගත් වේ. එයට අමතරව, රබර් පර්යේෂණ ආයතනය මගින් නිර්දේශිත කෘෂි කළමනාකරණ විධි භාවිතා කිරීමට පෙළඹීම සහ නව තාක්ෂණය භාවිතා කිරීම, ඉහළ ඵලදාවක් ලබාදෙන පැල වර්ග වගා කිරීම, තෝරාගත් නිසරු ඉඩම් සඳහා පාංශු කළමනාකරණ වැඩසටහන් මගින් පසෙහි ගුණාත්මක බව වර්ධනය කිරීම, තෝරාගත් සුදුසු ඉඩම්වල රබර් වගා කිරීම, වල් පැළ නැසීම සහ පාංශු සහ ජල සංරක්ෂණය රබර් ඵලදායිතාවය වැඩි කිරීම සඳහා උපකාරි වේ.

**රබර් පර්යේෂණ ආයතනය රබර් කර්මාන්තයේ සංවර්ධනය උදෙසා පර්යේෂණ මාලාවක් සිදුකර ඇත.** ඒ අතුරින් වැඩි දියුණු කරන ලද නව කිරි කපන පිහියක් හඳුන්වාදීම, වාණිජ භාවිතය සඳහා පහසුවෙන් එහා මෙහා ගෙන යා හැකි සුළු පරිමාණ ෂීට් රබර් වියළන ඒකකයක් හඳුන්වාදීම (මේ තුළින් රබර් වියළීමේ කාල පරාසය දින 6 සිට දින එකක් දක්වා අඩු කරගත හැකිය) සහ අඩු පිරිවැයකින් යුත් වල් පැළෑටි මර්දන දැලක් වැඩි දියුණු කිරීම සඳහන් කළ හැකිය.

**යහපත් කාලගුණික තත්ත්වයක් පැවතීම හේතුවෙන් 2007 දී පොල් නිෂ්පාදනය පොල් ගෙඩි දශ ලක්ෂ 2,869 දක්වා සියයට 3 කින් වර්ධනය විය.** කෙසේ වෙතත් මිල අධික පොසිල ඉන්ධනවලට විකල්පයක් ලෙස ජීව ඉන්ධන නිෂ්පාදනය සඳහා කාබනික තෙල් වලට ඇති ඉල්ලුම වැඩිවීමේ ජාත්‍යන්තර නැඹුරුව පිළිබිඹු කරමින් පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදනවල මිල තියුණු ලෙස ඉහළ නැගුණි. ඉහළ ගිය පොල් මිල දේශීය කපාපු පොල් කර්මාන්තය කෙරෙහි අයහපත් ලෙස බලපෑ අතර, එය සමහර කර්මාන්තශාලා වැසී යාමටත් මෙම අංශයේ රැකියා අහිමිවීමටත් හේතු විය.

**පොල් කර්මාන්තයේ සංවර්ධනය උදෙසා රජය ක්‍රියා මාර්ග කිහිපයක් ගනු ලැබීය.** අපනයනය සඳහා ඉහළ එකතු කළ වටිනාකමක් සහිත පොල් නිෂ්පාදනය

2.3 සංඛ්‍යා සටහන

**ප්‍රධාන කෘෂි බෝගවල උපනතීන්**

| | අයිතමය | ඒකකය | 2006(අ) | 2007(ආ) |
|---|---|---|---|---|
| 1. | තේ | | | |
| 1.1 | නිෂ්පාදනය (ඇ) | කි.ග්‍රෑ. දශ ලක්ෂ | 310.8 | 304.6 |
| 1.2 | මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 222 | 222 |
| 1.3 | දළු කැඩීම සිදුකරන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 193 | 193 |
| 1.4 | නිෂ්පාදන පිරිවැය (ඈ) | රු./කි.ග්‍රෑ. | 188.40 | 237.10 |
| 1.5 | සාමාන්‍ය මිල | | | |
| | - කොළඹ වෙන්දේසිය | රු./කි.ග්‍රෑ. | 198.87 | 279.10 |
| | - අපනයන (නැ.වි.ස.) | රු./කි.ග්‍රෑ. | 279.97 | 364.28 |
| 1.6 | නැවත වගා කිරීම | හෙක්ටයාර | 1,338 | 1,353 |
| 1.7 | අළුතින් වගා කිරීම | හෙක්ටයාර | 16 | 4 |
| 1.8 | එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 1.4 | 1.7 |
| 2. | රබර් | | | |
| 2.1 | නිෂ්පාදනය | කි.ග්‍රෑ. දශ ලක්ෂ | 109.2 | 117.6 |
| 2.2 | මුළු වගා බිම් ප්‍රමාණය (ඊ) | හෙක්ටයාර දහස් | 120 | 120 |
| 2.3 | කිරි කපන ලද බිම් ප්‍රමාණය (ඊ) | හෙක්ටයාර දහස් | 97 | 93 |
| 2.4 | නිෂ්පාදන පිරිවැය | රු./කි.ග්‍රෑ. | 97.20 | 104.82 |
| 2.5 | සාමාන්‍ය මිල | | | |
| | - කොළඹ වෙන්දේසිය (ආර්.එස්.එස්.නො.1) | රු./කි.ග්‍රෑ. | 202.55 | 234.22 |
| | - අපනයන (නැ.වි.ස.) | රු./කි.ග්‍රෑ. | 189.86 | 234.48 |
| 2.6 | නැවත වගා කිරීම (උ) | හෙක්ටයාර දහස් | 2,372 | 1,474 |
| 2.7 | අළුතින් වගා කිරීම (උ) | හෙක්ටයාර දහස් | 922 | 1,701 |
| 2.8 | එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 0.8 | 0.7 |
| 3. | පොල් | | | |
| 3.1 | නිෂ්පාදනය | ගෙඩි දශ ලක්ෂ | 2,785 | 2,869 |
| 3.2 | මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 395 | 395 |
| 3.3 | නිෂ්පාදන පිරිවැය | ගෙඩියකට රුපියල් | 7.00 | 10.25 |
| 3.4 | සාමාන්‍ය මිල | | | |
| | - නිෂ්පාදන මිල | ගෙඩියක් රුපියල් | 11.97 | 16.87 |
| | - අපනයන (නැ.වි.ස.) (ඌ) | ගෙඩියක් රුපියල් | 24.26 | 27.67 |
| 3.5 | නැවත වගා කිරීම/ යටි වගාව (එ) | හෙක්ටයාර | 3,785 | 2,529 |
| 3.6 | අළුතින් වගා කිරීම (එ) | හෙක්ටයාර | 4,026 | 2,957 |
| 3.7 | එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 1.2 | 1.3 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) හරිත තේ ඇතුළුව
(ඈ) අමු තේ දළු සැපයුම්කරුවන්ගේ ලාභාංශද ඇතුළත් වේ.
(ඉ) වගා කිරීම සහ සැකසුම් කටයුතු සිදු කළ ප්‍රමාණය පමණි.
(ඊ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් 2003 දී පවත්වන ලද කෘෂිකර්ම සංගණනය මත පදනම්ව රබර් වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය සංශෝධනය කර ඇත.
(උ) රබර්සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගා සහන යෝජනා ක්‍රමය අනුව වගා කළ බිම් ප්‍රමාණය
(ඌ) ප්‍රධාන පොල් නිෂ්පාදන තුන සඳහා පමණි.
(එ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් දෙනු ලබන වගා සහනාධාර ක්‍රමය යටතට අයත් ඉඩම් ආවරණය වේ.

මූලයන් : ශ්‍රී ලංකා තේ මණ්ඩලය
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
වැවිලි සමාගම්
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දිරිමත් කිරීම සඳහා 2007 මැයි මස 23 දින සිට ක්‍රියාත්මක වන පරිදි නව සෙස් බදු ව්‍යුහයක් හඳුන්වා දෙන ලදී. එවැනි නිෂ්පාදන සඳහා සෙස් බද්ද එකතු කළ වටිනාකම අඩු නිෂ්පාදන සඳහා වූ සෙස් බද්දට වඩා අඩු අගයකි. පොල් වගාවට සුදුසු සරු පොල් ඉඩම් කට්ටි කිරීම නැවැත්වීමට ද අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබීය. තවද අනවසරයෙන් පොල් ගස් කැපීම තහනම් කිරීමට ද තීරණය කර තිබේ. පොල් පර්යේෂණ ආයතනය අනුමත කළ රටවලින් 2008 පෙබරවාරි අග දක්වා කෝප්පරා මෙට්‍රික් ටොන් 30,000 ක් ආනයනය කිරීමට රජය අවසර දෙන ලදී. එමෙන්ම, ඉහළ යමින් පවතින පොල් සහ පොල් තෙල් මිල පහත හෙළීම සඳහා අමු පොල් අපනයනය තාවකාලිකව නතර කිරීමටත්, පොල් තෙල් ආනයන බදු ඉවත් කිරීමටත් තීරණය කරන ලදී. සියයට 28 ක ඉහළ අගයක්වූ ආහාර පිසීමට ගන්නා තෙල් සඳහා වූ තීරු බද්ද සියයට 10 දක්වා තාවකාලිකව පහත හෙලන ලදී.

**පොල් පර්යේෂණ ආයතනය පොල් වගාවේ ඵලදායිතාවය වර්ධනය කිරීම, වගා සංරක්ෂණය සහ පොල් ආශ්‍රිත නව නිෂ්පාදන හඳුන්වාදීම යන කරුණු සම්බන්ධයෙන් සිදුකරන පර්යේෂණ පැවැත්වීම අඛණ්ඩව සිදු කළේය.** තාක්ෂණය කාර්යක්ෂම ලෙස ප්‍රචලිත කිරීමට පොල් වගාකරුවන් මුල් කරගෙන විවිධ ස්ථානවල ක්ෂේත්‍ර වැඩසටහන් පවත්වා ඇත. ව්‍යවසායකයින් අතර පොල් ආශ්‍රිත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ව්‍යාප්ත කිරීම අවධාරණය කරමින් විද්‍යාත මධ්‍යස්ථාන ආධාරයෙන් පොල් ගස ආශ්‍රයෙන් කරන ලද නිෂ්පාදන ප්‍රවර්ධනය කරන ලදී. මේ අතරතුර, පොල් වගාවට වැළඳුන නව රෝගයක් මාතර සහ වැලිගම යන ප්‍රදේශ වලින් වාර්තා විය. වැලිගම කොළ කුණුවීමේ රෝගය ලෙස හඳුන්වන මෙම රෝගය කේරළයේ දක්නට ලැබුණ කොළ කුණුවීමේ රෝගයට සමාන වේ. මෙම රෝගය අනෙකුත් ප්‍රදේශ කරාද පැතිර යාමට ඇති අවදානම වැඩි හෙයින් ඒ පිළිබඳව ක්‍රියාත්මක වීම අත්‍යාවශ්‍ය කරුණකි.

**2007 වසර තුළ කුරුඳු, කරාබු නැටි, ගම්මිරිස් ආදි අනෙකුත් කෘෂි අපනයන භෝග නිෂ්පාදනයෙහි මිශ්‍ර ප්‍රගතියක් පෙන්නුම් කළේය.** කොකෝවා (සියයට 48), කජු මද (සියයට 20), බුලත් (සියයට 6), ගම්මිරිස් (සියයට 5) සහ කුරුඳු (සියයට 5) නිෂ්පාදනයන් වැඩි වී ඇති අතර, කරාබු නැටි (සියයට 16.4), පුවක් (සියයට 6.8) සහ කෝපි (සියයට 1.1) නිෂ්පාදනයන් පහළ වැටී ඇත.

### දේශීය කෘෂිකර්මය

**2007 වර්ෂයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 3,128,881 දක්වා සියයට 6.4 කින් පහත වැටුණි.** 2006/2007 මහ සහ 2007 යල වී නිමැවුම පිළිවෙලින් සියයට 7.7 කින් සහ සියයට 4 කින් අඩු විය. ආරක්ෂක හේතුන් නිසා නැගෙනහිර පළාතේ ගොවීන් තම වාසස්ථාන මාරු කිරීම සහ කාලගුණික වෙනස්වීම මෙම පහත බැසීමට ප්‍රධාන ලෙස හේතු විය. නැගෙනහිර පළාතේ වගා කළ බිම් ප්‍රමාණය 2006/2007 මහ සහ 2007 යල කන්නවල පිළිවෙලින් සියයට 35 කින් සහ සියයට 18 කින් පහත බැස ඇත. 2006 ඔක්තෝබර්-දෙසැම්බර් කාලයේදී පැවති තද වර්ෂාපතනය සහ


**2.4 සංඛ්‍යා සටහන** — **වී වගා අංශය පිළිබඳ සංඛ්‍යා**

| අයිතමය | ඒකකය | 2006 (අ) | | | 2007 (ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| වපුරන ලද බිම් ප්‍රමාණය දළ වශයෙන් | හෙක්ටයාර දහස් | 591 | 319 | 910 | 525 | 291 | 817 |
| අස්වැන්න නෙලා ගත් දළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 586 | 314 | 900 | 512 | 284 | 795 |
| අස්වැන්න කපා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 525 | 283 | 808 | 459 | 255 | 713 |
| නිෂ්පාදනය | මෙ.ටො.දහස් | 2,136 | 1,206 | 3,342 | 1,971 | 1,158 | 3,129 |
| | බුසල් දහස් | 102,350 | 57,814 | 160,164 | 94,449 | 55,050 | 149,499 |
| ඵලදාව (ඇ) | හෙක්ටයාරයට කි.ග්‍රෑ. | 4,069 | 4,263 | 4,137 | 4,298 | 4,543 | 4,385 |
| දෙන ලද ණය ප්‍රමාණය | රුපියල් දශ ලක්ෂ | 552 | 438 | 990 | 605 | 522 | 1,127 |
| සහල් ආනයනය | මෙ.ටො.දහස් | - | - | 12 | - | - | 88 |
| සහල් ආනයනයට සමාන වී ප්‍රමාණය | මෙ.ටො.දහස් | - | - | 18 | - | - | 129 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් රැස්කළ දත්ත පදනම් කොට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සකස් කරන ලද සංඛ්‍යා තොරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක ඵලදාව ගණනය කර ඇත. මුළු නිෂ්පාදනය අස්වැන්න නෙලා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගණනය කෙරේ.

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**2.2 රූප සටහන** **සහල් : සැපයුම සහ ඉල්ලුම**




ගංවතුර හේතුවෙන් සමහර දිස්ත්‍රික්කවල වී වගාවට හානි සිදු විය. ඊට අමතරව 2006 යල කන්නයේදී වී මිල අඩු අගයක පැවතීමද (කිලෝ ග්‍රෑම් 1 ක මිල රු. 13.00 ත් 15.00 අතර) 2006/2007 මහ කන්නයේදී වගාව අඩු වීමට හේතු විය. කෙසේ වෙතත් හෙක්ටයාරයක ඵලදායිතාව කි.ග්‍රෑ. 4,137 සිට කි.ග්‍රෑ. 4,385 දක්වා ඉහළ නැගීම මුළු නිෂ්පාදනයේ පහළ බැසීම සීමා කිරීමට උපකාරී විය.

**රජයේ වී මිලදී ගැනීමේ යාන්ත්‍රණය 2007 වසරේදී නොකඩවා ක්‍රියාත්මක විය.** ඒ අනුව, 2006 යල කන්නයේ සිට කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය විසින් දිගු වී ඇට (නාඩු) කි.ග්‍රෑ. 1 ක් රු. 16.50 කටත් කුඩා වී ඇට (සම්බා) කිලෝ ග්‍රෑ. 1 රු. 17.50 කටත් මිලදී ගැනීම ආරම්භ කරන ලදී. රජය 2006/07 මහ කන්නයේදී වී මෙට්‍රික් ටොන් 90,997 ක් මිලදී ගැනීමට රුපියල් දශ ලක්ෂ 1,543 ක් වැය කළ අතර 2007 යල කන්නයේදී වෙළෙඳ පොළ මිල රජය ගෙවන මිලට වඩා වැඩි වූ නිසා රජයට වී මිලදී ගැනීමට නොහැකි විය.

**වී නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ දැමීම පිණිස විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කෙරුණි.** ඵලදායිතාව වැඩිකර ගැනීම සඳහා නව තාක්‍ෂණය භාවිතා කිරීම හඳුන්වා දීමට කෘෂිකර්ම දෙපර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද "යාය" ආදර්ශන වැඩසටහන් 2007 වසරේදී ද ක්‍රියාත්මක විය. ඵලදායිතාව වැඩි කර ගැනීමට හැකියාව ඇති ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම ආවරණය කරමින් සහල් නිෂ්පාදන "යාය" වැඩසටහන් පවත්වන ලදී. 2007 වසරේදී, නව "සරු කෙත යාය" 150 ක් ස්ථාපනය කළ අතර, සහල් නිෂ්පාදනය හා ඵලදායිතාව ඉහළ දැමීම අරමුණු කරගෙන ගොවීන් සහ නිලධාරීන් 8,910 ක් පුහුණු කරන ලදී. වී ගොවීන්ට නව තාක්ෂණික දැනුම ලබාදීම පිණිස යාය වැඩසටහන් 948 ක් පවත්වන ලදී. සහල් ආශ්‍රිත නිෂ්පාදිත ජනප්‍රිය කිරීම සඳහා වැඩසටහන් ද නොකඩවා කරගෙන යන ලදී. දිස්ත්‍රික්ක මට්ටමින් පැවති කෘෂි ව්‍යාපාර සංවර්ධන ඒකක (කෘෂි සේවා පියස) කොට්ඨාශ මට්ටමින් පිහිටුවීමට අවශ්‍ය කටයුතු සිදුකළ අතර, ගොවීන්, ව්‍යාප්ති නිලධාරීන්, ගුරුවරුන් සහ සාමාන්‍ය ජනතාවට නව කෘෂිකාර්මික තාක්ෂණය පිළිබඳ පුහුණුවක් ලබාදීමට සහ ආදර්ශන පැවැත්වීම සඳහා ගන්නෝරුව සහ බටඅත කෘෂිකාර්මික තාක්ෂණික උද්‍යාන පිහිටුවන ලදී. කෘෂිකාර්මික සන්නිවේදන වැඩසටහන් ජන මාධ්‍ය තුළින් ද විසුරුවා හරින ලදී.

**සාධක කිහිපයක බලපෑමෙන් 2007 වසර අග භාගයේදී සහල් මිල තියුණු ලෙස ඉහළ නැගුණි.** තිරිඟු පිටි මිල තියුණු ලෙස ඉහළ නැගීමත් සමග සහල් සඳහා ඉල්ලුම සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩි විය. ගෝලීය වශයෙන් තිරිඟු පිටි නිෂ්පාදනය පහළ යාමට එල්-නිනෝ සංසිද්ධිය ද බලපෑවේය. මෙම නැඹුරුතාව තව දුරටත් පවතී යැයි අපේක්‍ෂා කෙරේ. රජය තීරු බදු රහිතව සහල් ආනයනය කිරීමට අවකාශ ලබා දී තිබියදීත් ඉහළ යන ඉල්ලුමට සරිලන සැපයුමක් නොමැතිවීම හේතුකොටගෙන සහල් මිල නොකඩවා වැඩි විය.

**සෙවනගල සීනි කර්මාන්තශාලවේ පැවති සේවක අරගල සහ උක් දඬු සැපයීම සීමාවීම හේතුකොටගෙන 2007 වසරේදී දේශීය සීනි නිෂ්පාදනය සියයට 43 කින් පහත වැටුණි.** උක් වගා කරන ප්‍රදේශවල පැවති නියඟය සහ සාපේක්ෂ වශයෙන් පොහොර මිල ඉහළයාම ද මෙම අඩුවීමට හේතු විය. 2007 දී අස්වනු නෙලන ලද බිම් ප්‍රමාණය සියයට 21 කින් අඩු වූ අතර, එයට හේතුව ගොවියන් උක් වගාවෙන් ඉවත් වී කෙසෙල් වගාව කෙරෙහි යොමු වීමයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් නෙලාගත් උක් දඬු ප්‍රමාණය සියයට 40 කින් අඩු විය. පෞද්ගලික අංශයෙන් ලබාගත් උක් ප්‍රමාණයද අඩකින් පමණ පහත වැටුණි. කෙසේ වෙතත්, කෘෂි උවදුරක් හේතුවෙන් ලුණුගල ප්‍රදේශයේ හානියට ලක් වූ බිම් පුනරුත්ථාපනය සඳහා ආධාර ලබාදෙනු ලැබීය. බිබිලේ සීනි සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පූර්ව-ශක්‍යතා අධ්‍යයනයක්ද සිදු කරන ලදී. කන්තලේ සහ හිඟුරාන සීනි කර්මාන්තශාලා නැවත ආරම්භ කිරීම සඳහා ද පියවර ගනු ලැබීය.

**ඉහළ ඵලදාවක් ලබාදෙන වාණිජ උක් ප්‍රභේද 2 ක් උක් පර්යේෂණ ආයතනය මගින් දියුණු කරන ලදී.** මෙම ප්‍රභේද තවදුරටත් අධ්‍යයනය සඳහා සෙවනගල, පැල්වත්ත හා හිඟුරාන කර්මාන්තශාලාවල ගොවියන් අතරේ බෙදාදෙන ලදී. හිඟුරාන සීනි කර්මාන්ත ප්‍රදේශයේ පැල තවාන් සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය

සපයන ලදී. තවද, ප්‍රදේශයට උචිත පැල වර්ග තෝරා ගැනීමට භූමි යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා මැදගම හා දෙහිගම ගම්මානයන්හි සුදුසු පැල වර්ග 16 ක් පරීක්ෂාවට භාජනය කරන ලදී.

## වන සම්පත්

**රජයේ සහ ණය දෙන ආයතනවල විශේෂ අවධානය මෙන්ම පෞද්ගලික අංශයේ සහ ප්‍රජාවගේ ක්‍රියාකාරී දායකත්වයෙන් වන සම්පත් සංවර්ධන කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක විය.** වන සම්පත් අංශයේ ප්‍රවර්ධනය, නඩත්තුව, කළමනාකරණය සහ නැවත වන වගා කිරීමේ කටයුතු සඳහා වනජීවී සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. 2006 දී ආරම්භ කරන ලද ආසියානු සුනාමි බලපෑමට ලක්වූ රටවල ප්‍රතිසංස්කරණය සඳහා වූ වනජීවී වැඩසටහන 2007 දී සම්පූර්ණ කරන ලදී. වනජීව දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් පර්යේෂණ මට්ටමේ නියමු ව්‍යාපෘතියක් ලෙස මහනුවර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයන්හි වැට එඬරු ශාඛයේ බීජ භාවිතයෙන් ජෛව-බලශක්ති නිෂ්පාදනය කිරීමේ "ජීව ජවය" ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතිය යටතේ වැට එඬරු ශාක 40,000 ක් රෝපණය කරන ලදී. වනසම්පත් අංශය කෙරෙහි පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඉහළ යාමත් සමඟ 2007 වසර අවසානයේ දී පෞද්ගලික අංශයට අයත් වාණිජ වන වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 510 දක්වා වැඩි විය.

## ධීවර

**සුනාමි උවදුරින් හානියට ලක් වූ ධීවර කර්මාන්තය සම්පූර්ණයෙන්ම යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින් 2007 දී වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය සියයට 16 කින් වර්ධනය වී මෙතෙක් වාර්තා වූ ඉහළම අගය එනම් කි.ග්‍රෑ. දශ ලක්ෂ 291 ට ළඟා විය.** මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය සියයට 17 කින්ද අභ්‍යන්තර ජල ජීවී මත්ස්‍ය නිෂ්පාදනය සියයට 9 කින්ද වැඩි විය. 2007 දී මෙම අංශ දෙකෙහිම වර්ධනය ඓතිහාසික වශයෙන් ඉහළම නිෂ්පාදන මට්ටම වාර්තා කිරීමට දායක විය. ශ්‍රී ලංකා ධීවර සංස්ථාව මාළු මිලදී ගැනීම හා බෙදාහැරීම ධීවර සංස්ථාවේ අධි ශීත ට්‍රක් රථ වලින් සිදු කිරීම හා රජයේ මැදිහත් වීම හේතුවෙන් මාළු මිල වසර මුළුල්ලේ බොහෝදුරට ස්ථාවරව පැවතිණි.

**මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම සඳහා පියවර කිහිපයක් ගන්නා ලද අතර** මසුන් ගොඩබෑම සඳහා ඇති ධාරිතාව වැඩිකිරීමේ අරමුණින් වෙරළබඩ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ හම්බන්තොට, අම්බලන්ගොඩ හා හලාවත ධීවර වරායන් ඉදිකරමින් පවතී. ශ්‍රී ලංකා ධීවර සංස්ථාව විසින් මරුවැල් පන්න යාත්‍රා දෙකක් එක් කරමින් ධීවර කර්මාන්තයේ තරඟකාරී බව වැඩි කර ඇත. තවද, එම සංස්ථාව මව් යාත්‍රා දෙකක් සේවයට යොදවමින් ගැඹුරු මුහුදේ ක්‍රියාත්මක වන බහු දින ධීවර යාත්‍රා සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීමද ආරම්භ කළේය. පැලියගොඩ, වඩා ඉඩ පහසුකම් සහිත ධීවර වෙළෙඳ සංකීර්ණයක් පිහිටුවා ශාන්ත ජෝන් මාළු වෙළෙඳ පොළ ඒ කරා ගෙනයාමට සැළසුම් කර ඇත. සුනාමි ව්‍යසනයෙන් විනාශයට පත් වූ ධීවර වරායන් ප්‍රතිසංස්කරණය සහ පුනරුත්ථාපනය කිරීම ආසන්න වශයෙන් සියයට 90 ක් පමණ අවසන් කර ඇත. දික්ඕවිට ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත නව ධීවර වරාය ඉදිකිරීමේ වැඩ කටයුතු ළඟදීම ආරම්භ කිරීමට නියමිතය. මෙම වරාය ඉදිකිරීමෙන් පසු බහු දින යාත්‍රා 340 ක් සඳහා පහසුකම් සැපසීමට හැකිවන අතර එය ශ්‍රී ලංකාවේ බහු දින යාත්‍රා නැවැත්වීමට පහසුකම් සහිත විශාලතම ධීවර වරාය වනු ඇත. ජලජීවී වගාව සංවර්ධනය සඳහා ජාතික ජලජීවී සංවර්ධන අධිකාරිය විසින් වගා දින දර්ශනයක් සකස් කර ඇති අතර මෙමගින් ඉස්සන් වගාවට බලපාන අවධානම් අවම කිරීමට අපේක්ෂා කෙරේ. පුත්තලම දිස්ත්‍රික්කයේ ඉස්සන් වගාව වැඩිදියුණු කිරීම පිණිස ජලයේ තත්ත්වය පරීක්ෂා කිරීමේ විද්‍යාගාරයක් බුත්තුළුඔය පිහිටුවා තිබේ. ජලජ පැලෑටි සඳහා ඇති විදේශීය ඉල්ලුම සපුරාලීම සහ රැකියා අවස්ථා බිහි කිරීමේ අරමුණ ඇතිව රම්බඩගල්ල ප්‍රදේශයේ පටක විද්‍යා පරීක්ෂණාගාරයක් ඉදිකරන ලදී. පෞද්ගලික අන්තර්ජාල පද්ධතියක් (IPVPN) මගින් ශ්‍රී ලංකාවේ සියළුම වරායන් එකිනෙක සම්බන්ධ කර ඇති අතර, මෙමගින් ධීවර යාත්‍රා නිරීක්ෂණය හා විශේෂ ආර්ථික කලාපයේ යෝජිත පංගු කළමනාකරණ ක්‍රමය පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ.

**2.5 සංඛ්‍යා සටහන**

**මත්ස්‍ය නිෂ්පාදනය**

මෙට්‍රික් ටොන් දහස්

| උප අංශය | 2006(අ) | 2007(ආ) |
|---|---|---|
| මුහුදු මත්ස්‍ය (ඇ) | 216 | 253 |
| ජල ජීවී සහ මිරිදිය මසුන් | 35 | 38 |
| **එකතුව** | **251** | **291** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුහුදු බඩ සහ ගැඹුරු මුහුදු ධීවර අංශයන්

මූලයන් : ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
ජාතික ජල සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිත ආයතනය

**ජාතික කෘෂිකර්මය පිළිබඳ විස්තීර්ණ ප්‍රතිපත්ති රාමුවක් රජය මගින් එළි දක්වන ලදී.** ජාතියේ ආහාර හා පෝෂණ ආරක්ෂාව තහවුරු කිරීම, කෘෂිකාර්මික ඵලදායිතාව වර්ධනය කිරීම හා තිරසාර සංවර්ධනය සහතික කිරීම, ඒකයක නිෂ්පාදන වියදම අඩු කිරීම අරමුණුකොට වැඩි දියුණුකළ කෘෂි තාක්ෂණ ක්‍රම ජනප්‍රිය කිරීම, ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය හා ආදායම ඉහළ දැමීම හා කෘෂිකර්මය පදනම් කරගත්

**විශේෂ සටහන 5**


## ශ්‍රී ලංකාව සතු සුවිශේෂ ආර්ථික කලාපය කාර්යක්ෂම ලෙස භාවිතයෙන් උපරිම ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීම

වර්ග කිලෝ මීටර් 21,500 ක භෞමික මුහුදු ප්‍රදේශයක්[1] හා වෙරළේ සිට නාවික සැතපුම් 200 ක් දක්වා දිවෙන වර්ග කිලෝ මීටර් 517,000 සුවිශේෂ ආර්ථික කලාපයක්[2] ශ්‍රී ලංකාව සතුය. තවද, ශ්‍රී ලංකාව සතු මහාද්වීපික සීමාවේ පිටත රේඛාව ප්‍රතිනිර්ණය කිරීමත් සමග සුවිශේෂ ආර්ථික කලාපය රට සතු භූමි ප්‍රදේශය මෙන් 20 ගුණයක් (දළ වශයෙන් වර්ග කි.මී. 1,400,000) දක්වා වැඩිවනු ඇතැයි අපේක්ෂා කරනු ලබයි. මෙමගින් තිරසාර ලෙස ස්වභාවික සම්පත් ගවේෂණය හා උපයෝජනය මෙන්ම ආර්ථික කටයුතු සිදුකිරීම සඳහා ශ්‍රී ලංකාවට අයිතියක් ලබාදෙයි.

1. 1976 අංක 22 දරන සාගර ප්‍රඥප්තිය අනුව වෙරළ සීමාවේ සිට නාවික සැතපුම් 12 ක් දක්වා ආවරණය වන ප්‍රදේශය
2. සාගරික සම්පත් සොයා ගැනීම හා භාවිතය පිළිබඳ රජයට සුවිශේෂ අයිතියක් ඇති මුහුදු කලාපය

දැනට පවතින දත්තයන්ට අනුව ශ්‍රී ලංකාව සතු නෛතික මුහුදුසීමාව තුළ ජෛව සම්පත් විශාල ලෙස සංකේන්ද්‍රණය වී ඇත. මහාද්වීපික තටාකය තුළ පමණක් වාර්ෂිකව ලබාගත හැකි මාළු ඵලදාව මෙ.ටො. 180,000 කට වඩා වැඩි වේ. ගැඹුරු මුහුද/අක්වෙරළ ප්‍රදේශවල පවතින කෙළවල්ලන් විශේෂ හා සමහර මත්ස්‍ය ප්‍රභේද ඒවායේ පවතින සම්පත් ප්‍රමාණයට සාපේක්ෂව මෙතෙක් භාවිතයට ගෙන ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයකි. ශ්‍රී ලංකාව කෙළවල්ලන් මාළු සම්පත්වලට සහ යුරෝපීය හා ජපාන පාරිභෝගික වෙළෙඳපොළට පහසුවෙන් පිවිසිය හැකි පරිදි ඉන්දියන් සාගරයේ පිහිටා තිබුණ ද ගැඹුරු මුහුදේ සම්පත් උපරිම ප්‍රතිලාභ ලැබෙන ආකාරයට උපයෝගීකොට ගෙන නැත. 2007 දී දළ දේශීය නිෂ්පාදිතයට ධීවර අංශයේ දායකත්වය සියයට 1.1 ක් වන අතර මෙම අගය මාලදිවයිනේ සියයට 6.2 ක් සහ නවසීලන්තයේ සියයට 5.3 කි. ශ්‍රී ලංකාවේ වෙරළ ආශ්‍රිත ධීවර සම්පත්

**වි.ස. 5.1**
**රූප සටහන[(අ)]**
**ශ්‍රී ලංකාවේ වෙරළ හා සමුද්‍ර සීමාවන්**




මූලය: ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන හා නියෝජිත ආයතනය

(අ) ශ්‍රී ලංකාවේ වෙරළ හා සමුද්‍ර සීමාවන් ඉහත රූප සටහනේ දැක්වේ. ශ්‍රී ලංකාව වටා ධීවර වරායන් 12 ක් ඇති අතර ඒවා නම් මෝදර, පානදුර, බේරුවල, හික්කඩුව, ගාල්ල, මිරිස්ස, පුරාණවැල්ල, කුඩාවැල්ල, තංගල්ල, කිරින්ද, ත්‍රිකුණාමලය හා කල්පිටියයි. හම්බන්තොට, අම්බලන්ගොඩ හා හලාවත ධීවර වරායන් දැනට ප්‍රතිසංස්කරණය කරමින් පවතී.

උපරිම තිරසාර මට්ටම දක්වා නෙළා ගනු ලැබුවත් ගැඹුරු මුහුදේ සම්පත් විශාල වශයෙන් උපයෝජනයට ගැනීමට සිදු නොවන අතර ඇතැම්විට විදේශීය යාත්‍රා මගින් නීති විරෝධී ලෙස නෙලාගනු ලබයි. එබැවින් රට සතු ධීවර සම්පත් උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සඳහා උපායශීලී ක්‍රියාමාර්ග ගැනීම වැදගත් වේ.

ඉන්දියන් සාගරයේ ශ්‍රී ලංකාවට අයත් සීමාව තුළ පවතින ජෛව සම්පත්වලට අමතරව වාණිජමය වශයෙන් ප්‍රයෝජනයට ගතහැකි ඛනිජ හා හයිඩ්‍රෝකාබන් සම්පත් ඇතැයි විශ්වාස කරනු ලැබේ. මහාද්වීපික තටාකය තුළ ටයිටේනියම්, සර්කෝනියම්, තෝරියම් හා පොටෑසියම් තැන්පත් නිධි සොයා ගෙන ඇති අතර, කොබෝල්ට්, නිකල්, තඹ සහ මැංගනීස් යන ලෝහ අඩංගු නිධි මහාද්වීපික නැගුම්[3] තුළ සොයාගෙන ඇත. තවද, මහාද්වීපික තටාකය අවසානයේ ඇති ඝණ අවසාධිත තැන්පත්වීම්වල, විශේෂයෙන් මන්නාරම හා කාවේරි ද්‍රෝණි තුළ හයිඩ්‍රෝකාබන ඇති බව අධ්‍යයනවලට පෙනී ගොස් ඇත.

මීට අමතරව මුහුදු ක්‍රීඩා, විනෝද සවාරි යාත්‍රා, නිල් තල් මසුන් හා ඩොල්ෆින් මසුන් නැරඹීම, ගැඹුරු මුහුදේ කිමිදීම, විනෝද ක්‍රීඩා වැනි කටයුතු විදේශික සංචාරකයන් අරමුණුකොට වැඩිදියුණු කළ හැකිය. මෙවැනි ඇතැම් ක්‍රියාකාරකම් සුළු වශයෙන් දැනටමත් හඳුන්වාදී තිබුණ ද, තව දුරටත් වැඩිදියුණු කිරීමට විශාල විභවයක් පවතින අතර නව රැකියා අවස්ථා බිහිකිරීම හා විදේශ විනිමය ඉපැයීම සඳහා ද මෙමගින් ඉඩ සැලසේ.

ධීවර අංශයෙන් ආර්ථිකයට ලැබෙන දායකත්වය වැඩි කිරීම සඳහා පැහැදිලි ප්‍රතිපත්තිමය වෙනසක් අවශ්‍ය වේ. මේ සඳහා යටිතල පහසුකම් සංවර්ධනය, සාගර සම්පත් තක්සේරුව, දේපොළ අයිතිය හා රීති තහවුරු කිරීම, නෛතික රාමුව සැකසීම, පංගු කළමනාකාරිත්ව ක්‍රම හා වෙරළාරක්ෂක බලකායක් පිහිටුවීම ආදිය වැදගත් වේ. ගැඹුරු මුහුදේ සම්පත් නෙළාගැනීම සඳහා යටිතල පහසුකම් නොමැති වීම විශාල බාධකයක් වී ඇත. දිවයිනේ ධීවර වරායන් දොළහක් දැනට ඇති අතර, වරායන් තුනක් ප්‍රතිසංස්කරණය කෙරෙමින් පවතී. මෙයට අමතරව නැංගුරම් පොළවල් 35 ක් හා සුළු ධීවර මධ්‍යස්ථාන 600 ක් ඇත. කෙසේ වෙතත්, සුවිශේෂ ආර්ථික කලාපයේ ධීවර කටයුතු සඳහා යොදාගන්නා ගැඹුරු මුහුදේ යාත්‍රාකරණ විශාල ධීවර යාත්‍රා නැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් පවතිනුයේ මෝදර ධීවර වරායේ පමණි. මෙම ගැටලුවට විසඳුමක් වශයෙන් බහු දින ධීවර යාත්‍රා විශාල ප්‍රමාණයක් සඳහා පහසුකම් සැපයිය හැකි නව ධීවර වරායක් දික්ඕවිට ප්‍රදේශයේ ඉදිකිරීමට සැලසුම්කර ඇත. ශ්‍රී ලංකාවෙන් දකුණු දිශාවට පිහිටි ජාත්‍යන්තර මුහුදට ආසන්නවීම හේතුවෙන් විදේශීය ධීවර යාත්‍රාවලට ද වරායට ප්‍රවේශ වීමට හැකියාව ලැබීම මෙම ව්‍යාපෘතියේ අතිරේක ප්‍රතිලාභයකි.

ආයෝජන ප්‍රමාණය හා තිරසාර උපයෝජන මට්ටම නිර්ණය සඳහා ශ්‍රී ලංකාවේ ධීවර සම්පත් පිළිබඳ තක්සේරුකිරීමක් අවශ්‍ය කෙරේ. අයිස්ලන්ත සංවර්ධන නියෝජිත ආයතනයේ (ICEDA) සහයෝගය ඇතිව ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිත ආයතනය (NARA) අල්ලාගත් මසුන්ගේ දත්තවලට අනුව මත්ස්‍ය තොගය තක්සේරු කිරීම ආරම්භ කර ඇත. එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය තාක්ෂණික සහයෝගිතා වැඩසටහන යටතේ තෝරාගත් මත්ස්‍ය විශේෂ කිහිපයක ප්‍රමාණය තක්සේරු කිරීමට සැලසුම් කර ඇත.

සුවිශේෂ ආර්ථික කලාපයේ උපයෝජනය වර්ධනය සඳහා සමුද්‍රික ධීවර කළමනාකරණය වැඩිදියුණු කිරීම ද වැදගත් වේ. මේ සඳහා නියමිත නීතී රීති සම්පාදනය හා දේපොළ අයිතිය සාක්ෂාත් කිරීම කෙරෙහි අවධානය යොමුවිය යුතුය. දෙන ලද නෛතික රාමුව තුළ උපරිම ප්‍රතිලාභ ලබාගැනීමට පුද්ගලික අංශයේ දායකත්වය ලබාගත හැකිය. මේ සඳහා පංගු කළමනාකරණ ක්‍රමයක් යොදාගැනීම ප්‍රයෝජනවත් විය හැකි අතර එමගින් නියමිත කාලපරාසයක් තුළ කලාපය සඳහා උපරිම තිරසාර මාළු නිෂ්පාදන ප්‍රමාණය තීරණය කළ හැකි වෙයි. මෙය සම්පත් නිශ්චිත ප්‍රමාණයක් නිශ්චිත කලාපයක් තුළ තිරසාර ලෙස නෙලා ගැනීම සඳහා බලපත්‍ර නිකුත් කළ හැකි වන අතරම එක් දින ධීවර බෝට්ටු මගින් කර්මාන්තයේ නියුතු වෙරළ සීමාවේ ධීවරයින්ට ද ධීවර අයිතිය තහවුරු කරන ක්‍රමයක් විය යුතුය.

මසුන් ඇල්ලීම, පසු අස්වනු කළමනාකරණය, ගබඩාකිරීම හා වෙළෙඳාම යන සියල්ල සඳහා නව තාක්ෂණය යොදාගැනීම ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා වැදගත් වේ. අක්වෙරළ හා ගැඹුරු මුහුදේ කෙළවල්ලන් විශේෂ ඇල්ලීම හා ජල ජීවී මත්ස්‍ය නිෂ්පාදනයේ දී ගොඩබෑම හා පසු අස්වනු තාක්ෂණය විශේෂයෙන් වැදගත්වනුයේ ශ්‍රී ලංකාවේ පසු අස්වනු හානිය සියයට 30 ක් පමණ වන බැවිණි. ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයෙන් සුවිශේෂ ප්‍රතිලාභ අත්කරගත හැකි හෙයින් දේශීය, විදේශීය හා හවුල් ආයෝජන දිරිමත් කිරීම අවශ්‍ය වේ. මේ වන විට ධීවර කර්මාන්තයේ ඉහළ විභවයක් මතුවෙමින් පවතින හෙයින්, පෞද්ගලික සමාගම් මෙම කර්මාන්තය කෙරෙහි නිසි අවධානය යොමු කිරීමට මෙය සුදුසු අවස්ථාව වේ.

3. මහද්වීපික බෑවුම හා ආගාධ තැනිතලාව අතර ජලයෙන් යටවූ ප්‍රදේශයේ ඇති අංගයක් වේ. මෙම ලක්ෂණය ලෝකය පුරාම දැකියහැකි අතර මෙය මහද්වීප හා ගැඹුරු මුහුද අතර අවසන් සීමාව සටහන් කරයි.

කර්මාන්ත වැඩි දියුණු කිරීම මෙම ප්‍රතිපත්තිවල අරමුණ වේ. ආහාර භෝග වගා කටයුතුවලට අනුබද්ධ ගැටළු නිරාකරණය කිරීම, අපනයන කෘෂි භෝග, මල් වගාව හා ශාක සම්බන්ධයෙන් මෙම ප්‍රතිපත්තිවල අවධානය යොමුකර ඇත. තවද වැවිලි භෝග, සත්ව හා ධීවර සහ ජල ජීවි සම්පත් කෙරෙහි ද මෙහිදී අවධානය යොමු වේ.

**ආහාර භෝග සාධාරණ මිලකට ජනතාවට ලබාදීම සහ ගොවි ජනතාවගේ ආදායම හා ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා කෘෂි ඵලදායිතාව වැඩිකිරීමට අවශ්‍ය පියවර කිහිපයක් 2007 දී ගෙන ඇත.** මේ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්, ව්‍යාප්ති සේවා, බීජ නිෂ්පාදනය, සහතිකකරණය සහ ශාඛ සංරක්ෂණ වැඩපිළිවෙල 2007 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී. ජෛව තාක්ෂණ උපාංග යොදා ගනිමින් ලවණතාවට ප්‍රතිරෝධය දක්වන වී බෝගයේ පැල මැක්කා සහ බැක්ටීරියා කොළ අංගමාරයට ඔරොත්තු දෙන නව වී ප්‍රභේද දියුණු කරන ලදී. නව ප්‍රභේදවල දොඩම් (වැලෙන්සියා), නාරං, රාජ අල හා කුකුළල ප්‍රභේද දෙකක් හා කුරක්කන් ප්‍රභේදයක් ද නිකුත් කරන ලද අතර, මේවාට කොළ මැලවීමේ රෝගයට ඔරොත්තු දීමේ හැකියාව ඇත.

**2008 අයවැය මගින් දේශීය කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා පියවර කිහිපයක් යෝජනා කරන ලදී.** කිරි ලීටරයක් සඳහා ගෙවන සහතික මිල රුපියල් 30 - 40 දක්වා වැඩි කිරීමට යෝජනා කරන ලදී. මීට අමතරව කිරි ගවයින් ආනයනය කිරීම, පශු සම්පත් සංවර්ධනය හා සුළු හා මධ්‍ය පරිමාණ කිරි නිෂ්පාදන මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා සහනදායි මිලට ණය පහසුකම් සැපයීමට යෝජනා කර ඇත. දේශීය කිරි යොදා ගනිමින් නිෂ්පාදිත කිරි ආශ්‍රිත නිෂ්පාදන 2008 ජනවාරි 1 වෙනිදා සිට එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. උතුරු, උතුරු මැද, මධ්‍යම සහ ඌව පළාත තුළ පශු සම්පත් ගොවිපොළ 50,000 ක් සංවර්ධනය කිරීම සඳහා සහනදායි ණය සැපයීමට අරමුදල් වෙන්කරන ලදී. කිරි ගවයන් ඝාතනය කිරීමට එරෙහිව ඇති නීති රීති තවදුරටත් ශක්තිමත් කරමින් ඒ සඳහා වන දඩය රුපියල් 250 සිට රුපියල් 50,000 දක්වා වැඩි කරන ලදී. ශීත ගබඩා පහසුකම් හා කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන පළාත් වශයෙන් පිහිටුවීම සඳහා රුපියල් දශ ලක්ෂ 100 ක් 2008 අයවැය මගින් වෙන්කර ඇත. පාරිභෝගිකයින් අතර නැවුම් කිරි භාවිතය ජනප්‍රිය කිරීමටත්, පාරිභෝගිකයන්ට පහසුවෙන් කිරි ලබාගැනීමට පහසුකම් සැලසීමටත් කිරි විකිණීමේ වෙළෙඳසැල් කිහිපයක් විවිධ නගරයන්හි පිහිටුවන ලදී.

**2.6 සංඛ්‍යා සටහන**

**පශු සම්පත් අංශය පිළිබඳ සංඛ්‍යා**

| | උප අංශය | 2006(අ) | 2007(ආ) |
|---|---|---|---|
| 1. | ජාතික ගවයන් සංඛ්‍යාව (දශ ලක්ෂ) | 1.5 | 1.5 |
| | එළ ගවයන් | 1.2 | 1.2 |
| | මී ගවයන් | 0.3 | 0.3 |
| 2. | ජාතික කිරි නිෂ්පාදනය (ලීටර් දශ ලක්ෂ) | 196.6 | 202.0 |
| | එළ කිරි | 165.0 | 169.7 |
| | මී කිරි | 31.6 | 32.3 |
| 3. | කිරි ආහාර නිෂ්පාදනය (ලීටර් දශ ලක්ෂ) | 8.6 | 12.1 |
| 4. | නිෂ්පාදන මිල - එළකිරි (රු./ලීටර්) | 21.00 | 21.00 |
| 5. | ජාතික බිත්තර නිෂ්පාදනය | 901.2 | 915.6 |
| 6. | ජාතික කුකුළු මස් නිෂ්පාදනය (මෙ.ටො.දහස්) | 78.8 | 100.1 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
කෘෂිකර්ම සහ පශු සම්පත් අමාත්‍යාංශය

**බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීම හා තාක්ෂණ සහාය ලබා දෙමින් කෘෂි නිෂ්පාදනය දියුණු කිරීම සඳහා 2008 අයවැය මගින් දේශීය කෘෂි නිෂ්පාදනය වැඩි කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත.** කෘෂි නිෂ්පාදනය වැඩි කිරීම හා ආහාර නිෂ්පාදනයේ ස්ථාවර භාවය රැක ගැනීම සඳහා "අපි වවමු-රට නගමු" තුන් අවුරුදු වැඩ පිළිවෙල ආරම්භ කර ඇත. තවද, දේශීය වශයෙන් නිෂ්පාදිත සීනි හා සහල් ආශ්‍රිත නිෂ්පාදිත සඳහා එකතු කළ අගය මත බද්ද 2008 ජනවාරි 1 වෙනිදා සිට අහෝසි කරන ලදී.

**2007 දී පොහොර සහනාධාර ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක විය.** මේ යටතේ වී වගාව සඳහා සියළුම පොහොර වර්ග කිලෝ ග්‍රෑම් 50 මිටියක් රුපියල් 350 කටද තේ, රබර් හා පොල් වගාවන්වල නිරත අක්කර 5 ට වඩා අඩු ඉඩම් හිමියන් සඳහා යූරියා කිලෝ ග්‍රෑම් 50 මිටියක් රුපියල් 1,200/- කට සපයන ලදී. මෙම සහනාධාරය සඳහා 2007 දී රුපියල් දශ ලක්ෂ 11,000 ක් වැය වූ අතර 2008 සඳහා අපේක්ෂිත වියදම රුපියල් දශ ලක්ෂ 15,000 කි. මේ අතර, කාබනික පොහොර භාවිතය ජනප්‍රිය කිරීම සඳහා ද රජය වැඩසටහන් ආරම්භ කර ඇති අතර, 2008 දී කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රවර්ධනය සඳහා රුපියල් දශ ලක්ෂ 500 ක මුදලක් වෙන්කර ඇත. කෙසේ වෙතත්, කෘෂි නිෂ්පාදිත මිල ගණන් ඉහළයාම සැලකිල්ලට ගෙන, වර්තමාන පොහොර සහනාධාර ක්‍රමය මගින් අයවැය කෙරෙහි ඇති පීඩනය අඩුකර ගැනීම සඳහා මෙන්ම විවිධ භෝග අතර පොහොර බෙදීයාම විධිමත් කිරීම සඳහා තාර්කික පොහොර සහනාධාර ක්‍රමයක් සකස් කළ හැකිය.

**දේශීය ඉල්ලුම සහ අපනයන ඉල්ලුම සපුරාලීම සඳහා පළතුරු නිෂ්පාදනය ටොන් දශ ලක්ෂ 1 ක් දක්වා වැඩි කිරීමට රජය අපේක්ෂා කරයි.** පරිසර

හිතකාමී වාණිජ ගොවිපොළ සංවර්ධනය සහ ලාභදායි නිෂ්පාදන හා සැකසීමේ තාක්ෂණය මෙන්ම දැනුවත් කිරීමේ ව්‍යාපෘති මෙම අරමුණ සාක්ෂාත් කරගැනීමේලා උපකාරී වේ. ව්‍යාප්ති සේවය වර්ධනය, පර්යේෂණ හා සංවර්ධන කටයුතු, යටිතල පහසුකම් වැඩි දියුණු කිරිම, පෞද්ගලික අංශයේ ආයකත්වය වැඩි කිරීම, ජාත්‍යන්තර වෙළෙඳ පොළ සඳහා පළතුරු වර්ග හඳුනාගැනීම, ආහාර සුරක්ෂිතතාව වැඩි දියුණු කිරීම, ගුණාත්මක භාවය හා තත්ත්වය පවත්වා ගැනීම, සුදුසු කෘෂිකාර්මික පරිචයන් පිළිපැදීම හා පළතුරු කල් තබා ගන්නා ක්‍රම වැඩි දියුණුකිරීම ආදිය පළතුරු නිෂ්පාදනය වැඩි දියුණු කිරීමේලා උපකාරීවනු ඇත.

**මිරිස්, කව්පි හා ඉරිඟු වැනි අනිකුත් ක්ෂේත්‍ර භෝග වල නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ප්‍රබල විභවයක් පවතී.** අනිකුත් ක්ෂේත්‍ර භෝග වගාවෙන් ගොවියන්ට ඉහළ මූල්‍ය ප්‍රතිලාභ ලැබුණද, වර්තමාන නිෂ්පාදනය හේතු කිහිපයක් නිසා ජාතික ඉල්ලුම සපිරීම සඳහා ප්‍රමාණවත් නැත. අඩු ඵලදායිතාව, නිෂ්පාදන වියදම අධිකවීම, භූමි ඵලදායිතාව පහත වැටීම, සුදුසු ගුණාත්මයෙන් යුත් බීජ නොලැබීම, විසිරුණු වගාවන් හා අසංවිධානය වූ වෙළෙඳ පොළ ක්‍රමය ක්ෂේත්‍ර භෝග අංශය කෙරෙහි බලපාන ප්‍රධාන ගැටළු වේ. අනිකුත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ඉහළ ඵලදාවක් සහිත ප්‍රභේද ප්‍රමාණවත් නොවීම, ගම් මට්ටමට නව තාක්ෂණය ගලා නොයාම, වැසි ජලය මත ඇති දැඩි රැඳියාව, පලිබෝධ හා රෝග පැතිරීම වැඩිවීම, දුර්වල පාංශු කළමනාකාරණය, ප්‍රමාණවත් නොවූ ගොවිපොළ යාන්ත්‍රීකරණය, ගොවිපොළ මට්ටමෙන් යෙදවුම් සැපයීමේ යාන්ත්‍රණය දුර්වලවීම, ගොවි සමාජ ක්‍රියාකාරිත්වය දුර්වලවීම, ගබඩා පහසුකම් මඳවීම, දුර්වල සැකසුම් පහසුකම් හා කෘෂි මූලික කර්මාන්ත සහ අනිකුත් ක්ෂේත්‍ර භෝගවලින් ඉවත් ව වී වගාවට ප්‍රමුඛත්වයක් දීම වැනි බාධක පවතින අතර ඒවා විසඳීමට කටයුතු කළ යුතුව ඇත.

**කෘෂිකර්මාන්ත අංශයේ නිමැවුම් වැඩි කිරීම සහ ඵලදායිතාවය වර්ධනය කර ගැනීම කෙරෙහි දැඩි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.** මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා ඉල්ලුම මත පදනම් වූ පර්යේෂණ සිදු කිරීම සහ ඒ සඳහා ප්‍රමාණවත් සම්පත් සැපයීම, දෙමුහුන් වර්ග භාවිතය වැනි නවීන තාක්ෂණික ක්‍රමවලට යොමුවීම, නිර්දේශිත ප්‍රමාණවලින් පොහොර යෙදීම, වෙළෙඳ පොළට ප්‍රවිශ්‍යවීම ඇතුළු ප්‍රමාණවත් තරම් යටිතල පහසුකම් සැපයීම සහ ව්‍යාප්ති සේවාවන් තව දුරටත් ඉහළ නැංවීම අවශ්‍ය වේ. ගොවියන් දැනුවත් කිරීම සඳහා තාක්ෂණික, ආර්ථික සහ පාරිසරික තොරතුරු සැපයීම අවශ්‍ය වන අතර පසු අස්වනු හානිය මෙන්ම නිසි කලට පෙර අස්වනු නෙලීම අඩු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ද අවශ්‍ය වේ. කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩිවීමත් සමඟ ග්‍රාමීය ජනතාවට රැකියා අවස්ථා සැපයෙන පරිදි කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්ත සංවර්ධනය කිරීම තුළින් ගොවියන් වසර මුළුල්ලේම යම් කාර්යයක නිරතව තැබීමට ද හැකියාව ලැබේ. ගොවියන්ට ඔවුන්ගේ නිෂ්පාදනවලට ස්ථාවර මිලක් ලබාගැනීම සහතික කිරීමට ද මෙය උපකාරී වේ.

## කාර්මික අංශය

**කාර්මික අංශයේ එකතු කළ අගය, පසුගිය වසරේ සියයට 8.1 ක වර්ධනය මත මෙම වසරේ සියයට 7.6 කින් ප්‍රසාරණය විය.** පතල් සහ කැණීම්, කර්මාන්තශාලා නිෂ්පාදන, විදුලිය, ගෑස් සහ ජලය සහ ඉදිකිරීම් යන අංශ හතරෙහිම හිතකර ආයකත්වය මෙම වර්ධනය සාක්ෂාත් කර ගැනීමට හේතු විය. සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට කාර්මික අංශයේ ආයකත්වය සියයට 28.5 ක් දක්වා ආන්තික වශයෙන් ඉහළ ගිය අතර, කර්මාන්ත ශාලා නිෂ්පාදන අංශයේ ආයකත්වය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 17.7 ක් විය.

**කර්මාන්තශාලා නිෂ්පාදන අංශය තුළ මුළු කාර්මික නිමැවුමෙන් සියයට 55 කට වඩා ආයකත්වය සපයන උප කාණ්ඩය ලෙස ගැනෙන, නිමැවුම් කර්මාන්ත අංශය 2006 වර්ෂයේදී වාර්තා වූ සියයට 5.7 ක වර්ධනයට සාපේක්ෂව 2007 දී සියයට 6.7 කින් වර්ධනය විය.** 2007 වර්ෂයේ මෙම වර්ධනය සඳහා කර්මාන්තශාලා නිෂ්පාදන අංශයේ සියළුම උප ප්‍රධාන කාණ්ඩයන් දායක විය. ඒවා අතරට ආහාර පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත; රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත; රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත; ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන් හා සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර හා ප්‍රවාහන උපකරණ අන්තර්ගත වේ. ඉහළ මට්ටමක පැවති ඉන්ධන මිල ගණන්, උතුරු නැගෙනහිර පළාත්වල පැවති අයහපත් ආරක්ෂක තත්ත්වයන් සහ ඇමෙරිකා එක්සත් ජනපද ආර්ථිකයේ සිදු වූ පසුබැසීම මෙන්ම විදේශ වෙළෙඳපොළේ ශීඝ්‍රයෙන් ඉහළ ගිය තරඟකාරීත්වය 2007 වර්ෂයේදී කර්මාන්තශාලා නිෂ්පාදන අංශය මුහුණ දුන් ප්‍රධාන බාධක කිහිපයකි.

**2007 වර්ෂයේදී කර්මාන්තශාලා නිමැවුම, දේශීය මෙන්ම විදේශීය වෙළෙඳපොළ කටයුතු මගින් මෙහෙය විය.** පෞද්ගලික අංශය, කර්මාන්තශාලා නිමැවුමට සියයට 96 කට වඩා වැඩි ආයකත්වයක් සැපයූ අතර, මෙම අංශය වර්ධනය කිරීමට ආයෝජන මණ්ඩලයට අයත් මෙන්ම ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්ත ද දායක විය.

**2.7 සංඛ්‍යා සටහන**

**කර්මාන්තයන්හි එකතු කළ අගය (2002 ස්ථාවර මිල අනුව)**

| | කාණ්ඩය | රු. දශ ලක්ෂ | | ප්‍රතිශත වෙනස(%) | |
|---|---|---|---|---|---|
| | | 2006 | 2007(අ) | 2006 | 2007 (අ) |
| 1 | ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 155,842 | 165,242 | 5.8 | 6.0 |
| 2 | රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 78,870 | 85,402 | 4.0 | 8.3 |
| 3 | දැව හා දැව නිෂ්පාදිත | 1,026 | 1,109 | 4.2 | 8.1 |
| 4 | කඩදාසි නිෂ්පාදිත, ප්‍රකාශනය කිරීම හා මුද්‍රණය කිරීම. | 1,385 | 1,533 | 6.5 | 10.7 |
| 5 | රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 51,714 | 55,247 | 8.0 | 6.8 |
| 6 | ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 13,687 | 14,445 | 10.9 | 5.5 |
| 7 | මූලික ලෝහ නිෂ්පාදිත | 906 | 930 | 2.4 | 2.6 |
| 8 | සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 28,378 | 29,911 | 4.3 | 5.4 |
| 9 | කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 1,564 | 1,792 | 7.5 | 14.6 |
| | **එකතුව** | **333,372** | **355,611** | **5.7** | **6.7** |

(අ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


**අපනයන ඉලක්ක කරගත් කර්මාන්ත, මුළු අපනයන ආදායමින් සියයට 75 කට වඩා දායකත්වය සැපයූ අතර, නිදහස් වෙළෙඳ ගිවිසුම් සහ විශේෂයෙන්ම යුරෝපීය සංගමය විසින් ප්‍රදානය කරන ලද වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (GSP+) යටතේ ලැබුණු ප්‍රතිලාභ හරහා ඉහළ වර්ධනයක් පෙන්වීය.** අපනයන ඉලක්ක කරගත් ඇඟළුම් නිෂ්පාදිත; ටයර් හා අත්වැසුම් වලින් සමන්විත රබර් ආශ්‍රිත නිෂ්පාදිත; මැණික් හා ස්වර්ණාභරණ; විද්‍යුත් උපකරණ; පිඟන් භාණ්ඩ සහ දියමන්ති නිෂ්පාදිත අපනයන අංශය තුළ මනා ප්‍රගතියක් පෙන්නුම් කරන ලද කාණ්ඩ අතර විය. කලාපීය වෙළෙඳ ගිවිසුම් සහ වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය යටතේ පුළුල් වූ වෙළෙඳපොළ ප්‍රවේශය, වෙළෙඳ සහයෝගීතාවය, රජය සහ ප්‍රධාන කර්මාන්තකරුවන් විසින් වෙළෙඳපොළ ප්‍රසාරණය කිරීම සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන්, භාණ්ඩවල ගුණාත්මක භාවය වැඩි කිරීම සහ වෙළෙඳ නාම ප්‍රවර්ධන වැඩසටහන් යනාදි පියවර අපනයන ඉලක්ක කරගත් කර්මාන්ත වර්ධනයට බෙහෙවින් දායක විය.

**2007 වර්ෂයේදී දේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් කර්මාන්තවල ඉහළ ක්‍රියාකාරීත්වය සඳහා රජයේ ප්‍රාදේශීය කාර්මීකරණ වැඩසටහන් සහ රජය විසින් අරඹන ලද අනෙකුත් වැඩසටහන් වලින් මනා සහායක් ලැබුණි.** තීරුබදු සහ අනෙකුත් බදු, වැනි බදු වෙනුවෙන් ලබාදුන් සහන, ප්‍රාදේශීය කාර්මීකරණය සඳහා සෘජු ප්‍රතිලාභ සළසමින් මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතීන් ක්‍රියාවට නැංවීම සහ අක්‍රියව පැවති කර්මාන්ත යළි නගා සිටුවීම යනාදිය රජය විසින් ගනු ලැබූ ක්‍රියා මාර්ග අතර විය. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ, විශේෂයෙන් නිවාස සහ සාප්පු සංකීර්ණවල පුළුල් වීම ද දේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් කර්මාන්තවල වර්ධනයට උපකාරී විය. 2007 වර්ෂයේදී දේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් කර්මාන්ත ප්‍රධාන වශයෙන් මෙහෙයවනු ලැබුවේ ආහාර සහ පාන වර්ග, සිමෙන්ති, ගොඩනැගිලි ද්‍රව්‍ය, පිඟන් නිෂ්පාදිත, ගෘහභාණ්ඩ සහ අනෙකුත් දැව ආශ්‍රිත නිෂ්පාදිත, මුද්‍රණ හා ඇසුරුම් නිෂ්පාදිත වලිනි.

**අපනයන ඉලක්ක කරගත් කර්මාන්ත අංශයේ ප්‍රධාන උප අංශය වන රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත රටේ මුළු අපනයන ආදායමින් සියයට 43 ක දායකත්වයක් සැපයූ අතර එය 2006 වර්ෂයේදී වාර්තාගත වූ සියයට 4.0 ක වර්ධනය සමග සසඳන විට 2007 වර්ෂයේදී සියයට 8.3 කින් වර්ධනය විය.** යුරෝපා සංගමය විසින් ප්‍රදානය කරන ලද වෙළෙඳ වරණයන් පිළිබඳව පොදු ක්‍රමය යටතේ පිරිනමන ලද තීරුබදු සහන මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් උපකාරී විය. ඒ අතරම, දේශීය ඇඟළුම් නිෂ්පාදකයින් විසින් e-fit වැනි ඉහළ තාක්ෂණය සහිත විශේෂිත මෘදුකාංගයන් භාවිතා කිරීම, ඇඟළුම් කර්මාන්තයේ නවෝත්පාදන අතර ප්‍රමුඛස්ථානය ගනී. ඇඟළුම් කර්මාන්තය විසින් සියළුම අවශ්‍යතා එකම මධස්ථානයකින් සපුරාගැනීමට හැකි පූර්ණ වශයෙන් ඒකාබද්ධ වූ සේවාවක් ඇති කිරීමට අවශ්‍ය නොයෙකුත් ක්‍රියාමාර්ග ගනු ලැබීය. ඇඟළුම් කර්මාන්තයේ ක්‍රියාත්මක කරන ලද මූලික වැඩසටහනක් වූ "පිළිගත් ප්‍රමිතීන් යටතේ නිමැවූ ඇඟළුම්" යටතේ ළමා ශ්‍රමය සහ බල කිරීමෙන් ශ්‍රමය ලබා නොගැනීම වැනි සදාචාරාත්මක පුරුදු අනුගමනය කරමින් භාණ්ඩ නිපදවීමෙන් තිරසාර සංවර්ධනය කෙරෙහි අවධානය යොමුකරන ලදී. දැනුම මත පදනම්ව නවීකරණය වන කර්මාන්තයක් ලෙස, ඇඟළුම් කර්මාන්තය, වැඩමුළු, සම්මන්ත්‍රණ සහ

**2.3 රූප සටහන**

**කර්මාන්තයන්හි එකතු කළ අගය-2007 (2002 ස්ථාවර මිල අනුව)**



අනෙකුත් පුහුණු වැඩසටහන් හරහා තම සේවකයින් දැනුවත් කිරීම තුළින් පරිණත සේවා සපයන්නෙකුගේ තත්ත්වයට පරිවර්තනය වෙමින් පවතී. ඇඟළුම් කර්මාන්තය සමාජ වගකීමෙන් යුතු, ව්‍යාපාර පුරුදු දිරිමත් කරන ගෝලීය සාධාරණ වෙළෙඳ ව්‍යාපාරය සමග සබඳතා ස්ථාපනය කර ගන්නා ලදී. මෙම ව්‍යාපාරය ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය තුළ ප්‍රචලිත වීමත් සමග බොහෝ පාරිභෝගිකයින් ආචාරශීලී වෙළෙඳපොළ පුරුදු පිළිබඳව දැනුවත් වීම වර්ධනය වෙමින් පවතී.

**ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තයෙහි ප්‍රමුඛයන් ලෝක ප්‍රචලිත වෙළෙඳ නාමයන් යටතේ අන්තර්ජාතික වෙළෙඳපොළට නිෂ්පාදිතයන් අඛණ්ඩව සැපයූ අතර, මෙම නිෂ්පාදකයන් නවෝත්පන්න නිෂ්පාදන සැපයුම්කරුවන් ලෙස හඳුනා ගෙන ඇත.** රෙදිපිළි සම්බන්ධ වන දේශීය සැපයුම් ජාලයේ වර්ධනයත් සමග, ඇඟළුම් කර්මාන්තය තුළ ඇතිවන ඇනවුම් සම්පූර්ණ කිරීමේදී සිදුවන පමාව අවම කිරීම, පිරිවැය ඉතුරුම්කරණය, සේවා නියුක්ති වර්ධනය කිරීම සහ ආයෝජන පුළුල් කිරීම හරහා ප්‍රතිලාභ අපේක්ෂා කරයි. මීට පෙර තුල්හිරිය රෙදි කම්හල ලෙස හැඳින්වූ MAS රෙදිපිළි උද්‍යානය පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් නැවත ආරම්භ කිරීමත් සමග අනුයාත නිෂ්පාදිත සැපයීම තුළින් ඇඟළුම් කර්මාන්තයේ පසුපස ඒකාබද්ධවීම් ශක්තිමත් කරන ලදී. හරිත නිෂ්පාදිත වැඩසටහන් යටතේ බලශක්තිය අඩු කිරීම හා ජල පරිභෝජනය අවම කිරීමට සහ කසල කළමනාකරණ වැඩසටහන් පිළිබඳව ඇඟළුම් කර්මාන්තය විසින් අවධානය යොමුකරන ලද අතර විදේශ ආයෝජන ද ආකර්ශනය කර ගන්නා ලදී. ගෝලීය උණුසුම ඉහළයාම සැලකිල්ලට ගනිමින්, ප්‍රධාන නිෂ්පාදකයින් විසින් කාබන් නිදහස් කිරීම අවම කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. පරිසර දූෂණය අවම කිරීමට පිරිසිදුකාරක නිෂ්පාදන තාක්ෂණයන් සහ නාස්තිය කළමනාකරණය කිරීමේ ක්‍රමෝපායන් හඳුන්වා දෙන ලදී.

**2007 වර්ෂයේදී ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත කාණ්ඩය දේශීය හා අපනයන වෙළෙඳපොළ වර්ධනයන්ගෙන් ලද ප්‍රතිලාභ තුළින් සියයට 6.0 ක වර්ධනයක් වාර්තා කරන ලදී.** 2007 වර්ෂයේදී මෙම කාණ්ඩයේ වර්ධනය ප්‍රධාන වශයෙන් මෙහෙයවනු ලැබුවේ විස්කෝතු ඇතුළු සැකසූ ආහාර සහ පාන වර්ග; අයිස්ක්‍රීම්, බේකරි නිෂ්පාදිතයන්, සකස් කරන ලද පලතුරු සහ එළවළු; ටින් කළ පොල් ආශ්‍රිත නිෂ්පාදිතයන්, වනස්පති තෙල්, මෘදු බීම වර්ග සහ පානීය ජල නිෂ්පාදිත මගිනි. 2007 වර්ෂයේදී ආහාර-පාන සැකසුම් කර්මාන්තයේ ප්‍රමුඛයන් විසින් ඉහළ ගිය ඉල්ලුම සපුරාලීම සඳහා තම ආයෝජන ධාරිතාව පුළුල් කරන ලදී.

**සියළුම උප කාණ්ඩවල සිදුවූ සතුටුදායක ක්‍රියාකාරිත්වය නිසා රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත කාණ්ඩය 2007 දී සියයට 6.8 කින් වර්ධනය විය.** රබර් ආශ්‍රිත නිෂ්පාදිත කර්මාන්තයේ ප්‍රමුඛයන් විසින් දේශීය හා අන්තර්ජාතික වෙළෙඳපොළ අරමුණු කොට වානේ පටියක් සහිත රේඩියල් ටයර් ඇතුළු විවිධ නිෂ්පාදන හඳුන්වාදීම සහ ප්‍රවර්ධන කටයුතු සිදු කරන ලදී. වෙළෙඳ ගිවිසුම් තුළින් පුළුල් වූ අපනයන වෙළෙඳපොළ අවස්ථා ඉලක්ක කොට ගනිමින්, ටයර් කර්මාන්තයේ නවකයින් බිහිවිය. දේශීය හා විදේශීය වෙළෙඳපොළ තුල ඉහළ ගිය කාර්මික හා ඖෂධීය අත්වැසුම් සඳහා වූ ඉල්ලුම හරහා, 2007 වර්ෂයේදී රබර් අත්වැසුම් නිෂ්පාදකයන් ද ඉහළ ප්‍රතිලාභ අත්කර ගත්තේ ය. දේශීය වෙළෙඳපොළ ඉල්ලුම වැඩිවීම සහ අන්තර්ජාතික වෙළෙඳපොළ ප්‍රසාරණයවීමේ ප්‍රතිඵලයක් ලෙස ප්ලාස්ටික් සහ පී.වී.සී. කර්මාන්තයේද ඉහළ ක්‍රියාකාරීත්වයක් වාර්තා විය.

**පෞද්ගලික අංශයේ ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල ඉහළ යාම සහ රජයේ මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාවට නැංවීම හේතුවෙන් ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදිතයේ නිමැවුම 2007 දී සියයට 5.5 කින් වර්ධනය විය.** ප්‍රධාන සිමෙන්ති නිෂ්පාදකයන් විසින් විවිධ භාවිතයන් සඳහා විශේෂිත නිෂ්පාදිත පෙළක් හඳුන්වාදෙන ලද අතර, ඉහළ යන ඉල්ලුමට මුහුණදීම සඳහා නව යන්ත්‍රෝපකරණ සවිකිරීම තුළින් නිෂ්පාදන ධාරිතාව සාර්ථකව හසුරුවන ලදී. විශේෂයෙන්ම ඉන්දියාව සහ චීනය වැනි රටවල ප්‍රසාරණය වූ ඉදිකිරීම් කර්මාන්තය තුළින් පැන නැගුණු ගෝලීය ඉල්ලුමෙහි වර්ධනය වීම නිසා, වසරේ දෙවන අර්ධයේ දී දේශීය නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය වල හිඟය හේතුකොට ගෙන, දේශීය වෙළෙඳපොළේ ඉල්ලුම ප්‍රමාණවත් ලෙස සපුරාලීමට නොහැකි විය. විදේශ වෙළෙඳපොළ ඉලක්ක කරමින් ක්‍රියාත්මක වන දියමන්ති ආශ්‍රිත කර්මාන්තයේ ඉහළ ක්‍රියාකාරිත්වය සඳහා රජයේ සහයෝගය නොකඩවා ලැබුණු අතර ඒ අනුව ප්‍රදානය කරන ලද එකතු කළ අගය මත පනවන ලද බදු කපාහැරීම සහ අදාළ ආයතන විසින් සංවිධානය කළ ප්‍රවර්ධන වැඩසටහන් වලින් මෙම කර්මාන්තය ශක්තිමත් විය. පිඟන් සහ කෑම මේස උපකරණ කර්මාන්තය, විශේෂයෙන්ම, නව විලාසිතා පිළිබඳ දැනුවත් පාරිභෝගිකයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා නව නිෂ්පාදන හා මෝස්තර හඳුන්වා දෙන ලද අතර හෝටල් සහ නවාතැන්හල් වැනි ව්‍යාපාර අරමුණු කරගත් නිෂ්පාදන සඳහා

විශේෂිත වෙළෙඳ නාම යටතේ මෝස්තර හඳුන්වාදෙන ලදි. මේ අතරතුර, ඉහළ බලශක්ති පරිභෝජනයක් සහිත සිමෙන්ති, වීදුරු සහ පිඟන් භාණ්ඩ කර්මාන්තය අඛණ්ඩව වැඩිවන ඉන්ධන හා බලශක්ති පිරිවැය තුළින් පීඩාවට පත්විය.

**අපනයන සහ දේශීය වෙළෙඳපොළවල ක්‍රියාකාරීත්වයේ ඉහළ යාම පෙන්නුම් කරමින් සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ කාණ්ඩය, 2006 වර්ෂයේදී පැවති සියයට 4.3 ක වර්ධනයට සාපේක්ෂව 2007 වසරේදී සියයට 5.4 කින් වර්ධනය විය.** මෙම අංශයේ ප්‍රසාරණය සඳහා බෝට්ටු නිෂ්පාදනය සහ අළුත්වැඩියාව, යතුරුපැදි හා ත්‍රීරෝද රථ එකලස් කිරීම, වතුර පොම්ප ඇතුළු කෘෂිකාර්මික උපකරණ, විද්‍යුත් උපකරණ, මුළුතැන්ගෙයි උපකරණ සහ වානේ ගෘහ භාණ්ඩ උපකාරී විය. වයර්, කේබල්, ඇළුමිනියම් නිෂ්පාදිත සහ විදුලි බුබුළු නිෂ්පාදන කර්මාන්තයේ වර්ධනය, ඉදිකිරීම් අංශයේ සහ විදේශ ඉල්ලුමේ වර්ධනය තුළින් මෙහෙයවනු ලැබීය. බෝට්ටු නිෂ්පාදනය සහ අළුත්වැඩියා කර්මාන්තයේ නියුතු ප්‍රධාන නිෂ්පාදකයන් තම ආයෝජන ඉහළ නැංවූ අතර ගුණාත්මක සේවාවන් සපයමින් සහ අධි තාක්ෂණික නෞකා නිපදවමින් කලාපීය සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළට ප්‍රවේශ විය.

**රාජ්‍ය අංශයේ කර්මාන්තයන්ගේ නිමවුම සියයට 14.1 කින් පහළ ගිය අතර, එයට ප්‍රධානතම හේතුව වූයේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෙල් පිරිපහදු කිරීමේ කටයුතුවල ඇති වූ මන්දගාමීත්වයයි.** රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුමෙන් සියයට 90 කටත් වඩා දායක වන ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිමැවුම බොර තෙල් ආනයනය පහත වැටීම හේතුකොටගෙන සියයට 14.4 කින් පහළ ගියේය.

**ඉහළ යන අමු ද්‍රව්‍ය පිරිවැය, තෙල් මිල සහ වැටුප් පිරිවැය හේතු කොටගෙන නිෂ්පාදන පිරිවැය ඉහළ යන ප්‍රවණතාවයක් පෙන්වීම කර්මාන්තශාලා නිෂ්පාදන අංශයේ ලාභ අනුපාතයට අහිතකර ලෙස බල පෑවේය.** 2007 දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන ලද කාර්මික සමීක්ෂණයට අනුව ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්තශාලා 515 ක මුළු නිෂ්පාදන පිරිවැයෙන්, කම්හලෙන් පිටවන නිෂ්පාදනයේ වටිනාකම ලෙස ඇස්තමේන්තු කළ නිෂ්පාදන කර්මාන්තශාලා අංශයේ, ලාභ අනුපාතය, 2006 දී වාර්තා වූ සියයට 2.1 ක වර්ධනයට සාපේක්ෂව 2007 දී සියයට 1.4 කින් වර්ධනය විය. දේශීය ඉල්ලුමේ ඇති වූ ප්‍රසාරණය සහ නිෂ්පාදකයන් විසින් අනුගමනය කළ කාර්යක්ෂම මිල නියම කිරීමේ ප්‍රතිපත්තීන්, 2007 දී කර්මාන්තවල ලාභදායිත්වය වර්ධනය වීමට හේතු විය. ශ්‍රම ඵලදායිතාවය ඉහළ යාම, නව තාක්ෂණ ක්‍රම හඳුන්වාදීම සහ ඉහළ කළමනාකරණ භාවිතයන්, බලශක්තිය කාර්යක්ෂමතාවයෙන් යුතුව උපයෝජනය කිරීම සහ අපතේ යාම අවම කිරීම, පාඩු ලබන ඒකක වසා දැමීම සහ භාණ්ඩ විවිධාංගිකරණය ආදිය නිෂ්පාදන පිරිවැය අඩුකර ලීමට උපකාරී විය.

**කර්මාන්තශාලා නිෂ්පාදන අංශයේ වැටුප් පිරිවැය මුළු නිෂ්පාදන පිරිවැයේ ප්‍රතිශතයක් ලෙස, 2006 දී වාර්තා කළ, සියයට 2.4 ක වර්ධනයට සාපේක්ෂව 2007 වර්ෂයේදී සියයට 1.6 කින් වර්ධනය විය.** මුළු නිෂ්පාදන පිරිවැයෙන් අමු ද්‍රව්‍ය, ඉන්ධන සහ පොලී සඳහා වැයවන ප්‍රමාණය ඉහළයාම නිසා වැටුප් සඳහා වැයවන ප්‍රමාණය අඩු විය. කෙසේ වුවත්, 2007 වර්ෂයේදී ඉහළ ඉන්ධන මිල ගණන් හේතු කොටගෙන ඉන්ධන සහ ප්‍රවාහන දීමනාවල ඉහළ යාමක් සිදු විය. සමස්ථ වැටුප් පිරිවැය

**2.8 සංඛ්‍යා සටහන**

**ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිමැවුම් ලාභ අනුපාතික(අ)**

| | කාණ්ඩය | මුළු නිෂ්පාදන පිරිවැය (රු. දශ ලක්ෂ) | | මුළු නිෂ්පාදන වටිනාකම (රු. දශ ලක්ෂ) | | කම්හල් ලාභ අනුපාත (ප්‍රතිශතය) | |
|---|---|---|---|---|---|---|---|
| | | 2006(ආ) | 2007(ඇ) | 2006(ආ) | 2007(ඇ) | 2006(ආ) | 2007(ඇ) |
| 1 | ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 94,864 | 106,351 | 111,298 | 125,117 | 14.8 | 15.0 |
| 2 | රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 24,353 | 27,035 | 27,865 | 31,022 | 12.6 | 12.9 |
| 3 | දැව හා දැව නිෂ්පාදිත | 1,887 | 2,014 | 2,140 | 2,287 | 11.8 | 11.9 |
| 4 | කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත | 5,950 | 6,597 | 6,794 | 7,526 | 12.4 | 12.3 |
| 5 | රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 43,161 | 51,040 | 51,130 | 60,581 | 15.6 | 15.7 |
| 6 | ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 26,012 | 30,391 | 30,743 | 35,892 | 15.4 | 15.3 |
| 7 | මූලික ලෝහ නිෂ්පාදිත | 2,968 | 3,308 | 3,452 | 3,844 | 14.0 | 13.9 |
| 8 | සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 16,003 | 19,195 | 18,548 | 22,331 | 13.7 | 14.0 |
| 9 | කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 3,711 | 4,107 | 4,202 | 4,663 | 11.7 | 11.9 |
| | **එකතුව** | **218,909** | **250,038** | **256,172** | **293,263** | **14.5** | **14.7** |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ ආයතන 515 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**2.9 සංඛ්‍යා සටහන**

**ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල දේශීය පිරිවැය ව්‍යුහය(අ)**
**(මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස)**

| | කාණ්ඩය | බලය සහ ඉන්ධන | | වැටුප් | | අමුද්‍රව්‍ය | | පොලිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2006 | 2007 | 2006 | 2007 | 2006 | 2007 | 2006 | 2007 |
| 1 | ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 3.4 | 3.7 | 10.1 | 10.3 | 39.7 | 39.8 | 1.3 | 1.5 |
| 2 | රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 4.5 | 4.9 | 15.2 | 15.3 | 13.1 | 13.2 | 2.3 | 2.6 |
| 3 | දැව හා දැව නිෂ්පාදිත | 9.1 | 9.5 | 16.1 | 16.2 | 33.2 | 33.0 | 4.1 | 4.4 |
| 4 | කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත | 4.1 | 4.4 | 13.2 | 13.1 | 19.5 | 19.6 | 3.4 | 3.6 |
| 5 | රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 6.4 | 6.9 | 13. 3 | 13.5 | 30.4 | 30.7 | 3.5 | 3.8 |
| 6 | ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 19.9 | 20.7 | 14.9 | 15.0 | 29.2 | 29.4 | 3.2 | 3.6 |
| 7 | මූලික ලෝහ නිෂ්පාදිත | 9.9 | 10.2 | 11.3 | 11.2 | 35.9 | 36.0 | 2.5 | 2.6 |
| 8 | සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 5.0 | 5.4 | 12.2 | 12.4 | 26.9 | 27.0 | 4.0 | 4.3 |
| 9 | කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 5.2 | 5.5 | 12.0 | 12.1 | 34.6 | 34.5 | 1.4 | 1.6 |
| | **එකතුව** | **6.3** | **6.7** | **12.3** | **12.5** | **32.1** | **32.8** | **2.3** | **2.6** |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ ආයතන 515 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අඩුකරලීම පිණිස බොහෝ නිෂ්පාදන ආයතන විසින් ශ්‍රම ඵලදායිතාව වර්ධනය කිරීම, නව තාක්ෂණයන් හඳුන්වාදීම, ඉහළ පිරිවැයක් සහිත නිෂ්පාදන ඒකකයන් බාහිර ආයතනයන්ට පවරා දීම මෙන්ම කාර්ය සාධනය මත පදනම් වූ වැටුප් වර්ධක ක්‍රමයක් හඳුන්වාදීම සහ අතිකාල දීමනා අඩුකර ගැනීම ද සිදු කරන ලදී. මුළු නිෂ්පාදන පිරිවැයෙහි බල ශක්තිය, අමුද්‍රව්‍ය සහ පොලී සඳහා වූ පිරිවැය පිළිවෙලින් සියයට 6.3 ක්, 2.2 ක් සහ 13.0 ක් ලෙස වර්ධනය විය.

**කර්මාන්ත අංශයේ වර්ධනය මෙන්ම ප්‍රාදේශීය කාර්මීකරණය නැංවීම උදෙසා රජය විසින් පියවර කිහිපයක් ගනු ලැබීය.** නැගෙනහිර පළාතේ ආයෝජන දිරි ගැන්වීමේ අරමුණින් "නැගෙනහිර උදානය" වැඩසටහන යටතේ යන්ත්‍ර-සූත්‍ර ආනයන, එකතුකළ අගය මත බදු වලින් නිදහස් කරන ලදී. රජය විසින්

**2.10 සංඛ්‍යා සටහන**

**ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල ශ්‍රම ඵලදයීතා දර්ශකය(අ)**

1995=100

| | කාණ්ඩය | 2006 | 2007 | වෙනස (%) |
|---|---|---|---|---|
| 1 | ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 135.8 | 139.2 | 2.5 |
| 2 | රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 117.3 | 121.9 | 3.9 |
| 3 | දැව හා දැව නිෂ්පාදිත | 105.5 | 108.3 | 2.7 |
| 4 | කඩදාසි සහ කඩදාසි නිෂ්පාදිත | 106.3 | 108.9 | 2.4 |
| 5 | රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 144.8 | 150.2 | 3.7 |
| 6 | ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 117.4 | 120.2 | 2.4 |
| 7 | මූලික ලෝහ නිෂ්පාදිත | 105.3 | 107.5 | 2.1 |
| 8 | සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 127.5 | 131.7 | 3.3 |
| 9 | කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 113.7 | 117.0 | 2.9 |
| | **එකතුව** | **123.5** | **127.9** | **3.6** |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ ආයතන 515 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ක්‍රියාවට නංවන ලද විශාලතම ප්‍රාදේශීය කාර්මීකරණ වැඩසටහන වන "නිපයුම් ශ්‍රී ලංකා" සඳහා තවදුරටත් බදු විරාම, තීරු බදු සහ එකතු කළ අගය මත වන බදු වලින් නිදහස් කිරීම් ලබා දුන් අතර, කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලින් බැහැරව කර්මාන්ත පිහිටුවීම හා නැවත ස්ථානගත කිරීම සඳහා අමතර ප්‍රතිලාභ සලසන ලදී. ප්‍රාදේශීය කාර්මීකරණය ප්‍රවර්ධනය උදෙසා කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලින් බැහැරව ආයෝජන ප්‍රතිස්ථාපනය සහ ඇරඹීම සඳහා ලබාදී ඇති කාල සීමාව 2009 මාර්තු මස අවසන තෙක් දීර්ඝ කරන ලදී. මෙම වැඩසටහන යටතේ, 2007 වසරේදී නව කර්මාන්ත 41 ක් ස්ථාපනය කිරීම, අඩපණව තිබූ කර්මාන්ත 14 ක් නැවත පන ගැන්වීම සහ තවත් කර්මාන්ත 4 ක් පුළුල් කිරීම සිදුකරන ලද අතර, කර්මාන්ත 3 ක් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලින් බැහැරව නැවත ස්ථානගත කිරීම සඳහා ද අනුමැතිය ලබා දී ඇත.

**2008 අයවැය මගින් රෙදිපිළි, ඇඟළුම්, ගොඩනැගිලි ද්‍රව්‍ය, පිඟන් භාණ්ඩ සහ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයන්ගේ අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදී.** නවීකරණය කිරීමේ ක්‍රියාවලියට සහය දෙමින් කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත පිහිටුවා ඇති ඇඟළුම් කර්මාන්තශාලා වලට උපරිමය දශ ලක්ෂ 15 කට යටත්ව සියයට 10 පොලී අනුපාතිකයක් යටතේ සහනදායි ණය ප්‍රදානය කළේය. දේශීය රෙදිපිළි කර්මාන්තය දිරි ගැන්වීමේ අරමුණින් කි.ග්‍රෑ. 1 කට රු. 50/- ක සෙස් බද්දක් ආනයනික රෙදිපිළි මත පැනවූ අතර, දේශීය රෙදිපිළි නිෂ්පාදිත වල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා ආනයනික නූල්, වැට් බද්දෙන් නිදහස් කරන ලදී.

**කර්මාන්ත අංශය සඳහා ප්‍රතිපත්ති සම්පාදන ආයතනය වන කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය, කර්මාන්ත අංශයේ කාර්ය සාධනය වර්ධනය කිරීම සඳහා පියවර රාශියක් ගෙන ඇත.** කර්මාන්ත

සංවර්ධන අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ ජාතික විද්‍යා පදනමේ සහයෝගයෙන් විදුලි සහ ඉලෙක්ට්‍රොනික්, මෝටර් රථ, රබර් සහ ස්වර්ණාභරණ කර්මාන්තයන්හි නිෂ්පාදන නවතාවයකින් යුතුව ජාත්‍යන්තර වෙළෙඳපොළට ඉදිරිපත් කරනු වස්, වේගවත් ආකෘති නිපදවීමේ යන්ත්‍ර සහ බහු ස්ථර මුද්‍රණ පරිපථ නිෂ්පාදන අංශයක් සඳහා විශේෂ ව්‍යාපෘතියක් මොරටුව විශ්ව විද්‍යාලයේ අරඹන ලදී. කම්හල් කර්මාන්ත 300 වැඩසටහන් යටතේ තවදුරටත් කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් "ගමට කර්මාන්ත" ව්‍යාපෘතියට සහයෝගය ලබාදෙමින් සිටී. මෙම වැඩසටහන් යටතේ නැගෙනහිර පළාතේ ආයෝජන සඳහා සහනාධාර ලැබීම සඳහා අවස්ථාව ලබාදෙමින් අවම ආයෝජන වටිනාකම සහ සේවක සංඛ්‍යා අවශ්‍යතාවයන් ලිහිල් කරන ලදී. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය සහ ඵලදායිතාවය ඉහළ නැංවීමට ආරම්භ කර ඇති වැඩසටහන් මගින් කර්මාන්ත වල නිෂ්පාදිතය සහ තරඟකාරීත්වය ඉහළ නැංවීමට උපකාරී විය. 2015 වන විට සීනි පරිභෝජන අවශ්‍යතාවයෙන් සියයට 50 ක් දේශීයව සපුරාලීමේ අදහසින්, රජය විසින් සීනි නිෂ්පාදනය ඉහළ නැංවීමට පියවර කිහිපයක් ගනු ලැබීය. මේවා අතර රාජ්‍ය-පෞද්ගලික සහභාගිත්වය යටතේ හිඟුරාන සීනි කම්හල විවෘත කිරීම, කන්තලේ සීනි කම්හලේ නැවත නිෂ්පාදන ආරම්භ කිරීම සහ බිබිල හා මොණරාගල ප්‍රදේශවල නව සීනි කම්හල් විවෘත කිරීම ආදිය වේ.

**රටේ සීඝ්‍ර කාර්මීකරණය ශක්තිමත් කිරීම සඳහා අනිකුත් අධිකාරීන් සහ ආයතනවල සහාය ද නොමදව ලැබුණි.** ව්‍යවසායකත්ව සංවර්ධන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන, ආයෝජකයන් සඳහා පහසුකම් සැලසීමේ කේන්ද්‍රස්ථානය වන ආයෝජන මණ්ඩලය විසින් දේශීය හා විදේශීය ආයෝජකයන් දිරිමත් කිරීම සඳහා එක් දින සේවා සැපයීමේ විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කළ අතර, එ මගින් සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කරන ලද අතර, විද්‍යුත් දත්ත හුවමාරු ක්‍රමය මගින් අපනයන හා සම්බන්ධ ක්‍රියා පිළිවෙත පහසු කරවන ලදී. සියලු පාර්ශවයන්ට වාසි සැලසෙන ලෙස ආයෝජන දිරි ගැන්වීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් පකිස්තානු ආයෝජන මණ්ඩලය සහ චීන ආයෝජන ප්‍රවර්ධන ආයතනය සමග අවබෝධතා ගිවිසුම්වලට අත්සන් කරන ලදී. නැගෙනහිර පළාත සංවර්ධනය කිරීම ඉලක්ක කර ගනිමින් "නැගෙනහිර නවෝදය" වැනි දිරි ගැන්වීමේ වැඩසටහන් ආයෝජන මණ්ඩලය විසින් හඳුන්වා දී ඇත. ආයෝජකයන් සඳහා විශිෂ්ට සේවාවක් සැපයීම සඳහා රාජ්‍ය-පෞද්ගලික ව්‍යාපෘතියක් ලෙස ඇඟළුම් කර්මාන්තය සඳහා විශේෂ ආර්ථික කලාප ඇති කිරීම සහ පවත්නා කලාපවල යටිතල පහසුකම් දියුණු කිරීම වැනි පියවර ගන්නා ලදී. ගුණාත්මක බවින් පිරි රබර් ආශ්‍රිත නිෂ්පාදන අපනයන වෙළෙඳපොළට යොමු කිරීම සඳහා, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ සහාය ඇතිව සුළු පරිමාණ රබර් නිෂ්පාදකයන් සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාවට නංවන ලදී. 2007 වසරේ ඇඟළුම් ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා *ඇඟළුම් කර්මාන්ත ඒකාබද්ධ සංගමය* (JAFF) ගනු ලැබූ පියවර අතර, ඵලදායිතා වර්ධනය සහ කුසලතා සංවර්ධනය, දේශීය හා ජාත්‍යන්තර ප්‍රතිරූපය ගොඩ නැගීම, නිෂ්පාදිත හා වෙළෙඳපොළ සංවර්ධනය, පසුපස ඒකාබද්ධ වීම් සඳහා ආයෝජන ප්‍රවර්ධනය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සංවර්ධනය ආදිය වේ.

**ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය සහ රැකියා නිර්මාණය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ වැදගත්කම සලකමින් රජය විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා පියවර කිහිපයක් ගන්නා ලදී.** සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා සහාය දැක්වීමේ ප්‍රධාන අරමුණ වූයේ නිෂ්පාදනය හා ව්‍යාපාර අවස්ථා ඉහළ නංවමින් ප්‍රාදේශීය මට්ටමින් රැකියා අවස්ථා නිර්මාණය කිරීමය. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා සපයන පහසුකම් ඉහළ නංවමින්, 1981 අංක 43 දරන කුඩා කර්මාන්ත පනත ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මණ්ඩල පනත ලෙස 2007 දී සංශෝධනය කරන ලදී. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් පළාත්වල අපනයනාභිමුඛ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ප්‍රවර්ධනය සඳහා වෙළෙඳපොළ පුළුල් කිරීම, කුසලතා සංවර්ධනය සහ පුහුණු වැඩසටහන් වැනි වැඩසටහන් කිහිපයක්ම ක්‍රියාවට නංවන ලදී. අදාළ අමාත්‍යාංශයන්, ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව සහ වෙළෙඳ මණ්ඩලය ද, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සංවර්ධනය සඳහා වූ රජයේ වැඩපිළිවෙලට අනුව කටයුතු කරන ලදී. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට සහාය දැක්වීම සඳහා කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය කාර්මික උද්‍යාන ඇති කිරීමට ද පියවර ගන්නා ලදී.

**2007 වසරේදී ආහාර හා ඉන්ධන මිල ගණන් ඉහළයාම වැනි බාහිර සාධක මෙන්ම රට අභ්‍යන්තරයේ පැවති නොසන්සුන් වාතාවරණය, කර්මාන්ත අංශයේ වර්ධනය කෙරෙහි බලපෑම් ඇති කරන ලදී.** දේශීය ඉන්ධන මිල ගණන් විදේශ වෙළෙඳපොළේ මිල ගණන් හා සමගාමීව ඉහළ යන ලදී. කර්මාන්තවල තම පිරිවැය ව්‍යුහය තුළ, ඉන්ධන, වැදගත්ම උපාංගය වන බැවින් මිල ගණන් ඉහළ යාම එම කර්මාන්තවල ලාභාංශයට මෙන්ම ආයෝජන ධාරිතාවයට ද බලපෑම් ඇති කෙරිණි. ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තය, අන්තර්ජාතික වෙළෙඳපොළ තුළ දැඩි තරඟයකට මුහුණ පා සිටින අතර, විශේෂයෙන්ම ඇමෙරිකානු එක්සත් ජනපදය තුළ මෙම තත්ත්වය මනාව පෙන්නුම් කරයි. චීනය හා

වියට්නාමය යන රටවලින් ඇති විය හැකි අභියෝගයන්ට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාව විසින් තම පිරිවැය අවම කිරීමේ උපාය මාර්ග හඳුන්වාදීම මෙන්ම වෙළෙඳාමට උපකාරි වන සේවාවන් වන තොරතුරු, ඇසුරුම්කරණය, අලෙවිකරණය, ප්‍රවාහනය මෙන්ම මූල්‍ය සේවාවන් සැපයීම වඩාත් කාර්යක්ෂම කළ යුතු ව ඇත. වෙළෙඳ වරණයක් පිළිබඳ පොදු ක්‍රමය යටතේ ඇති සහනයන් තුළින් විවර වන වෙළෙඳපොළ පිවිසුම තව දුරටත් පවත්වාගෙන යාම සඳහා මානව හා කම්කරු අයිතීන් මෙන්ම පාරිසරික ප්‍රමිතීන් ද උසස් ලෙස පවත්වාගෙන යා යුතු වේ. සාපේක්ෂ වශයෙන් පහළ මිල ගණන් යටතේ සිදුකරන ආනයනික නිෂ්පාදනයන් සමග ඇඩි තරගකාරීත්වයකට මුහුණ පෑමට දේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් කර්මාන්ත වලට සිදු වී ඇති අතර උතුරු නැගෙනහිර ප්‍රදේශයේ පවතින ගැටුම්කාරී තත්ත්වය නිසා මෙම කර්මාන්තවල ක්‍රමානුකූල සැපයුම් ජාලයක් පවත්වාගෙන යාමේ දුෂ්කරතා මෙන්ම අලෙවිකරණ කටයුතු සිදු කිරීමේ දුෂ්කරතාවයන්ද පැන නැගී ඇත. නිපුණ ශ්‍රමයේ හීනතාවය, පහළ තරගකාරීත්වය හා ඵලදායිතාවය, බලපත්‍ර සහ ණය පහසුකම් ලබා ගැනීමේදී දීර්ඝ ක්‍රියා පටිපාටීන් අනුගමනය කිරීමට සිදුවීම, සපේක්ෂව ව්‍යාපාරවල පවතින ඉහළ ගනුදෙනු පිරිවැය, ඉහළ පොලී අනුපාතිකයන් සහ සංකීර්ණ වූ බදු ක්‍රමයන් කර්මාන්ත අංශය විසින් මුහුණ පෑ ප්‍රධාන බාධක වේ.

**වැවිලි භෝග සැකසුම් උප අංශය, ප්‍රධාන වශයෙන් රබර් සහ පොල් නිෂ්පාදනයේ වැඩිවීම** හේතුකොට ගෙන පසුගිය වසරේ සියයට 0.8 ක වර්ධනය හා සැසඳීමේදී 2007 වර්ෂය තුළදී සියයට 2.4 ක වර්ධනයක් වාර්තා කළේය.

**ගෘහ කර්මාන්ත උප අංශය, 2006 වසරේ සියයට 5.7 ක වර්ධනයට අනුරූපව සියයට 5.6 කින් ප්‍රසාරණය විය.** ඉදිකිරීම් අංශයේ ඉල්ලුම වැඩිවීමත් සමග දැව කර්මාන්තය, කළුගල් නිෂ්පාදනය සහ කුඩා පරිමාණයේ ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදන ක්‍රියාකාරකම්හි ප්‍රසාරණය, මෙම උප අංශයේ වර්ධනය සඳහා උපකාරී විය. කුඩා පරිමාණයේ ඇඟළුම් සහ ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය ද වර්ෂය තුළදී වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත් 2007 වර්ෂය තුළදී වී නිෂ්පාදනයේ සංකෝචනයත් සමග සහල් සැකසුම් ක්‍රියාකාරකම්හි පහත වැටීම මගින් ගෘහ කර්මාන්ත උප අංශයේ සමස්ත වර්ධනය යම් තරමකට වැළකුණි.

**2006 වර්ෂයේ සියයට 14.8 ක ඉහළ වර්ධනය මත විදුලිය, ගෑස් සහ ජලය අංශය මෙම වසරේ සියයට 4.6 ක වර්ධනයක් වාර්තා කළේය.** පසුගිය වසරේ සියයට 16.2 ක ඉහළ වර්ධනය හා සැසඳීමේදී 2007 වසරේදී විදුලිය උප අංශයේ එකතු කළ අගයේ වර්ධනය සියයට 4.6 ක් විය. අඩු වියදම් ජල විදුලිබල උත්පාදනය සියයට 15 කින් පහත වැටීම, විදුලිය උප අංශයේ මන්දගාමීත්වයට දායක විය. ජලාධාර ප්‍රදේශවල අයහපත් කාලගුණික තත්වයන් හේතුකොට ගෙන සමස්ත විදුලි උත්පාදනයට ජල විදුලි උත්පාදනයේ දායකත්වය, පසුගිය වසරේ සියයට 49.4 ක අගයට සාපේක්ෂව සියයට 40.3 දක්වා අඩුවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත බලශක්ති ඉල්ලුම සපුරාලීමට තාප විදුලි උත්පාදනයේ දායකත්වය සියයට 59.7 දක්වා වර්ධනය විය. ගෘහස්ත, වෙළඳ සහ කාර්මික අංශ ඇතුළු සියළු පාරිභෝගික කණ්ඩායම් මගින් විදුලිය සඳහා ඉල්ලුමේ වැඩිවීම පැනනැගිණි. වර්ෂය තුළදී ගෑස් උප අංශයේ එකතු කළ අගය සියයට 2.9 කින් වර්ධනය වූ අතර, නල ජලය සැපයීම සඳහා නව ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක වීමත් සමග ජලය උප අංශයේ එකතු කළ අගය සියයට 7.1 කින් වර්ධනය විය.

**2006 වර්ෂයේදී සියයට 24.2 ක ඉහළ වර්ධන අනුපාතයක් වාර්තා කළ පතල් සහ කැණීම් අංශය සියයට 19.2 කින් තවදුරටත් වර්ධනය විය.** මැණික් පතල් උප අංශයේ එකතු කළ අගය සියයට 13.0 කින් වර්ධනය වූ අතර, මැණික් අපනයන පරිමාවේ ඉහළයාම සියයට 5.3 ක් විය. මිනිරන්, ඉල්මනයිට් සහ අනෙකුත් පතල් නිෂ්පාදන අපනයනයන්හි වර්ධනය පිළිබිඹු කරමින්, පසුගිය වසරේ සියයට 30.6 ක ඉහළ වර්ධනය මත අනෙකුත් පතල් ක්‍රියාකාරකම් හි වර්ධනයද සියයට 21.9 ක අනුපාතයකින් තවදුරටත් පැවතුනි. ඉදිකිරීම් අංශයෙන් උත්පාදනය වූ ඉල්ලුමේ වැඩිවීම, කැණීම් උප අංශයේ වර්ධනය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළේය.

**රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි ධනාත්මක දායකත්වයන් සමග පසුගිය වසරේ සියයට 9.2 කින් වර්ධනය වූ ඉදිකිරීම් අංශයේ ප්‍රසාරණය 2007 වර්ෂය තුළදී සියයට 9.0 ක සාපේක්ෂ ඉහළ අනුපාතයකින් තවදුරටත් පැවතිණි.** විශේෂයෙන්ම, දකුණු අධිවේගී මාර්ගය සහ කොළඹ වටරවුම් අධිවේගී මාර්ගය වැනි මහා මාර්ග ජාලය ප්‍රසාරණය කිරීමේ ව්‍යාපෘති ඇතුළත් යටිතල පහසුකම් සංවර්ධන යෝජනා ක්‍රම කෙරෙහි රාජ්‍ය අංශයේ ඉදිකිරීම් කටයුතු බොහෝදුරට යොමුවිය. විදුලිබල උත්පාදන ධාරිතාව ප්‍රසාරණය කිරීමේ ව්‍යාපෘති සංවර්ධනය කිරීම්ද, 2007 වර්ෂයේදී දක්නට ලැබිණි. විශේෂයෙන්ම, නැගෙනහිර පළාත නිදහස් කරගැනීමත් සමග, නැවත ගොඩනැගීමේ ක්‍රියාකාරකම්ද ඉදිකිරීම් අංශයේ වර්ධනය සඳහා දායක විය. සුඛෝපභෝගී මහල් නිවාස, නිවාස ව්‍යාපෘති සහ බැංකු අංශයේ ණය හා අත්තිකාරම් මගින් පිළිබිඹු වන අනෙකුත් වෙළඳ හා නේවාසික ගොඩනැගිලි කටයුතුවල දිගටම පවත්නා ප්‍රසාරණය පෞද්ගලික අංශයේ දායකත්වය ප්‍රකට කළේය. වර්ෂය තුළදී දේශීයව නිපද වූ සහ ආනයනික ගොඩනැගිලි ද්‍රව්‍ය

භාවිතය මගින් මෙම අංශයේ වර්ධනය තවදුරටත් පිළිබිඹු විය. වර්ෂයේ දෙවන භාගයේ සුළු කාලයක් තුළ සිමෙන්ති සැපයීමේ හිඟයක් පැවති නමුත් වාර්ෂික සිමෙන්ති පරිභෝජනය, 2006 වර්ෂයට වඩා සියයට 10.7 කින් වර්ධනය විය. 2007 වර්ෂය තුළදී සාමාන්‍ය මිල මට්ටම්හි වැඩිවීමත් සමග, ඉදිකිරීම්, පුහුණු කිරීම් සහ සංවර්ධන ආයතනය (ICTAD) මගින් ප්‍රකාශ කරනු ලබන මිල දර්ශකයට අනුව ගොඩනැගිලි ද්‍රව්‍යයන්හි සමස්ත මිල මට්ටමද සියයට 11.4 කින් වැඩි විය.

### සේවා අංශය

**මෙම වසර තුළදී සේවා අංශය සමස්ත ආර්ථික වර්ධනයට සියයට 62 ක දායකත්වයක් සපයමින් තවදුරටත් ආර්ථික ප්‍රසාරණයෙහි මූලිකත්වය ගෙන ක්‍රියා කළේය.** මේ අතර ද.දේ.නි. සඳහා සේවා අංශයෙහි දායකත්වය 2006 වසරෙහි වූ මට්ටමෙහි ම නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවත්, පසුගිය වසර තුළ වූ සියයට 7.7 ක වර්ධන ක්‍රියාකාරීත්වයෙහි මන්දගාමීත්වයක් පෙන්නුම් කරමින්, මෙම වසර තුළදී සේවා අංශය සියයට 7.1 ක වර්ධන අනුපාතිකයක් වාර්තා කළේය. මේ සඳහා අයහපත් ආරක්ෂක තත්ත්වය හමුවේ හෝටල් සහ ආපනශාලා අංශයෙහි වූ පසුබෑම සහ ආනයන වෙළඳාම් සහ දේශිය වෙළඳාම් කටයුතුවල වූ මන්දගාමීත්වය හේතුවිය.

**ආනයන, අපනයන සහ දේශීය වෙළඳ කටයුතු අයත් වන තොග සහ සිල්ලර වෙළඳාම් අංශය, මෙම වසර තුළදී සියයට 6.1 කින් වර්ධනය විය.** ආනයන වෙළඳ උප අංශයෙහි එකතු කළ අගයේ වර්ධනය පසුගිය වසරෙහි වූ සියයට 6.8 හා සැසඳීමේදී 2007 වසර තුළ සියයට 3.3 ක් විය. මෙම උප අංශයෙහි වර්ධන ගාමකත්වය, මූලිකවම පරිමා අනුව සියයට 16.7 ක ඉහළ වර්ධනයක් වාර්තා කළ ආයෝජන භාණ්ඩ ආනයනයන් මගින් සපයන ලදී. තවද, විශේෂයෙන්ම ගොඩනැගිලි ද්‍රව්‍ය, යන්ත්‍ර-සූත්‍ර සහ උපකරණ ආනයන පරිමාවන්හි වූ ඉහළ වර්ධනය සමග සමස්ත ආයෝජන භාණ්ඩ ආනයනයන්හි වූ ඉහළයෑම අනාගත වර්ධන අපේක්ෂාවන් සඳහා සුභ නිමිත්තක් වනු ඇත. අන්තර් භාණ්ඩ ආනයන, බොරතෙල් ආනයනයන්හි වූ පහත වැටීමත් සමග සියයට 0.8 ක ආන්තික වර්ධනයක් වාර්තා කළේය. මේ අතර පාරිභෝගික භාණ්ඩ ආනයනයන්හි වූ සියයට 4.9 ක සංකෝචනය, ආනයන වෙළඳ කටයුතු සඳහා අහිතකර ලෙස බලපෑවේය. තිරිඟු පිටි සහ සීනි වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනයන් වටිනාකම අනුව සියයට 26 කට වඩා පහළ වැටුණු අතර, වී නිෂ්පාදනය අඩුවීමත් සමග දේශීය වෙළඳපොලෙහි වූ මිල ඉහළයෑම් වැළැක්වීමේ ප්‍රයත්නයන් හේතුවෙන් හාල් ආනයනය ඉහළ ගියේය. තවද, ඇඩි මූල්‍ය ප්‍රතිපත්තීන්ගේ බලපෑම පිළිබිඹු කරමින්, දිගුකාලීන පරිභෝජන භාණ්ඩ ආනයනය පහත වැටුණි.

**බොහොමයක් උප අංශයන්හි ප්‍රගමනය හේතුවෙන් අපනයන වෙළඳ උප අංශය 2007 වර්ෂය තුළදී සියයට 8.8 කින් පුළුල් විය.** අපනයන වෙළඳාම සඳහා විශාලම දායකත්වයක් දක්වනු ලබන කාර්මික අපනයනයන් පරිමා අනුව සියයට 8.4 කින් වර්ධනය විය. මේ සඳහා යුරෝපීය සංගම් කලාපයෙහි වූ වාසිදායක තීරුබදු ක්‍රමය මගින් තවදුරටත් ප්‍රතිලාභ ලබන රෙදිපිළි සහ ඇඟළුම් අපනයනයන්හි සියයට 6.8 ක පරිමා වර්ධනය දායක විය. ආහාර, පාන වර්ග, දුම්කොළ සහ රබර් ආශ්‍රිත නිෂ්පාදනයන්ගේ ඉහළ දායකත්වය සමග අනෙකුත් කාර්මික අපනයනයන්ද සියයට 11.8 කින් ප්‍රසාරණය විය. දේශීය නිෂ්පාදනය ඉහළයාමත් සමග රබර්, පොල් සහ අනෙකුත් කෘෂිකාර්මික අපනයනයන්හි වූ දායකත්වය ඉහළ යෑම හේතුවෙන් කෘෂිකාර්මික අපනයනයන් සියයට 2.9 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය. නිෂ්පාදනය පහළ වැටීම හේතුවෙන් තේ අපනයන පරිමාවන් අඩු වූ නමුදු ඉහළ ජාත්‍යන්තර මිල ගණන් හේතුවෙන් විදේශීය ඉපැයීම් ඉහළ ගියේය.

**මෙම වසරෙහි කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදන ඉහළයාමත් සමග දේශීය වෙළඳ උප අංශය 2006 වසරෙහි වූ සියයට 8.9 ක වර්ධනය හා සැසඳීමේදී සියයට 7.6 ක වර්ධනයක් වාර්තා කළේය.** පොල් සහ මත්ස්‍ය නිෂ්පාදනය මෙන්ම, එළවළු සහ අතුරු ආහාර බෝග වැනි අනෙකුත් කෘෂිකාර්මික භාණ්ඩ නිෂ්පාදනයන් ඉහළයාම මෙම අංශයෙහි එකතු කළ අගය මත හිතකර බලපෑමක් ඇති කළ නමුදු, වී නිෂ්පාදනය පහත වැටීම මෙම උප අංශයෙහි වර්ධනය සීමාකිරීමට හේතුවිය. තවද, ඉහළ දේශීය ඉල්ලුම හමුවේ ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනයන් මෙන්ම, සිමෙන්ති සහ අනෙකුත් ගොඩනැගිලි අමුද්‍රව්‍ය වැනි දේශීය වෙළඳපොලාභිමුඛ කාර්මික නිෂ්පාදනයන් ඉහළයාමද, දේශිය වෙළඳාම පුළුල්වීම සඳහා හිතකර සාධකයන් විය.

**සියයට 2.3 කින් සංකෝචනය වූ හෝටල් සහ ආපනශාලා අංශයට 2007 වසර සුභදායක වසරක් නොවීය.** සංචාරක කර්මාන්තය කෙරෙහි අහිතකර බලපෑම් එල්ල කරනු ලබන ආරක්ෂක තත්ත්වයන් හමුවේ යථාතත්ත්වයට පත්වීමට වෙර දරන මෙම අංශයට සංචාරකයන්ගේ පැමිණීම සියයට 11.7 කින් පහළ වැටුණු මෙම වසර අභියෝගාත්මක වසරක් විය. බටහිර යුරෝපීය සහ ආසියානු කලාපීය සංචාරක පැමිණීම් පිළිවෙලින් සියයට 14.9 කින් සහ සියයට 16.4 කින් මෙම වසර තුළ අඩුවිය. කෙසේ වුවත්, මෙම අංශය මෙම වසර තුළදී දේශීය සංචාරක කර්මාන්තය

දියුණු කිරීම සඳහා සක්‍රියව කටයුතු කිරීමත් සමග දේශීය සංචාරකයන් හෝටල්වල ගත කළ රාත්‍රී ගණන සියයට 30 කින් ඉහළයාම, විදේශීය සංචාරකයින්ගේ පහත වැටීම මගින් සිදු වූ බලපෑම් යම් තරමක සමනය කිරීමට ඉවහල් විය. නමුත්, සමස්ත සංචාරකයන් හෝටල්වල ගත කළ රාත්‍රී ගණනට සියයට 70 ක දායකත්වයක් සපයනු ලබන විදේශිය සංචාරකයන් හෝටල් වල ගත කළ රාත්‍රී ගණන සියයට 11.3 කින් පහළ වැටුණි.

**ප්‍රවාහනය හා සන්නිවේදන අංශයෙහි එකතු කළ අගය 2006 වසරෙහි වූ සියයට 12.6 ක වැඩිවීම හා සැසඳීමේදී මෙම වසර තුළදී සියයට 10.5 කින් වර්ධනය විය.** මෙම අංශය, සේවා අංශයෙහි ඉහළම ආංශික වර්ධනය වාර්තා කළ අතර, මේ සඳහා තැපැල් හා විදුලිසංදේශ, භාණ්ඩ මෙහෙයවීම වරාය සහ ගුවන් සේවා සහ ප්‍රවාහනය යන උප අංශ තුනෙහිම හිතකර ක්‍රියාකාරීත්වය හේතුවිය. මගී සහ භාණ්ඩ ප්‍රවාහනය යන දෙඅංශයම අයත් වන ප්‍රවාහන උප අංශය, පසුගිය වසරෙහි වූ සියයට 11.2 ක වර්ධනය හා සැසඳීමේදී සියයට 9.4 ක වර්ධනයක් වාර්තා කළේය. මෙම ප්‍රසාරණය පොකුරු බස් සේවා සමාගම් සහ ශ්‍රී ලංකා දුම්රිය සේවය ධාවනය කළ මගී කිලෝ මීටර් සංඛ්‍යාවේ ඉහළයාම මගින්ද පිළිබිඹු විය. දේශිය නිෂ්පාදන සහ ජාත්‍යන්තර වෙළඳ කටයුතුවල ඉහළයාමත් සමග භාණ්ඩ ප්‍රවාහන කටයුතුවල සිදු වූ දියුණුව පිළිබිඹු කරමින්, භාණ්ඩ ප්‍රවාහනය මධ්‍යස්ථ වර්ධනයක් දැක්වීය. ගුවන් සේවා උප අංශය තුළ ශ්‍රී ලන්කන් ගුවන් සමාගම පියාසර කළ සමස්ත මගී කිලෝ මීටර් ප්‍රමාණය මෙම වසර තුළදී සියයට 5.2 කින් ඉහළ ගියේය. මේ අතර 2006 වසර තුළ සිදු වූ පසුබෑමෙන් යථා තත්ත්වයට පත් වූ, දේශීය ගුවන් සේවා සමාගම් මගින් ක්‍රියාත්මක කරන ලද මගී කිලෝමීටර් සංඛ්‍යාවේ ඉහළයාමක් දැක්විණ.

**2003 වසරේ සිට සියයට 20 ක වාර්ෂික වර්ධන අනුපාතයක් අභිබවා යමින්, මෑතකාලයේදී ඉහළ වර්ධනයක් අත්දකින ලද තැපැල් සහ විදුලි සංදේශ උප අංශය, 2007 වසර තුළදීද තවදුරටත් සියයට 21.5 කින් ප්‍රසාරණය විය.** සංකේත විභේදුම් බහුවිධ ප්‍රවේශ (CDMA) සම්බන්ධතාද ඇතුළත්ව ස්ථාවර දුරකථන ග්‍රාහක මට්ටම 2007 වසර තුළදී දශ ලක්ෂ 2.7 ක් ඉක්මවා යමින් සියයට 45 කට වඩා වැඩි වර්ධනයක් වාර්තා කළේය. පසුගිය වසර තුන තුළ සියයට 50 කට වඩා වැඩි වර්ධන ගාමකත්වයක් වාර්තා කළ ජංගම දුරකථන ග්‍රාහක මට්ටම මෙම සේවාව සඳහා පැවති ඉහළ ඉල්ලුම යම් ප්‍රමාණයකට සපුරා ඇති බව පෙන්නුම් කරමින්, මෙම වසර තුළදී සියයට 47.5 කින් වර්ධනය විය. තවද, 2007 වසර අවසානය වනවිට ජංගම දුරකථන ග්‍රාහක මට්ටම දශ ලක්ෂ 8 ක පමණ අගයක පැවතුණි. අන්තර්ජාල සහ විද්‍යුත් තැපැල් භාවිතය සියයට 55.7 කින් වර්ධනය වූ නමුත්, මෙම සේවාව තවමත් ජංගම දුරකථන භාවිතය වැනි අනෙකුත් සන්නිවේදන සේවා වැනි ඉහළ මට්ටමක් කරා ළඟා වී නොමැත.

**භාණ්ඩ මෙහෙයවීම, වරාය සහ ගුවන් සේවා උප අංශය පසුගිය වසරේ වූ සියයට 20.0 ක වර්ධනය හමුවේ මෙම වසර තුළදී සියයට 8.8 කින් ප්‍රසාරණය විය.** මෙම අඩුවීම සඳහා ධාරිතා සීමාවන් හේතුවෙන් කොළඹ වරාය මගින් මෙහෙයවනු ලැබූ අන්තර් නැව් භාණ්ඩ පරිමාවන් අඩු වේගයෙන් වර්ධනය වීම මූලිකවම හේතුවිය. මෙම වසර තුළදී සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් (SAGT) සමාගමද ඇතුළුව කොළඹ වරාය මගින් මෙහෙයවනු ලැබූ භාණ්ඩ පරිමාව අඩි විස්සේ සමාන බහාලුම් ඒකක දශ ලක්ෂ 3.38 ක් වූ අතර, මෙය සියයට 9.8 ක වර්ධනයකි. මෙය කොළඹ වරාය මගින් මෙහෙයවනු ලැබූ ඉහළම අඩි විස්සේ සමාන බහාලුම් ඒකක ප්‍රමාණයයි. මෙහෙයවනු ලබන මුළු බහාලුම් ප්‍රමාණයෙන් තුනෙන් දෙකක් පමණ වන අන්තර් නැව් භාණ්ඩ පරිමාව 2006 වසරේ වූ සියයට 36.6 ක වර්ධනය මත සියයට 9.7 කින් පුළුල් විය. තවද, ගුවන් සේවා අංශයේ වූ සාපේක්ෂ අඩු වර්ධනය පිළිබිඹු කරමින්, ගුවන් මගින් මෙහෙයවනු ලැබූ භාණ්ඩ පරිමා සියයට 5.0 කින් වර්ධනය විය.

**බැංකු, රක්ෂණ සහ දේපළ වෙළඳාම් අංශය එකතු කළ අගය අනුව සියයට 8.7 කින් වර්ධනය විය.** ඉහළ සහ විචලනය වන පොළී අනුපාතයන් පැවති වාතාවරණයක් තුළ අත්තිකාරම් මත වූ පොළී ආදායම් සහ සුරැකුම්පත් මත ආයෝජනයන් ඉහළයාමත් සමග බැංකු අංශයේ ආදායම් මෙම වසර තුළදී ඉහළ ගියේය. මේ අතර සුරැකුම්පත් සහ විදේශීය වෙළෙඳපොළ කටයුතු හේතුවෙන් වාණිජ බැංකුවල පොළී නොවන ආදායම්ද මෙම වසර තුළ ඉහළ ගියේය. තවද, රක්ෂණ සේවාවන්හි වූ මනා ක්‍රියාකාරීත්වයද මෙම අංශයෙහි එකතු කළ අගය කෙරෙහි යහපත් බලපෑමක් ඇති කළේය. එමෙන්ම, දේපළ වෙළඳාම් අංශය මෙම වසර තුළදී තවදුරටත් ප්‍රසාරණය වූ නමුදු, එහි ක්‍රියාකාරීත්වය යම් තරමක මන්දගාමීත්වයක් පෙන්නුම් කළේය.

**රාජ්‍ය අංශයෙහි සේවාවන් පසුගිය වසරෙහි වූ සියයට 5.0 ක වර්ධනය මත මෙම වසර තුළදී සියයට 6.0 කින් වර්ධනය විය.** මෙම අංශයෙහි වර්ධනය සඳහා හමුදා සේවයෙහි වූ පුළුල්වීම සහ රාජ්‍ය සේවයට නව සේවකයින් බඳවාගැනීම හේතුවිය.

**පෞද්ගලික සේවා අංශය 2006 වසරෙහි වූ සියයට 7.8 ක වර්ධන ගාමකත්වය මෙම වසර තුළදී ද රඳවා ගැනීමට සමත් විය.** පෞද්ගලික, සෞඛ්‍ය, අධ්‍යාපන සහ අනෙකුත් සේවාවන්හි මනා ක්‍රියාකාරිත්වය මේ සඳහා දායක විය.

## 2.3 වියදම

**දළ දේශීය වියදම මගින් දේශීය ආර්ථික කටයුතු වලින් ජනනය කරනු ලබන සමස්ත ඉල්ලුම මණිනු ලැබේ.** එබැවින්, දළ දේශීය වියදම යනු පෞද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයේම මුළු පරිභෝජනය සහ ආයෝජන වියදම ලෙසද ප්‍රකාශ කළ හැකිය. 2007 වසර තුළදී පවත්නා මිල අනුව රුපියල් බිලියන 3,946 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇති දළ දේශීය වියදම (සමස්ත දේශීය ඉල්ලුම) 2006 වසර තුළ වූ සියයට 22.1 ක වර්ධනය හා සැසඳීමේදී 2007 වසර තුළ වූ සියයට 21.0 ක වර්ධනය සුළු පහළවැටීමක් පෙන්නුම් කළේය. මෙම වර්ධනය, ආර්ථිකයේ පුළුල්වීම සහ සාමාන්‍ය මිල මට්ටම ඉහළයාම යන දෙකෙහිම ප්‍රතිඵලයකි. 2006 වසරෙහි සියයට 8.6 ක අගය හා සැසඳීමේදී 2007 වසර තුළදී සියයට 5.8 ක් වූ දේශීය ඉල්ලුමෙහි මූර්ත වර්ධන අනුපාතිකයෙහි පහළවැටීම වඩා තියුණුව පෙන්නුම් කරයි. තවද, මෙය ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ඉහළ යන මිල පීඩනයට මුහුණදීම සඳහා දියත් කරන ලද ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්තීන්වල ප්‍රතිඵලයකි. පරිභෝජන සහ ආයෝජන යන දෙඅංශයෙහිම වියදම් ඉහළ ගියමුත්, ආයෝජන වියදම, පරිභෝජන වියදම හා සැසඳීමේදී මූර්ත වශයෙන් සියයට 8.7 අගයක වැඩි වේගයකින් වර්ධනය විය. දළ දේශිය වියදම සහ ශුද්ධ භාණ්ඩ හා සේවා ආනයනයන්හි එකතුව වන වෙළඳපොල මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය සියයට 21.8 ක වර්ධනයත් සමග නාමිකව රුපියල් බිලියන 3,578 ක් විය.

### පරිභෝජනය

**පුද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයෙහිම පරිභෝජන වියදම 2007 වසර සඳහා රුපියල් බිලියන 2,950 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.** එබැවින්, පරිභෝජන වියදම පසුගිය වසරේ සියයට 21.2 ක වර්ධනයේ සිට 2007 වසර තුළදී තවදුරටත් සියයට 20.9 ක ආන්තිකව අඩු වේගයකින් වර්ධනය විය. මෙම ඉහළයෑම මූර්ත පරිභෝජන වියදම සියයට 4.9 ක ප්‍රමාණයකින් ප්‍රසාරණය වීම සහ සමස්ත මිල මට්ටම සියයට 15.3 ක ප්‍රමාණයකින් ඉහළයෑමෙන්ද සමන්විත විය. ඉහළ යන ඒක පුද්ගල ආදායම, රැකියා අවස්ථාවන් පුළුල්වීම සහ විදේශීය සංක්‍රාම ඉහළයෑම, කුටුම්භ අංශයෙහි පරිභෝජනය වර්ධනය වීම සඳහා ඉවහල් වූ අතර, ලාභදායීත්වය ඉහළයෑම ආයතනික අංශයෙහි පරිභෝජනය පුළුල්වීමට දායක විය. පෞද්ගලික පරිභෝජන වියදම පසුගිය වසරෙහි මෙන්ම සමස්ත පරිභෝජන වියදම සඳහා සියයට 81.5 ක දායකත්වයක් දැක්වූ අතර, රාජ්‍ය පරිභෝජනය සියයට 18.5 ක දායකත්වයක් දරන ලදී.

**2.11 සංඛ්‍යා සටහන** — **සමස්ත ඉල්ලුම**

රුපියල් දශ ලක්ෂ

| අයිතමය | පවත්නා වෙළෙඳ මිල අනුව | | | 2002 ස්ථාවර මිල අනුව | | |
|---|---|---|---|---|---|---|
| | 2005 | 2006 | 2007(අ) | 2005 | 2006 | 2007(අ) |
| 1. දේශීය ඉල්ලුම | | | | | | |
| පරිභෝජනය | 2,013,802 | 2,439,816 | 2,949,712 | 1,592,251 | 1,704,633 | 1,787,650 |
| (% වෙනස) | 15.3 | 21.2 | 20.9 | 3.3 | 7.1 | 4.9 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 658,019 | 822,216 | 996,700 | 514,984 | 583,970 | 634,669 |
| (% වෙනස) | 24.6 | 25.0 | 21.2 | 9.3 | 13.4 | 8.7 |
| **මුළු දේශීය ඉල්ලුම** | **2,671,821** | **3,262,032** | **3,946,412** | **2,107,235** | **2,288,603** | **2,422,319** |
| **(% වෙනස)** | **17.4** | **22.1** | **21.0** | **4.7** | **8.6** | **5.8** |
| 2. බාහිර ඉල්ලුම | | | | | | |
| භාණ්ඩ සහ සේවා අපනයන | 793,153 | 885,381 | 1,046,075 | 678,356 | 704,408 | 751,959 |
| (% වෙනස) | 7.4 | 11.6 | 18.1 | 6.6 | 3.8 | 6.8 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 1,012,192 | 1,208,757 | 1,414,100 | 843,919 | 902,463 | 941,891 |
| (% වෙනස) | 9.6 | 19.4 | 17.0 | 2.7 | 6.9 | 4.4 |
| **ශුද්ධ බාහිර ඉල්ලුම** | **-219,039** | **-323,376** | **-368,026** | **-165,564** | **-198,055** | **-189,932** |
| **3. මුළු ඉල්ලුම** | **2,452,782** | **2,938,656** | **3,578,386** | **1,941,671** | **2,090,548** | **2,232,387** |
| **(% වෙනස)** | **17.3** | **19.8** | **21.8** | **6.2** | **7.7** | **6.8** |

(අ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**2007 වසර තුළදී ආහාර, පාන වර්ග සහ දුම්කොළ මගින් පෞද්ගලික පරිභෝජන වියදම සඳහා වූ දායකත්වය, 2006 වසරේ වූ සියයට 41.2 හි සිට සියයට 39.7 ක් දක්වා පහළ ගියේය.** 2002 වසරෙහි සිට ඉහළ යන ආදායම් මට්ටම සමග මෙම කාණ්ඩයෙහි වියදම මුළු වියදමෙහි ප්‍රතිශතයක් ලෙස ක්‍රමයෙන් අඩු වූ නමුදු, 2006 වසර තුළදී මෙම උපනතියෙහි වෙනසක් සිදුවී ඇත. මෙය ආහාර ද්‍රව්‍යවල මිල මට්ටම් ඉහළයෑම කෙරෙහි ආරෝපනය කළ හැකිය. තවද, ආහාර ද්‍රව්‍ය සඳහා වූ ස්ථාවර ඉල්ලුම හමුවේ ආදායම් මට්ටම ඉහළ යාම සමස්ත පරිභෝජනය තුළ ආහාර, පාන වර්ග සහ දුම්කොළවල දායකත්වය 2007 දී අඩුවීමට හේතු වි ඇත. මේ සමග සැසඳීමේදී රෙදිපිළි සහ පාවහන් සඳහා වූ නාමික වියදම සියයට 25.9 ක වැඩි වේගයකින් වර්ධනය විය. තවද, 2004 වසර වන විට මුළු වියදමින් සියයට 9.9 ක් දක්වා වර්ධනය වූ මෙම අංශයෙහි දායකත්වය ක්‍රමයෙන් අඩු වී 2006 වසර වන විට සියයට 7.6 ක් වූ අතර, ඉන්පසු නැවතත් 2007 වසර තුළදී සියයට 7.9 ක් දක්වා ඉහළ ගොස් ඇත.

**2007 වසර තුළදී බොහොමයක් උපයෝගීතා සේවාවන් වල මිල ගණන් ඉහළ ගියේය.** මේ සඳහා විදුලිය ගාස්තු ඉහළ දැමීම, ජාත්‍යන්තර වෙළඳපල ප්‍රවණතාවන් සමග ගෑස් මිල ගණන් කිහිප වරක් වැඩිවීම සහ භූමිතෙල් වැනි අනෙකුත් ඉන්ධන වර්ග යන්හි මිල ගණන් ද සැලකිය යුතු ලෙස ඉහළ යාම දායක විය. මෙම මිල වැඩිවීම් සමඟ නිවාස කටයුතු සහ උපයෝගීතා සේවාවන් සඳහා වූ වියදම නාමිකව සියයට 33.8 කින් වර්ධනය විය.

**ගෘහස්ථ උපකරණ සහ සේවාවන් සඳහා වූ නාමික වියදම ඉහළ ගියමුත්, මෙම වර්ධනය සමස්ත පරිභෝජන වියදමෙහි වර්ධනය හා සැසඳීමේදී අඩු අගයක් ගන්නා ලදී.** තවද, සියයට 13.7 ක් වූ මෙම වර්ධනය සඳහා එදිනෙදා නිවාස නඩත්තු කිරීම සඳහා යොදාගනු ලබන ගොඩනැගිලි ද්‍රව්‍ය ඇතුළු භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළයෑම දායක විය. මෙමගින්ද මිල මට්ටම් ඉහළයෑම හේතුවෙන් අත්‍යවශ්‍ය පරිභෝජන උවමනාවන් අනෙකුත් අවශ්‍යතාවයන් අභිබවා යමින් ප්‍රමුඛත්වය ගෙන ඇති බව පිළිබිඹු කරනු ලැබේ.

**2007 වසර තුළදී සෞඛ්‍ය සේවාවන් සඳහා වූ වියදම තවදුරටත් පුළුල් විය.** පසුගිය වසර කිහිපය තුළම මුළු වියදමෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.5 ක අගයක නොවෙනස්ව පැවති සෞඛ්‍ය කටයුතු සඳහා වූ වියදම, මෙම වසර තුළදී ද එසේම පැවතුනි. මේ අතර 2002 වසරේ මුළු වියදමින් සියයට 0.1 ක් වූ අධ්‍යාපනික කටයුතු සඳහා වූ වියදම, 2007 වසර තුළද නොවෙනස්ව පැවතුණි. සෞඛ්‍ය සහ අධ්‍යාපනික සේවාවන් සඳහා වූ පෞද්ගලික වියදමෙහි මෙම අඩු දායකත්වයට මෙම සේවාවන් පොදු ජනතාවට ලබාදීම සඳහා රාජ්‍ය අංශය මගින් ඉටුකරනු ලබන සැළකිය යුතු කාර්යභාරය හේතු විය හැකිය.

**2007 වසර තුළදී ඉන්ධන මිල ගණන් කිහිප වාරයක් ඉහළයාම හේතුවෙන් පෙට්‍රල් සහ ඩීසල් මිල ගනන් මෙම වසර තුළදී නාමිකව පිළිවෙලින් සියයට 27.2 කින් සහ සියයට 25.0 කින් ඉහළ ගියේය.** මෙහි ප්‍රතිඵලයක් ලෙස, මෙම වසර තුළදී බස් ගාස්තු වැඩිවීමත් සමග පොදු ප්‍රවාහන සේවාවන් වල ගාස්තු ඉහළ ගියේය. එබැවින්, 2007 වසර තුළ ප්‍රවාහන සේවාවන් සඳහා වූ වියදම සියයට 25.5 කින් ඉහළ යමින් සමස්ථ පෞද්ගලික පරිභෝජන වියදමට සියයට 20.4 ක දායකත්වයක් දක්වන ලදී. තවද, මෙම වසර තුළදී අළුතින් රථවාහන ලියාපදිංචි

**2.12 සංඛ්‍යා සටහන**

**පවත්නා වෙළෙඳ මිල අනුව පෞද්ගලික පරිභෝජන වියදමේ සංයුතිය**

| අයිතමය | මුළු පෞද්ගලික පරිභෝජන වියදමට දායකත්වය (%) | | | වෙනස්වීමේ අනුපාතය (%) | |
|---|---|---|---|---|---|
| | 2005 | 2006 | 2007(අ) | 06/05 | 07/06 |
| 1. ආහාර, පාන සහ දුම්කොළ | 37.9 | 41.2 | 39.7 | 27.5 | 16.5 |
| 2. රෙදිපිළි සහ පාවහන් | 8.5 | 7.6 | 7.9 | 5.4 | 25.9 |
| 3. නිවාස කටයුතු, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන | 10.0 | 10.2 | 11.3 | 19.8 | 33.8 |
| 4. ගෘහභාණ්ඩ, ගෘහස්ථ උපකරණ සහ නෛත්‍යක නිවාස නඩත්තුව | 6.0 | 6.9 | 6.5 | 34.7 | 13.7 |
| 5. සෞඛ්‍යය | 1.5 | 1.5 | 1.5 | 20.2 | 21.6 |
| 6. ප්‍රවාහනය | 21.3 | 19.7 | 20.4 | 8.6 | 25.5 |
| 7. විනෝද සේවා සහ සංස්කෘතික කටයුතු | 2.6 | 3.0 | 3.5 | 39.5 | 41.3 |
| 8. අධ්‍යාපනය | 0.1 | 0.1 | 0.1 | 9.3 | 12.4 |
| 9. හෝටල් සහ ආපන ශාලා | 1.7 | 0.8 | 0.7 | -46.9 | 12.8 |
| 10. විවිධ භාණ්ඩ සහ සේවා | 4.3 | 3.8 | 3.1 | 3.1 | 0.1 |
| 11. ශ්‍රී ලාංකිකයින් එතෙරදී කරන වියදම් | 9.9 | 9.2 | 8.9 | 9.3 | 17.2 |
| 12. අඩු කළා : විදෙශිකයින් මෙතෙරදී කරන වියදම් | 3.8 | 4.0 | 3.8 | 23.2 | 14.9 |
| **මුළු පෞද්ගලික පරිභෝජන වියදම** | **100.00** | **100.00** | **100.00** | **17.5** | **20.9** |

(අ) තාවකාලික

මූලයː ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කිරීමේ අඩුවීමක් පෙන්නුම් කර ඇති අතර, මෙය විශේෂයෙන්ම මෝටර් රථ අංශයෙහි දැකිය හැකි විය. එනමුදු, වඩා පිරිමැසුම්දායක රථවාහන ලියාපදිංචි කිරීමේ වැඩිවීමක් විය.

**ක්‍රීඩා, විනෝද සේවා සහ ආපනශාලා සහ හෝටල් යන අනෙකුත් පරිභෝජන අවශ්‍යතාවයන් සඳහා වූ වියදම් මෙම වසර තුළදී සියයට 12 ට වඩා වැඩි ප්‍රමාණයකින් වර්ධනය විය.** තවද, ස්වදේශිකයන් එතෙරදී දරනු ලබන වියදම් මුළු වියදමින් සියයට 8.9 ක් වන අතර, මෙය විදේශිකයන් විසින් මෙතෙරදී කරනු ලබන වියදම් ප්‍රමාණය වන සියයට 3.8 ක් හා සැසඳීමේදී ඉහළ අගයක් වේ.

**රාජ්‍ය අංශයේ පරිභෝජන වියදම, පසුගිය වසරේ වූ සියයට 40.6 ක සැළකිය යුතු නාමික වර්ධනය හා සැසඳීමේදී 2007 වසර තුළදී සියයට 21.1 කින් වර්ධනය විය.** රාජ්‍ය වියදමෙහි මෙම වර්ධන සීඝ්‍රතාවය අඩුවීම සඳහා රාජ්‍ය සංස්ථා සඳහා වූ සහනාධාර සහ පැවරුම් වල වූ පහළ වැටීමට ආරෝපණය කළ හැකි නමුදු, කුටුම්භයන් සඳහා වූ රාජ්‍ය සහනාධාර තවදුරටත් නාමික අගය අනුව ප්‍රසාරණය විය. මධ්‍යම රජය සහ පළාත් සභා ඇතුළුව සියළුම රාජ්‍ය අංශයන්හි වේතන වියදම් ඉහළ යාම සහ පොළී ගෙවීම් ඉහළයෑම, රාජ්‍ය වියදම් පුළුල්වීම සඳහා දායක විය.

## ආයෝජනය


**ආයෝජන වියදම් (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය) 2006 වසරේ වූ රුපියල් බිලියන 822 ක අගයෙහි සිට 2007 වසර තුළදී රුපියල් බිලියන 997 ක් දක්වා පුළුල් වූ අතර, මෙය නාමික වශයෙන් සියයට 21.2 ක වර්ධනයකි.** කෙසේ වුවත්, ආයෝජන කටයුතුවල වර්ධන වේගයේ වූ අඩුවීම පිළිබිඹු කරමින් ආයෝජන අනුපාතිකය (ආයෝජනය/දළ දේශීය නිෂ්පාදිතය) 2006 වසරේ වූ සියයට 28.0 ක අගයෙහි සිට සියයට 27.9 ක් දක්වා ආන්තිකව පහළ වැටුණි. තවද, 2007 වසර තුළදී ආයෝජන කටයුතු මූර්ත වශයෙන් සියයට 8.7 කින් ප්‍රසාරණය වූයේ යැයි ඇස්තමේන්තු කර ඇත.

**ආරක්ෂක තත්ත්වය හමුවේ වුවද ආයෝජක විශ්වාසනීයත්වය අඛණ්ඩව පැවතීම පෙන්නුම් කරමින්, රාජ්‍ය සංස්ථා සහ මණ්ඩලද ඇතුළුව පෞද්ගලික ආයෝජන පසුගිය වසර තුළ සියයට 27.9 ක වර්ධනය මත මෙම වසර තුළදී සියයට 14.4 කින් වර්ධනය විය.** පෞද්ගලික අංශයේ ආයෝජන, මුළු ආයෝජන සඳහා සියයට 81 ක දායකත්වයක් දැක්වීය. ආයෝජක විශ්වාසනීයත්වය විශේෂයෙන්ම කර්මාන්තශාලා නිෂ්පාදන, සන්නිවේදන, දේපොළ වෙළඳාම්, සහ සෞඛ්‍ය සහ අධ්‍යාපනික සේවා වැනි අනෙකුත් පෞද්ගලික සේවා යන අංශයන්හි පිළිබිඹු විය. තවද, ආයෝජන භාණ්ඩ ආනයන පරිමාවන් සහ විදේශීය ඍජු ආයෝජන වර්ධනය වීම තුළින්ද ආයෝජන කටයුතුවල ක්‍රියාකාරීත්වය ඉහළයෑම පෙන්නුම් කළේය.


**2007 වසරේදී විදේශීය ඍජු ආයෝජන ලැබීම් සියයට 21.6 කින් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 734.4 ක් දක්වා ඉහළ ගියේය.** සමස්ත විදේශීය ඍජු ආයෝජන ලැබීම් සඳහා සියයට 50 කටත් වඩා වැඩි දායකත්වයක් සපයන ලද්දේ විදුලි සංදේශ අංශය මගිනි. දේශීය හා විදේශීය ආයෝජන ආකර්ශණය කර ගැනීම හා ප්‍රවර්ධනය සඳහා වූ ප්‍රධාන රාජ්‍ය ආයතනය වන ආයෝජන මණ්ඩලය, 2007 වසරේදී විදේශීය ඍජු ආයෝජන ලැබීම් ඉහළ නංවා ගැනීම සහතික කිරීම සඳහා තවදුරටත් විශාල කාර්ය භාරයක් ඉටු කරන ලදී. ආයෝජන මණ්ඩලය විසින් ආයෝජනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ආයෝජන ප්‍රවර්ධන දූත මෙහෙවරෙහි යෙදීම, වෙළෙඳ නාම ප්‍රවර්ධන වැඩමුළු සහ ප්‍රදර්ශන පැවැත්වීම වැනි ආයෝජන ප්‍රවර්ධන ක්‍රියාකාරකම්වල යෙදෙන ලදී. විදේශීය ඍජු ආයෝජන ලැබීම් වලින් සියයට 70 කට වඩා ආයෝජනය කර ඇත්තේ විදුලි සංදේශ, බලශක්ති උත්පාදනය, නිවාස දේපොළ හා කාර්යාල සංකීර්ණ සංවර්ධනය ඇතුළු යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහාය.

**2.4 රූප සටහන** — **අනුමතකළ සහ ගිවිසගත් ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන්හි ආයෝජන**

**ව්‍යාපෘති සංඛ්‍යාව**




**ආයෝජන වටිනාකම**




(අ) පුළුල් කරන ලද ව්‍යාපෘතීන් ඇතුලුව
(ආ) මිහින් ලංකා පෞද්ගලික සමාගම සඳහා කරන ලද රුපියල් බිලියන 3,616 ක දේශීය ආයෝජන හැර

**2.13 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ ව්‍යවසායයන්හි ආයෝජන සහ සේවා නියුක්තිය**

| කාණ්ඩය | ව්‍යාපෘති සංඛ්‍යාව | | ආයෝජන (රු. දශ ලක්ෂ) | | | | | | සේවා නියුක්තිය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2006(අ) | 2007(ආ) | 2006(අ) | | | 2007(ආ) | | | 2006(අ) | 2007(ආ) |
| | | | විදේශීය | දේශීය | එකතුව | විදේශීය | දේශීය | එකතුව | | |
| **ආයෝජන මණ්ඩලය** | | | | | | | | | | |
| අනුමත කළ ව්‍යාපෘති | 401 | 692 | 231,738 | 146,821 | 378,558 | 307,093 | 336,786 | 643,879 | 87,550 | 126,773 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) | 349 | 652 | 223,106 | 134,487 | 357,593 | 304,639 | 336,074 | 640,713 | 72,668 | 124,161 |
| 16 වන වගන්තිය යටතේ | 52 | 40 | 8,632 | 12,334 | 20,965 | 2,454 | 712 | 3,166 | 14,882 | 2,612 |
| 17 වන වගන්තිය යටතේ ගිවිසගත් ව්‍යාපෘති (ඇ) | 247 | 303 | 39,898 | 83,677 | 123,575 | 122,671 | 128,955 | 251,626 | 45,063 | 63,590 |
| 17 වන වගන්තිය යටතේ දැනට කර ඇති ආයෝජන (ඇ) | 1,929 | 1,976 | 285,366 | 182,651 | 468,017 | 363,029 | 237,749 | 600,778 | 421,271 | 451,934 |
| වානිජ කටයුතුවල නිරත වූ (ඇ) | 2,460 | 2,418 | 185,106 | 177,664 | 362,770 | 185,458 | 180,969 | 366,427 | 386,835 | 376,947 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) (ඈ) | 1,655 | 1,608 | 167,598 | 167,210 | 334,808 | 167,728 | 170,480 | 338,208 | 349,652 | 339,670 |
| 16 වන වගන්තිය යටතේ (ඇ) | 805 | 810 | 17,508 | 10,454 | 27,962 | 17,730 | 10,489 | 28,219 | 37,183 | 37,277 |
| **කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය** | | | | | | | | | | |
| ලියාපදිංචි වූ ව්‍යාපෘති (ඇ) | 1,629 | 1,667 | ලැ.නො. | ලැ.නො. | 119,344 | ලැ.නො. | ලැ.නො. | 121,456 | 273,553 | 275,883 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) වර්ෂය අවසානයේ සමුච්චිත අගය
(ඈ) ප්‍රසාරණය කළ ව්‍යාපෘතීන් ද ඇතුළත්ව

මූලයන්: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

**ආයෝජන මණ්ඩල පනතේ 17 වන හා 16 වන වගන්තිය යටතේ ආයෝජන වටිනාකම රු. බිලියන 489.4 ක් වූ නව ව්‍යාපෘති 605 ක් 2007 දී අනුමත කරන ලදී. 2006 වසරේදී අනුමත කළ ව්‍යාපෘති 364 ක වටිනාකම රු. බිලියන 339.8 ක් විය.** ආයෝජන ලැබීම් වර්ධනය තුළ දේශීය හා විදේශීය ආයෝජන අන්තර්ගත වේ. ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තියට අනුව 2007 දී අනුමත කරන ලද වටිනාකම රුපියල් බිලියන 154.5 ක් වූ ව්‍යාපෘතීන් 87 ක් පුළුල් කරන ලද ව්‍යාපෘතීන් වේ. ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන් තුළ දැනටමත් සිදුකර ඇති ආයෝජනවල සමුච්චිත වටිනාකම 2007 දී රුපියල් බිලියන 600.8 ක් වූ අතර, එය 2006 පැවති රුපියල් බිලියන 468.0 ට වඩා සියයට 28.4 කින් වැඩි වීමකි.

**2007 දී 17 වන හා 16 වන වගන්ති යටතේ අනුමත කළ නව ව්‍යාපෘතීන් 605 න් 323 ක් ශ්‍රී ලාංකීය ආයෝජකයන්ගෙන්ද, ව්‍යාපෘති 167 පූර්ණ විදේශ ආයෝජකයන්ගෙන් ද, ඉතිරි ව්‍යාපෘතීන්හි අයිතිය හවුල් ව්‍යාපාර ද සතු විය.** ආයෝජන ප්‍රවාහ ලැබීමේදී තවදුරටත් මූලිකත්වය ගනු ලැබූ සේවා අංශය රුපියල් බිලියන 543.6 ක වටිනාකමකින් වූ ව්‍යාපෘතීන් 356 ක් ගිවිසගත් අතර, 2007 වසරේදී කම්හල් කර්මාන්ත අංශය රුපියල් බිලියන 86.6 ක් වූ ව්‍යාපෘතීන් 249 ක් අවශෝෂණය කර ගන්නා ලදී. නිවාස හා දේපොළ සංවර්ධනය, විදුලි සංදේශ, රෝහල් සේවා, හෝටල් ආපනශාලා හා විනෝද සේවා, බලශක්ති උත්පාදනය හා අනිකුත් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති, සේවා අංශය තුළ මූලිකත්වය ගනු ලැබීය. කම්හල් කර්මාන්ත අංශය තුළ සියයට 90 කටත් වඩා වැඩි ආයෝජන ප්‍රමාණයක් අවශෝෂණය කර ඇත්තේ ආහාර, පාන හා දුම්කොළ නිෂ්පාදිත, රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත, සකස් කළ ලෝහ නිෂ්පාදනය, යන්ත්‍ර-සූත්‍ර හා ප්‍රවාහන උපකරණ, රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, අඟුරු, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදිත හා ලෝහමය නොවන ඛනිජමය නිෂ්පාදිතයන්ය.

**ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තියට අනුව 2007 වසරේ සේවා අංශය විසින් ආයෝජන වටිනාකම රුපියල් බිලියන 160.6 ක් වූ ව්‍යාපෘතීන් 154 ක් අවශෝෂණය කර ගන්නා ලද අතර, කම්හල් කර්මාන්ත අංශය විසින් රුපියල් බිලියන 20.6 ක් අවශෝෂණය කර ගන්නා ලදී.** නිවාස හා දේපොළ සංවර්ධනය, විදුලි සංදේශ, බලශක්ති උත්පාදනය හා යටිතල පහසුකම් සංවර්ධන ආයෝජන ප්‍රවාහ ලද ප්‍රධාන ව්‍යාපෘති අතර විය. 2007 වසරේ කම්හල් කර්මාන්ත අංශය තුළ ගිවිස ගත් ආයෝජන අතුරින් මූලිකත්වය ගනු ලැබුයේ රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත; රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, අඟුරු, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදිත; ආහාර, පාන හා දුම්කොළ නිෂ්පාදිත; ලෝහමය නොවන ඛනිජමය නිෂ්පාදිත සහ සකස් කළ ලෝහ, යන්ත්‍ර-සූත්‍ර, ප්‍රවාහන උපකරණ නිෂ්පාදිතයන්ය. 2007 වර්ෂය තුළ ආයෝජන වටිනාකම රුපියල් බිලියන 70.4 ක් වූ ගිවිසගත් ව්‍යාපෘති 48 ක් තවදුරටත් පුළුල් කරන ලදී.

**2006 දී 2,460 ක් වූ ආයෝජන මණ්ඩල පනතේ 16 වන හා 17 වන වගන්ති යටතේ වාණිජ කටයුතු ආරම්භ කළ ව්‍යාපෘතීන් 2007 වසරේදී 2,418 දක්වා අඩුවීමක් පෙන්විය.** කම්හල් කර්මාන්ත අංශයේ අනු කාණ්ඩ යටතේ රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත, කාණ්ඩය යටතේ ව්‍යාපෘති 342 ක් ද, ආහාර පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත කාණ්ඩය යටතේ ව්‍යාපෘති 180 ක් ද රසායනික ද්‍රව්‍ය ඛනිජ තෙල්, අඟුරු, රබර් හා

ප්ලාස්ටික් නිෂ්පාදිත කාණ්ඩ යටතේ ව්‍යාපෘති 165 ක් ද සකස් කළ ලෝහ, යන්ත්‍ර-සූත්‍ර, ප්‍රවාහන උපකරණ කාණ්ඩය යටතේ ව්‍යාපෘති 100 ක් ද පැවති අතර, සේවා අංශය විසින් අවශෝෂණය කර ගන්නා ලද ව්‍යාපෘතීන් ගණන 1,191 ක් විය. මේ අතර, 2007 වසර අවසානයේ පැවති ව්‍යාපෘති 95 ක් ස්ථාන ගත කරන ලද්දේ සැකසුම් කලාප වලින් බැහැරවය.

**රාජ්‍ය අංශයෙහි ආයෝජනයන් 2006 වසර තුළ වූ සියයට 10.0 ක වර්ධනය හා සැසඳීමේදී 2007 වසර තුළදී සියයට 61 ක වැඩි වේගයකින් වර්ධනය වූ අතර, මෙය සියයට 38.2 ක මූර්ත වර්ධනයකි.** ආයෝජන කටයුතු සඳහා රාජ්‍ය අංශයෙහි දායකත්වය මූලිකවම මහාමාර්ග සහ මාර්ග ඉදිකිරීම්, සහ පුනරුත්ථාපන කටයුතු මෙන්ම, පෞද්ගලික අංශයේ සහභාගීත්වයෙන් යුතුව සිදුකළ විදුලිබල ව්‍යාපෘති තුළින් ප්‍රකට විය. තවද, සමාජ අභිවෘද්ධිය ඉලක්ක කරගත් අධ්‍යාපනික සහ සෞඛ්‍ය සේවා ව්‍යාපෘති ඔස්සේ ද රාජ්‍ය අංශයෙහි දායකත්වය දැකිය හැකි විය.

## පවත්නා සම්පත් සහ උපයෝජනය


**ද.දේ.නි. සහ භාණ්ඩ හා සේවා ආනයනයන් මගින් ආර්ථිකයෙහි පවත්නා සමස්ත සම්පත් ප්‍රමාණය පෙන්නුම් කරනු ලැබේ.** 2007 වසර සඳහා මෙය රුපියල් බිලියන 4,992 ක් යැයි ඇස්තමේන්තු කර ඇති අතර, එය පසුගිය වසර තුළ වූ සියයට 19.7 ක වර්ධනය හා සැසඳීමේදී සියයට 20.4 ක ප්‍රසාරණයකි. විදේශීය සම්පත් වල වූ සියයට 17.0 ක වර්ධනය හා සැසඳීමේදී දේශීය සම්පත් සියයට 21.8 ක ඉහළ වේගයකින් වර්ධනය විය. එබැවින් ආර්ථිකයෙහි පවත්නා සමස්ත සම්පත් ප්‍රමාණය සඳහා දේශීය සම්පත් දායකත්වය 2006 වසරෙහි වූ සියයට 71 ක අගයෙහි සිට සියයට 72 ක් දක්වා ඉහළ ගිය අතර, ඉතිරි සියයට 28 ක සම්පත් ප්‍රමාණය විදේශීය සම්පත් මගින් සමන්විත විය. දේශීය සම්පත්වල සියයට 6.8 ක මූර්ත වර්ධනය සහ විදේශීය සම්පත් වල සියයට 4.4 ක වර්ධනය සමග පවත්නා සමස්ත සම්පත් ප්‍රමාණය මූර්ත වශයෙන් සියයට 6.1 කින් ප්‍රසාරණය විය.

**ආර්ථිකයක පවත්නා සම්පත් පරිභෝජනය, ප්‍රාග්ධන සම්පාදනය සහ භාණ්ඩ හා සේවා අපනයනය සඳහා උපයෝජනය වේ.** සමස්ත සම්පත් උපයෝජනයෙන් සියයට 59 ක ඉහළ ප්‍රමාණයක් පරිභෝජනය සඳහා යොදාගනු ලැබූ අතර, සියයට 21 ක ප්‍රමාණයක් භාණ්ඩ හා සේවා අපනයනය සඳහා ද, ඉතිරි සියයට 20 ක ප්‍රමාණය ප්‍රාග්ධන සම්පාදනය සඳහා ද යොදා ගන්නා ලදී. පරිභෝජනය සහ ප්‍රාග්ධන සම්පාදනය යන දෙඅංශයෙහිම සම්පත් උපයෝජනය සියයට 20 කට වඩා වැඩි වේගයකින් වර්ධනය වූ අතර, ප්‍රාග්ධන සම්පාදනය සඳහා වූ සම්පත් උපයෝජනය ආන්තික ලෙස වැඩි වේගයකින් වර්ධනය විය. තවද, භාණ්ඩ හා සේවා අපනයන කටයුතු සඳහා වූ සම්පත් උපයෝජනය සියයට 18 කින් ඉහළ ගියේය.


**භාණ්ඩ හා සේවාවන්හි සමස්ත සැපයුම සඳහා දේශීය මෙන්ම විදේශීය යන දෙඅංශයම දායක වේ.** සමස්ත සැපයුමෙන් සියයට 42 ක ප්‍රමාණයක් දේශීය

**2.5 රූප සටහන** — **2007 වර්ෂයේ ආර්ථිකය (පවත්නා මිල යටතේ)**

**භාණ්ඩ සහ සේවා සැපයුම (රුපියල් බිලියන 4,992)**




**භාණ්ඩ සහ සේවා සඳහා ඉල්ලුම (රුපියල් බිලියන 4,992)**




**2.14 සංඛ්‍යා සටහන** — **සම්පත් සංයුතිය සහ උපයෝජනය (පවත්නා වෙළෙඳ මිල අනුව)**

| අයිතමය | ප්‍රතිශතාත්මක දායකත්වය 2006 | ප්‍රතිශතාත්මක දායකත්වය 2007(අ) | ප්‍රතිශතාත්මක වර්ධනය 2006 | ප්‍රතිශතාත්මක වර්ධනය 2007(අ) |
|---|---|---|---|---|
| **1. සම්පත්** | | | | |
| වෙළෙඳ මිල අනුව ද.දේ.නි. | 70.9 | 71.7 | 19.8 | 21.8 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 29.1 | 28.3 | 19.4 | 17.0 |
| එකතුව | **100.0** | **100.0** | **19.7** | **20.4** |
| **2. උපයෝජනය** | | | | |
| පරිභෝජනය | 58.8 | 59.1 | 21.2 | 20.9 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 17.6 | 17.7 | 27.5 | 21.0 |
| පෞද්ගලික | 15.1 | 14.3 | 30.5 | 14.3 |
| රජය | 2.6 | 3.4 | 12.3 | 61.0 |
| තොග වෙනස්වීම් | 2.2 | 2.2 | 7.7 | 22.7 |
| භාණ්ඩ සහ සේවා අපනයන | 21.3 | 21.0 | 11.6 | 18.1 |
| එකතුව | **100.0** | **100.0** | **19.7** | **20.4** |

(අ) තාවකාලික    මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

සේවාවන් මගින් සපයන ලදී. දේශීය භාණ්ඩ මගින් පසුගිය වසරෙහි මෙන් සියයට 30 ක දායකත්වයක් සපයන ලදී. ආනයනික භාණ්ඩ සැපයුම 2006 වසරෙහි වූ සියයට 26 ක අගයෙහි සිට සියයට 25 ක් දක්වා සංකෝචනය වූ අතර, ආනයනික සේවාවන් සියයට 3 ක අගයෙහිම පැවතුණි.

**2006 වසර හා සැසඳීමේදී පරිභෝජනය, ආයෝජනය සහ බාහිර ඉල්ලුම යන ඉල්ලුම් අංශයන්හි මූලික ඓක්‍යයන්ගේ දායකත්වය මෙම වසර තුළදීද නොවෙනස්ව පැවතුණි.** පරිභෝජනය සහ ආයෝජනයෙන් සැදුම්ලත් දේශීය ඉල්ලුම, පසුගිය වසර කිහිපය තුළ ඉහළ යන උපනතියක් පෙන්නුම් කරමින්, 2002 වසරෙහි සියයට 75 ක් වූ සමස්ත ඉල්ලුම කෙරෙහි වූ දායකත්වය 2006 වසර වන විට සියයට 79 ක් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස බාහිර ඉල්ලුම 2002 වසරෙහි සියයට 25 ක අගයක සිට 2006 වසර වන විට සියයට 21 ක් දක්වා පහත වැටුණි. ශ්‍රී ලංකාව කුඩා දේශයක් බැවින්, දිගුකාලීන වර්ධන ගාමකත්වය, දේශීය ඉල්ලුම මතම රඳවා ගත නොහැක. එබැවින් අනාගත වර්ධන අපේක්ෂාවන් සාක්ෂාත් කරගැනීම සඳහා බාහිර ඉල්ලුම ප්‍රසාරණයවීම අත්‍යවශ්‍ය වේ.

### ඉතුරුම්

**2007 වසර තුළදී පරිභෝජන වියදම් ඉහළයාම හමුවේ වුවද, දේශීය ඉතුරුම් සහ ජාතික ඉතුරුම් ඉහළ ගියේය.** දේශීය ඉතුරුම් සියයට 26 කින් පුළුල් වූ අතර, දේශීය ඉතුරුම් අනුපාතය (දේශීය ඉතුරුම්/ද.දේ.නි.) සියයට 17.0 සිට සියයට 17.6 දක්වා ඉහළ ගියේය. දේශීය ඉතුරුම් අනුපාතය ඉහළයාම සහ ආයෝජන අනුපාතය ආන්තිකව පහළ වැටීම නිසා 2007 තුළදී සම්පත් පරතරය එනම්, දේශීය ඉතුරුම් සහ ආයෝජන අතර වෙනස ද.දේ.නි. හි අනුපාතයක් ලෙස අඩුවිය.

**පෞද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයෙහිම ඉතුරුම් ඇතුළත් වන දේශීය ඉතුරුම් 2007 වසර තුළදී රුපියල් බිලියන 629 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, රුපියල් බිලියන 686 ක් වූ පෞද්ගලික අංශයෙහි ඉතුරුම් මගින් රුපියල් බිලියන 58 ක් වූ රාජ්‍ය අංශයෙහි නිර්-ඉතුරුම් හි අඩුව පුරවන ලදී.** ඉහළ ලාභදායීත්වය ආයතනික අංශයෙහි ඉතුරුම් ඉහළ නැංවූ අතර, පොළී අනුපාත ඉහළයෑම, කුටුම්භ අංශයෙහි ඉතුරුම් දිරිමත් කළේය. මේ අතර, රාජ්‍ය අයවැයෙහි ජංගම ගිණුම් ශේෂය වන රාජ්‍ය ඉතුරුම් සෘණ අගයක් ගන්නා ලද නමුත් 2006 ට සාපේක්ෂව සියයට 17.7 කින් වර්ධනය විය.

**දේශීය ඉතුරුම්, විදේශීය ශුද්ධ සාධක ආදායම සහ විදේශීය ශුද්ධ සංක්‍රාම වල එකතුව වන ජාතික ඉතුරුම් සියයට 27 කින් රුපියල් බිලියන 835 ක් දක්වා ඉහළ ගියේය.** මීට විදේශීය ශුද්ධ සාධක ආදායම් සහ විදේශීය ශුද්ධ පැවරුම් වල යහපත් ක්‍රියාකාරීත්වය හේතුවිය. ශුද්ධ විදේශීය සාධක ආදායම සෘණ අගයක් ගත් නමුත් නිල සංචිත සහ පෞද්ගලික අංශයේ විදේශීය මූල්‍ය වත්කම්වල පොළී ආදායම ඉහළ යාම හේතුවෙන් 2007 වසර තුළදී දියුණු විය. විදේශීය රැකියා නියුක්තිකයන්ගේ ප්‍රේෂණද අයත් වන ශුද්ධ පෞද්ගලික සංක්‍රාම 2007 වසර තුළදී සියයට 24 කින් රුපියල් බිලියන 245 ක් දක්වා වර්ධනය විය. ඒ අනුව ජාතික ඉතුරුම් අනුපාතය (ජාතික ඉතුරුම්/ද.දේ.නි.) සියයට 22.3 ක සිට සියයට 23.3 ක් දක්වා ඉහළ ගියේය.

**2.15 සංඛ්‍යා සටහන**

**පරිභෝජනය, ආයෝජන සහ ඉතිරිකිරීම් (පවත්නා වෙළෙඳ මිල අනුව)**

| අයිතමය | රුපියල් දශ ලක්ෂ | | ප්‍රතිශතක වෙනස | | ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|---|
| | 2006 | 2007(අ) | 2006 | 2007(අ) | 2006 | 2007(අ) |
| 1. වෙළෙඳ මිල අනුව ද.දේ.නි. | 2,938,656 | 3,578,386 | 19.8 | 21.8 | 100.0 | 100.0 |
| 2. පරිභෝජන වියදම | 2,439,816 | 2,949,712 | 21.2 | 20.9 | 83.0 | 82.4 |
| පෞද්ගලික | 1,988,378 | 2,403,167 | 17.5 | 20.9 | 67.7 | 67.2 |
| රජය | 451,438 | 546,545 | 40.6 | 21.1 | 15.4 | 15.3 |
| 3. ආයෝජන | 822,216 | 996,700 | 25.0 | 21.2 | 28.0 | 27.9 |
| පෞද්ගලික | 703,044 | 804,495 | 27.9 | 14.4 | 23.9 | 22.5 |
| රජය | 119,172 | 192,204 | 10.0 | 61.3 | 4.1 | 5.4 |
| 4. දේශීය ඉතුරුම් | 498,840 | 628,674 | 13.6 | 26.0 | 17.0 | 17.6 |
| පෞද්ගලික | 568,967 | 686,380 | 13.2 | 20.6 | 19.4 | 19.2 |
| රජය | -70,127 | -57,706 | -10.3 | 17.7 | -2.4 | -1.6 |
| 5. දේශීය ඉතිරුම්-ආයෝජන පරතරය | -323,376 | -368,026 | -47.6 | -13.8 | -11.0 | -10.3 |
| 6. විදේශීය ශුද්ධ සාධක ආදායම | -40,424 | -38,808 | -34.5 | 4.0 | -1.4 | -1.1 |
| 7. විදේශීය ශුද්ධ පෞද්ගලික වර්තන සංක්‍රාම | 197,861 | 245,006 | 13.4 | 23.8 | 6.7 | 6.8 |
| 8. ජාතික ඉතුරුම් | 656,278 | 834,872 | 12.5 | 27.2 | 22.3 | 23.3 |

(අ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**විශේෂ සටහන 6**

## තුලිත ප්‍රාදේශීය සංවර්ධනය

තම ජනතාවට වඩාත් හොඳ ජීවන මට්ටමක් ලබාදීමට විවිධ රටවල් විසින් උත්සාහ දරන විට, ඒ සඳහා වන අවස්ථාවන් මෙන්ම ධනය බෙදී යාම පිළිබඳව ද අසමානතාවයන්ට මුහුණ දීමට සිදු වේ. මෙම තත්ත්වය බොහෝවිට කැපී පෙනෙන ප්‍රාදේශීය අසමානතා ඇතිවීම කෙරෙහි හේතු වෙයි. ආර්ථික හා සමාජ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම මගින්, රටෙහි විවිධ ප්‍රදේශ සමාන අනුපාතයකින් වර්ධනය කිරීමට හැකිවන තුලිත ප්‍රාදේශීය සංවර්ධනය, රටේ සංවර්ධන උපාය මාර්ගයන්හි අරමුණ විය යුතුය. එවැනි තත්ත්වයක් යටතේ, තමන් ජීවත්වන ප්‍රදේශය කුමක් වුවත් රටේ සියලුම පුරවැසියන්ට ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ හිමිවනු ඇත. මෙවැනි තත්ත්වයක් ළඟා කර ගැනීම පහසු කටයුත්තක් නොවූවද, සමාජයීය වශයෙන් ක්‍රියාකාරී වීමට, දේශපාලනික වශයෙන් බලපෑමක් ඇති කිරීමට සහ ආර්ථික වශයෙන් ඵලදායී ලෙස කටයුතු කිරීමට සමාජයේ සියලු සාමාජිකයින්ට සමාන අවස්ථා ලැබෙන පරිසරයක් නිර්මාණය කිරීමට හැකිවන ආකාරයේ ප්‍රතිපත්තීන් කැපවීමෙන් යුතුව ක්‍රියාත්මක කිරීමට සාමූහිකව කටයුතු කිරීම අවශ්‍ය වේ.

### පවත්නා ප්‍රාදේශීය ආර්ථික අසමානතාවයන්

ශ්‍රී ලංකාව නිදහස ලබාගත් කාලයේ සිට බලයට පත් වූ සියලුම රජයයන් ප්‍රාදේශීය ආර්ථිකය නගා සිටුවීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.[1/] මෙවැනි ප්‍රයත්නයන් තිබියදීත්, රට තුළ සැළකිය යුතු මට්ටමේ ප්‍රාදේශීය ආර්ථික අසමානතාවයන් තවදුරටත් පවතී. 2006 දී බස්නාහිර පළාත දළ දේශීය නිෂ්පාදිතයෙන් (ද.දේ.නි.) සියයට 50.1 ට දායක වූ අතර අනෙකුත් පළාත් එකිනෙක වෙන්ව ගත් විට ද.දේ.නි. යෙන් සියයට 10 කට අඩු ප්‍රමාණයකට දායක විය (වි.ස. 6.1 සංඛ්‍යා සටහන) ඒක පුද්ගල පදනමින් වුවද, බස්නාහිර පළාත අනෙකුත් පළාත්වලට වඩා සැළකිය යුතු මට්ටමකින් ඉදිරියෙන් සිටී. එසේම, ද.දේ.නි.යේ ආංශික ව්‍යාප්තිය, විශේෂයෙන්ම සේවා හා කාර්මික අංශවල ද, සමාන ප්‍රවණතාවයක් දක්වයි. (වි.ස. 6.1 රූප සටහන).

**සංඛ්‍යා සටහන වි.ස. 6.1**


**ද.දේ.නි. පළාත් අනුව දායකත්වය සහ ඒක පුද්ගල ආදායම - 2006**

| පළාත | ද.දේ.නි.යට දායකත්වය (%) | ඒක පුද්ගල ආදායම (රුපියල්) |
|---|---|---|
| බස්නාහිර | 50.1 | 222,598 |
| දකුණ | 9.3 | 97,377 |
| සබරගමුව | 6.2 | 82,575 |
| මධ්‍යම | 8.8 | 85,833 |
| ඌව | 4.6 | 92,615 |
| නැගෙනහිර | 4.7 | 75,364 |
| වයඹ | 9.3 | 103,792 |
| උතුරු මැද | 4.1 | 88,333 |
| උතුර | 2.9 | 64,185 |

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

**වි.ස. 6.1 රූප සටහන**

**ද.දේ.නි. සංයුතිය පළාත් අනුව - 2006**




මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

කෙසේ නමුත්, අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් වැනි සමාජයීය දර්ශක වලින් පිළිබිඹු වන ආකාරයට පළාත් අතර, සාපේක්ෂව අඩු පරතරයක් පැවතීම සැළකිල්ලට ලක් කළයුතු වැදගත් කරුණකි. කෙසේ වෙතත්, බස්නාහිර පළාතේ පවතින මට්ටමට සමාන්තරව ගමන් කිරීමට හෝ අඩු තරමින් එම මට්ටමට ළඟාවීමට හෝ මෙම අංශවල ද තවදුරටත් වැඩි දියුණුවක් ඇතිකර ගැනීමට අවශ්‍ය වේ.

### ප්‍රාදේශීය අසමානතා අවම කිරීම සඳහා දැනට පවතින ප්‍රයත්නයන්

බස්නාහිර පළාතෙන් පිටත ජීවත්වන ජනගහනය සියයට 70 ක් පමණ වන අතර ග්‍රාමීය පළාත් වලින්

[1/] ගොවි ජනපද පිහිටුවීම, ගල් ඔය, වලවේ හා මහවැලි ආදී වාරිමාර්ග ක්‍රම, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (IRDP), විමධ්‍යගත අයවැය, දිස්ත්‍රික් සංවර්ධන සභා සහ විශේෂයෙන්ම 1987 දී පළාත් සභා පිහිටුවීම යනාදිය මෙම ප්‍රයත්නයන්ට අයත් වේ. මීට අමතරව, ප්‍රාදේශීය සංවර්ධනය ඇති කිරීම සඳහා වූ විවිධ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට රජයේ අයවැය මගින් වාර්ෂිකව සැළකිය යුතු ප්‍රමාණයක ප්‍රතිපාදන වෙන් කෙරේ.

ජනිතවන භාණ්ඩ හා සේවා ඉල්ලුමෙහි සැළකිය යුතු මට්ටමේ වර්ධනයක් ඇති වී තිබේ. සම්පත් බෙදා හැරීමේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම හා එමගින් ශ්‍රී ලංකාවේ ගම් දනවි කරා ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ බෙදීයාම සහතික කිරීම සඳහා රජය විසින් සියළු පාර්ශ්වයන් සම්බන්ධ කරගත් සංවර්ධන "උපාය මාර්ගයක්" ආරම්භ කර ඇත. 2006-2016 දස අවුරුදු සංවර්ධන ප්‍රතිපත්ති රාමුව, (දස අවුරුදු දැක්ම) තුළ ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශයට පත්කර ඇත. හවිහරණක් අවශ්‍ය වන පිරිසට ආරක්ෂණ ජාලයක් පවත්වාගෙන යන අතරම යටිතල පහසුකම් සංවර්ධනය, මානව ප්‍රාග්ධන සංවර්ධනය හා ව්‍යාපාර දියුණු කිරීම යනාදිය එකවිට ක්‍රියාත්මක කිරීම හරහා රටේ සමස්ත සමාජ හා ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා රජයේ ඇති කැපවීම මෙම දස අවුරුදු දැක්ම තුළ ප්‍රකාශ කර ඇත. රාජ්‍ය පෞද්ගලික සහයෝගීතාවන් සඳහා යොමු වෙමින් හා පළාත්වල සම්පත් භාවිතය ප්‍රවර්ධනය කර ගනිමින් ආයෝජනයන් බස්නාහිර පළාතෙන් පිටතට යොමු කිරීමට මෙයින් අදහස් කෙරේ. මේ තුළින්, පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශය "ආර්ථික වර්ධනයේ හා සංවර්ධනයේ ඒකාබද්ධ යාන්ත්‍රණය" බවට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ජාතික මට්ටමේ පොදු සංවර්ධන වැඩසටහන්වලට අමතරව, රජය විසින් හඳුනාගත් විශේෂයෙන් ප්‍රාදේශීය සංවර්ධනය අරමුණු කරගත් ප්‍රධාන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. වයඹ උද්‍යානය, ගම නැගුම හා මග නැගුම වැඩසටහන්, තල් රුප්පාවෙන් ඔබ්බට, නැගෙනහිර නවෝදය සෙන්කඩගල උද්‍යානය, රජරට නවෝදය, අලුත්වන වයඹ, පුබුදමු වෙල්ලස්ස සහ කෘෂි නවෝදය යනාදිය මීට අයත් වේ. මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධනය අරමුණු කරගත් "රන්දොර" වැඩ සටහන යටතේ ද ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි සුභදායි ප්‍රතිඵල ඇති කෙරෙන යටිතල පහසුකම් දියුණු කිරීම අරමුණු කර ඇත.

මෙම වැඩසටහන් යටතේ නිවාස නැවත ඉදිකිරීම හා පුනරුත්ථාපනය, අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරීම හා රජයේ කාර්යාල පිහිටුවීම, ප්‍රාදේශීය මාර්ග හා මහාමාර්ග, සංනිවේදනය, වාරිමාර්ග හා ජල සම්පාදනය සහ විදුලිබලය ඇතුළත් ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය, ඇතුළත්ව ප්‍රමුඛත්වය ලැබිය යුතු අංශ ගණනාවක් කෙරෙහි අවධානය යොමු කිරීම මෙම වැඩසටහන් මඟින් අපේක්ෂා කෙරේ. ප්‍රාදේශීය මට්ටමින් ධීවර අංශයේ සංවර්ධනයට පහසුකම් සැලසීම, එලදායි මූල්‍ය පහසුකම් සැළසීම, සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම් සංවර්ධනය පුහුණු කිරීම් හා නිපුණතා සංවර්ධනය, නව කර්මාන්ත ස්ථාපිත කිරීම හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය ප්‍රවර්ධනය කිරීම, ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ඉඩම් හිමිකම් නොමැතිවීමේ ගැටළු විසඳීම, ග්‍රාමීය ප්‍රදේශවල නුපුහුණු ශ්‍රම බලකාය නැවත පුහුණු කිරීම, ජල ගැලීම් හා නියගය වැනි ස්වාභාවික ව්‍යසන හේතුවෙන් ඇතිවන බලපෑම් අවම කිරීම සහ ප්‍රජාව, රාජ්‍ය නිලධාරීන් හා පෞද්ගලික අංශය අතර සහයෝගීතාව දිරිමත් කිරීම වැනි ප්‍රමුඛ අංශයන් රාශියක් කෙරෙහි අවධානය යොමු කිරීමට මෙමගින් අපේක්ෂා කෙරේ.

රජය විසින් ප්‍රාදේශීය ආර්ථිකය වැඩි දියුණු කිරීම සඳහා ජාතික අයවැය මගින් දිරිගැන්වීම් හා පහසුකම් ගණනාවක් ද සපයා ඇත. බස්නාහිර පළාතෙන් පිට අනෙකුත් පළාත්වල ආයෝජනය කිරීමට දිරි ගැන්වීම් ලබාදීම, කර්මාන්ත තුන්සියයේ වැඩසටහන, ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව ස්ථාපිත කිරීම, විශේෂයෙන් කෘෂිකර්මය, කර්මාන්ත හා ධීවර යන අංශ සඳහා වූ විවිධ බදු දිරි ගැන්වීම් සහ සාම්ප්‍රදායික නොවන කෘෂි අපනයන දිරිමත් කිරීම යනාදිය මෙම දිරි ගැන්වීම් අතර වේ.

### පළාත් සභාවල කාර්යභාරය

ප්‍රාදේශීය සංවර්ධනය ඉලක්කකරගත් දැනට ක්‍රියාත්මක වන ක්‍රියා මාර්ගයන්ට පළාත් සභා ක්‍රමය මගින් ද ඵලදායී දායකත්වයක් ලබාදිය හැකිය. 1987 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වන සංශෝධනයත් සමඟ පළාත් සභා ක්‍රමය ආරම්භ වූ අතර දැනට දශක දෙකක පමණ කාලයක සිට මෙම ක්‍රමය ක්‍රියාත්මක වේ. මේවායේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සමීපව සලකා බලනවිට හෙළිවන කරුණක් වන්නේ මෙතරම් දිගු කාලයක් තිස්සේ පළාත් සභා ක්‍රියාත්මක වුවද එහි එක් අරමුණක් වන "තුලිත ප්‍රාදේශීය සංවර්ධනය" ළඟා කර ගැනීම ඉටුකරගෙන නොමැති බවයි. ඉහතින් සඳහන් කර ඇති පරිදි, සමාජමය දර්ශක මගින් සැළකිය යුතු මට්ටමේ පරතරයක් පිළිබිඹු නොවුවද, ප්‍රාදේශීය ආර්ථික අසමානතාවයන් තවමත් පවතින අතර, ඒවා වැඩිවෙමින්ද පවතී. ඇතැම්විට, පළාත් සභා විසින් යම් ප්‍රයත්නයන් දරා ඇති නමුත්, එමගින් මේ දක්වා පළාත්වල සැළකිය යුතු මට්ටමේ වෙනසක් ඇතිවී නොමැත. බස්නාහිර පළාත් සභාව තවදුරටත් රටේ ප්‍රධාන ආදායම් උත්පාදකයා ලෙස ද, ප්‍රධාන වියදම් දරන්නා ලෙසද ඉදිරියෙන් සිටී. එබැවින්, පළාත් සභා විසින් ප්‍රාදේශීය ආර්ථික අසමානතාවයන් අඩුකර ගැනීම සඳහා නව ප්‍රයත්නයන් මත කටයුතු කිරීම අවශ්‍ය වේ.[2/]

---

[2/] අනෙකුත් පළාත් සභාවලට සාපේක්ෂව එකිනෙක පළාත් සභා තමන් සාර්ථකත්වයට පත්වීම පිළිබඳව රටේ සමස්ත සංවර්ධන අරමුණු පිළිබඳව දැනුවත්වීම් වැඩි දියුණු කිරීමට හැකියාව ලැබෙන පරිදි සම්මන්ත්‍රණ මාලාවක් ඉතිහාසයේ ප්‍රථම වතාවට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආරම්භ කරන ලදී. තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇතිකර ගැනීම සඳහා ඔවුන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට සිදුකළ යුතු විවිධ ක්‍රියා මාර්ග මෙම සම්මන්ත්‍රණවලදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යෝජනා කරන ලදී.

පළාත්බද නිෂ්පාදනය වැඩි කිරීමට හා ප්‍රාදේශීය අසමානතාවයන් අඩුකරලීමට ඇති එක් මාර්ගයක් වන්නේ පළාත් මට්ටමින් රාජ්‍ය ආයෝජන ඉහළ නැංවීමයි. කෙසේ නමුත්, රජය සතුව පවත්නා රජයේ සම්පත් ප්‍රමාණය සීමාසහිත වන අතර, ඉහතින් දක්වා ඇති පරිදි ප්‍රාදේශීය අසමානතාවන් අඩු කර ගැනීම සඳහා මධ්‍යම රජය විසින් ව්‍යාපෘති ගණනාවක් දැනටමත් ක්‍රියාත්මකව පවතියි. මෙම තත්ත්වය යටතේ පළාත් සභාවල සියළුම සංවර්ධන වියදම් සඳහා ප්‍රමාණවත්වන අරමුදල් ප්‍රමාණයක් නිදහස් කිරීමේදී රජය දුෂ්කරතාවයන් රැසකට මුහුණ දෙයි.

මෙවැනි තත්ත්වයක් තුළ, සියලුම සම්බන්ධිත පාර්ශ්වයන් විශේෂයෙන්ම පළාත් සභාවන්, ප්‍රාදේශීය අසමානතා අවමකර ගැනීමේ අභියෝගයට ඵලදායි ලෙස දායකවීම සඳහා ඔවුන් විසින්ම නැවත සිතා බැලීමට, නැවත සංවිධානය වීමට හා නැවත ශක්තිමත් වීමට අවශ්‍ය වේ. මෙම ක්‍රියාවලියේදී, පළාත් සභා ඔවුන්ගේ හැකියාවන් හා ඉඩ ප්‍රස්ථා තක්සේරු කළයුතු වන අතර, නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා වන සාර්ව ආර්ථික පදනමක් මත ප්‍රධාන ඉලක්කයන් උදාහරණ ලෙස පළාත්බද ද.දේ.නි., පළාත්බද ඒක පුද්ගල ද.දේ.නි, ආංශික නිමැවුම් ඉලක්ක හා ආයෝජන සම්බන්ධ ඉලක්කයන් ඔවුන් විසින්ම සකස් කර ගැනීම අවශ්‍ය වේ. පළාත් සභා සඳහා සාර්ව ඉලක්ක සකස් කිරීමේදී බස්නාහිර පළාතේ ද.දේ.නි. වර්ධනය විය හැකි අනුපාත පදනම වශයෙන් සැළකිය හැකිය. බස්නාහිර පළාත් සභාවේ මට්ටමට අනෙකුත් පළාත් සභාවන් ළඟාවීමට නම් ඒවායේ වසර ගණනාවක් තුළ පළාත්බද ද.දේ.නි.යේ වර්ධනය බස්නාහිර පළාතට වඩා වැඩි අනුපාතයකින් ඉහළයාම ඉලක්කකර ගත යුතුය. මෙය තරමක් දුෂ්කර ඉලක්කයක් විය හැකි නමුත්, තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟාකරගත හැකි වන්නේ එවැනි උපාය මාර්ගයකින් පමණි. තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟාකරගත හැකි වන්නේ බස්නාහිර පළාත හැර අනෙකුත් පළාත් සඳහා වන පදනම සාපේක්ෂව අඩු මට්ටමක පවතින බැවින් පළාත් සභා විසින් මේ සඳහා මනාව යොමු වුවහොත් හා කැපවීමකින් යුතුව උත්සාහ කළහොත් ඉහළ ආර්ථික වර්ධනයක් ලබාගත හැකි වනු ඇත.

මෙම අරමුණ සඳහා ක්‍රමවේදයන් /උපකරණ ගණනාවක් යොදාගත හැකිය. රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයන් (PPPs) හරහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය ලබා ගැනීම දිරිමත් කිරීම එක් ප්‍රධාන අංශයකි. ඒ ඒ ප්‍රදේශවල ඉදි කිරීම, ක්‍රියාත්මක කිරීම හා අයිතිය දැරීම (BOO) හා ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම හා අයිතිය පැවරීම (BOT) යටතේ සිදුකළ හැකි ව්‍යාපෘති අදාළ අංශ අනුව හඳුනා ගැනීම මේ යටතේ සිදුකළ යුතුය. කීර්තිමත් සාර්ථක ව්‍යාපාරිකයින්ට පළාත් මට්ටමින් ආයෝජන කටයුතු සඳහා අවස්ථාව ලබාදීම මගින් ඔවුන්ගේ මැදිහත්වීම් ලබා ගැනීම ආරම්භ කළ යුතු වේ. මීට සමගාමීව, තමන්ගේම ආයෝජන ප්‍රවර්ධන අධිකාරියක් හා සංචාරක ප්‍රවර්ධන අධිකාරියක් වැනි ආයතන පළාත් සභා තුළ ස්ථාපිත කිරීමෙන්, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘතිවලට පිවිසීමෙන්, විදේශීය ආයෝජ-කයන්ගේ සහයෝගීතාව ලබාගැනීමෙන් හා ආයෝජනය සඳහා රජයේ ඉඩම් නිදහස් කර ගැනීමෙන් මීට අදාළව යම් බාධාවක් වේ නම් ඒවා, ඉවත් කරදීමට කටයුතුකරදීම ද අවශ්‍ය වේ.

පළාත් සභාවල ආර්ථික වර්ධනය හා සමාජමය සංවර්ධනය ජනිත කිරීම සඳහා සාධක ගණනාවක් දායක වේ. අවශ්‍යවන යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රධානතම අවශ්‍යතාවයකි. රජය මෙම යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලියෙහි නිරත වී සිටී. මෙම යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම හරහා අදාළ පළාත්වල පහසුකම් තවදුරටත් වැඩි දියුණු කිරීමට පළාත්සභා වලටද ඔවුන්ගේ ප්‍රයත්නයන් පුළුල් කළ හැකිය. කෘෂිකර්මය (සාම්ප්‍රදායික බෝග, සත්ත්ව පාලනය, ධීවර, වාණිජ භෝග, අපනයන භෝග ආදිය), කර්මාන්ත (සැකසුම් කර්මාන්ත, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර) සහ සේවා (මූල්‍ය සේවා, සංචාරක ආදී) යන අංශ තුන යටතේම වූ ව්‍යාපාර කටයුතු ද පළාත් සභා තුළ වැඩි දියුණු කළයුතු වේ. මීට අමතරව, වෘත්තීය පුහුණුව ප්‍රාථමික, ද්විතියික හා තෘතීයික මට්ටම්වල අධ්‍යාපනය, තාක්ෂණය හා පර්යේෂණ හා සංවර්ධන ආදිය ද ඇතුළු මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම, මෙම ක්‍රියාවලියට දායක වේ.

මෙම මාර්ගය ඔස්සේ ගමන් කිරීමේදී, පළාත් සභා ඒවායේ ඉදිරි ක්‍රියාකාරකම් කල් ඇතුව සැළසුම් කිරීම වැදගත් වේ. ප්‍රධාන ක්ෂේත්‍රයන්හි ව්‍යාපෘති හඳුනාගැනීම, විශේෂඥ ඥානය ලබා ගැනීම, සැමවිටම රජයේ, මුදල් අපේක්ෂාවෙන් නොසිට මෙම ව්‍යාපෘති මූල්‍යනය කිරීමට නව ක්‍රම සොයා ගැනීම මෙන්ම පෞද්ගලික අංශයේ සහභාගීත්වය ලබාගැනීම අවධානය යොමුකළ යුතු ප්‍රධාන අංශ වේ.

එසේම, පළාත්බද ද.දේ.නි. ය සහ අනිකුත් සමාජයීය සහ ආර්ථික දර්ශක සංවර්ධනය කිරීම සඳහා එක් එක් පළාත් විසින් තමන්ම උපාය මාර්ගික සැලැස්මක් සහ අනෙකුත් උපාය මාර්ග සකස් කිරීම කළ යුතුය. මෙවැනි ඉලක්කයන්හි වගකීම පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරු

විසින් දැරිය යුතුය. සෑම පළාතක් සඳහාම වන ඉදිරි සංවර්ධන සැලැස්ම සඳහා පාලක පක්ෂය හා විපක්ෂය යන දෙපිරිසේම කැපවීම ලබාගත යුතු වේ. අපේක්ෂිත ඉලක්ක හා සැලසුම්, පුරෝකථනය කරන ලද ප්‍රතිඵල සමඟ ප්‍රකාශයට පත් කළ යුතුය. තවද, පළාත් සභා වලින් ප්‍රාදේශීය සංවර්ධනයට වන දායකත්වය ඇගයීම සඳහා ප්‍රතිඵල මත පදනම්වන නිරීක්ෂණ සහ ඇගයීම් ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුය. ප්‍රතිපත්තිමය අංශයන් සඳහා ප්‍රතිඵල පදනම් කරගත් දර්ශකයන් හා දෙන ලද කාලපරිච්ඡේදයක් තුළ මැනිය හැකි වන අයුරු ඉලක්ක හඳුන්වාදීම සහ අපේක්ෂිත ප්‍රතිඵල හඳුනාගැනීම සඳහා කාර්ය සාධක ඉලක්ක යනාදිය මෙවැනි ක්‍රමයක් තුළින් ආවරණය කළ යුතු වේ. සැලසුම් ක්‍රියාත්මක කිරීම සමීපව සුපරීක්ෂණය කිරීම හා සමස්ත ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා අනිකුත් සහභාගිකරුවන්ගේ සහයෝගය ද ලබාගත යුතුය.

ආරම්භක අදියරේදී, ආර්ථික ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමටත්, රැකියා අවස්ථා උදා කිරීමටත්, අදාළ පළාත්වල ජනතාවගේ ආදායම් මට්ටම වැඩි දියුණු කිරීම තුළින් ප්‍රාදේශීය අසමානතාවයන් අඩු කිරීමට උපකාරි වන ප්‍රධාන ව්‍යාපෘති දෙකක් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව පදනමක් යටතේ හෝ බද්ද ව්‍යාපාර, පෞද්ගලික අංශයේ සහභාගීත්වය ලබා ගනිමින් ක්‍රියාත්මක කළ හැක. මෙවැනි විශේෂිත ව්‍යාපෘති සඳහා රජයේ සහභාගය වශයෙන් එක් පළාත් සභාවකට රුපියල් දශ ලක්ෂ 150 බැගින් වූ රුපියල් දශ ලක්ෂ 1,350 ක්, මුදල් කොමිසම විසින් 2008 අයවැය හරහා මේ වනවිටත් වෙන්කර දී ඇත. මෙම අරමුදල්, මෙම විශේෂිත ව්‍යාපෘති සඳහා අවශ්‍ය සමාජයීය හා ආර්ථික යටිතල පහසුකම් සැපයීම සඳහා භාවිතා කරනු ඇත. මේ සන්දර්භය තුළ, හොඳම ක්‍රියාකාරීත්වයක් දක්වන පළාත් සභාව හඳුනාගැනෙන අතර එළඹෙන වසර සඳහා සංවර්ධන කටයුතු වෙනුවෙන් අමතර ප්‍රතිපාදන ලබාදීම මගින් එම සේවය අගය කළහැකි වනු ඇත.